Scanned with CamScanner

# සාක්ෂි ආඥාපනත

1992

Scanned with CamScanner

# සාක්ෂි ආඥාපනත

1991

Scanned with CamScanner

| | |
|---|---|
| පළමුවන මුද්‍රණය | 1961 |
| දෙවන මුද්‍රණය | 1964 |
| තෙවන මුද්‍රණය | 1970 |
| සිව්වන මුද්‍රණය | 1973 |
| පස්වන මුද්‍රණය | 1977 |
| සයවන මුද්‍රණය | 1981 |
| සත්වන මුද්‍රණය | 1991 |

PP 004696 - 5,000 (93/11)

Scanned with CamScanner

# II වෙනි අධිකාරය

# සාක්ෂි

**සාක්ෂි නීතිය ඒකාබද්ධ කිරීම, විස්තර කිරීම සහ සංශෝධනය කිරීම සඳහා පනවන ලද ආඥාපනතකි**

**I වැනි කාණ්ඩය**

## කරුණුවල අනුකූලතාවය

## I වැනි පරිච්ඡේදය

### ප්‍රාරම්භය

1. මේ ආඥාපනත සාක්ෂි ආඥාපනත යනුවෙන් සඳහන් කළ හැකිය. — ලුහුඬු නාමය.

2. (1) යුද්ධාධිකරණය හැර අන් කිසි අධිකරණයක දී හෝ අධිකරණයක් ඉදිරිපිට දී කෙරෙන සියලු අධිකරණ කටයුතු සම්බන්ධයෙන් මේ ආඥාපනත අදාළ විය යුතුය. එහෙත් සමථකරුවකු ඉදිරිපිට දී කෙරෙන කටයුතු සම්බන්ධයෙන් මෙය අදාළ නොවිය යුතුය. — ප්‍රමාණය.

(2) යම් ලිඛිත නීතියක අඩංගු නොවන සියලු සාක්ෂි නීති මේ ආඥාපනතේ යම් විධිවිධානයකට නොගැලපෙන කල්හි මෙයින් අවලංගු කරනු ලැබේ. — අවලංගු කිරීම.

3. පද සංසන්දනයෙන් විරුඬ අදහසක් දැක්වෙන තැන්හි හැර අනෙක් තැන්හි මේ ආඥාපනතෙහි පහත දැක්වෙන වචන හා ප්‍රකාශ පහත සඳහන් අර්ථ සහිතව යොදනු ලැබේ. — අර්ථ නිරූපණය.

"අධිකරණය" යන්නට සියලු විනිශ්චයකාරවරු සහ සුළු අපරාධ විනිශ්චයකාරවරු ද, සමථකරුවන් හැර සාක්ෂි ගැනීමට නීති ප්‍රකාර බලය ලත් සියලු තැනැත්තෝ ද ඇතුළත් වෙති.

"කරුණ" යන්නෙන්, අදහස් වන්නේ හා ඊට ඇතුළත් වන්නේ—

(අ) ඉන්ද්‍රියන්ගෙන් දත හැකි යම් දෙයක්, දේවල තත්ත්වයක් හෝ දේවල සම්බන්ධයක් ; හා

(ආ) යම් තැනැත්තකුට දැනෙන යම් මානසික තත්ත්වයක් ය.

Scanned with CamScanner

### නිදර්ශන

(අ) එක්තරා ස්ථානයක එක්තරා පිළිවෙලකට එක්තරා ද්‍රව්‍ය තැන්පත් කර ඇතැයි යනු කරුණකි.

(ආ) මිනිසකුට යම්කිසිවක් ඇසුනුබව හෝ මිනිසකු යම්කිසිවක් දුටු බව කරුණකි.

(ඇ) මිනිසකු ඇතැම් වචන කී බව කරුණකි.

(ඈ) මිනිසකු යම් මතයක් දරන බවද, යම් අදහසක් ඔහු තුල ඇති බවද, සද්භාවයෙන් හෝ වංචක ලෙස ඔහු ක්‍රියා කරන බවද, නැතහොත් විශේෂ අර්ථයක යම් විශේෂ වචනයක් යොදන බවද, නැතහොත් නියමිත වේලාවක දී විශේෂ හැඟීමක් ඇතැයි දැන සිටින බව හෝ දැන සිටි බවද කරුණකි.

(ඉ) මිනිසකුට එක්තරා ප්‍රසිද්ධියක් ඇති බව කරුණකි.

**අනුකූලවීම.** කරුණුවල අනුකූලතාවය පිළිබඳව මේ ආඥාපනතේ විධිවිධානවල සඳහන් ක්‍රම අතරින් යම් ක්‍රමයකින් එක කරුණක් අනෙකට සම්බන්ධ වන විට එක කරුණක් තවත් කරුණකට අනුකූල යයි කියනු ලැබේ.

**ඉදිරිපත් කරුණු.** "ඉදිරිපත් කරුණු" යන්නෙන් අදහස් වන්නේ හා ඊට ඇතුළත් වන්නේ—

යම් කරුණක් නිසාම හෝ වෙනත් කරුණුවල සම්බන්ධය ඇතිව යම් නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී ස්ථිර කරන ලද හෝ ප්‍රතික්ෂෙප කරන ලද යම් අයිතිවාසි කමක, යටත් වීමක හෝ නොහැකි කමක, පැවැත් ම, නොපැවැත් ම, ස්වභාවය හෝ ප්‍රමාණය අවශ්‍යයෙන් ම, දැක්වෙන යම් කරුණකි.

පැහැදිලි කිරීම.—සිවිල් නඩු විධානය සම්බන්ධයෙන් තත් කාලයෙහි වලංගුව පවත්නා නීතියේ විධිවිධාන යටතේ යම් අධිකරණයක්, ඉදිරිපත් කරුණක් සටහන් කරන විටෙක, ඒ ඉදිරිපත් කරුණට පිළිතුරු වශයෙන් ස්ථිර කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඇති කරුණ ඉදිරිපත් කරුණකි.

#### නිදර්ශන

"බී" මරණයට පත් කිරීම ගැන "ඒ" ට විරුද්ධ චෝදනා ඉදිරිපත් කර ඇත. ඔහුට විරුද්ධ නඩු විසඳීමේදී පහත සඳහන් කරුණු ඉදිරිපත් කරුණු විය හැකිය :—

"බී" ගේ මරණය "ඒ" සිදු කළ බව.

"බී" ගේ මරණය සිදු කිරීමට "ඒ" අදහස් කළ බව.

"බී" වෙතින් "ඒ" බරපතලවූද, හදිසිවූද ප්‍රකෝපයට පත්වූ බව.

"බී" ගේ මරණය ඇති කළ ක්‍රියාවෙහි යෙදෙද්දී තම සිහි විකලත්වය කරණකොටගෙන එම ක්‍රියාවේ ස්වභාවය වටහා ගැනීමට "ඒ" ට නොහැකිවූ බව.

**ලේඛනය.** ලේඛනය වෙනුවෙන් අදහස් වන්නේ යම් දෙයක් සටහන් කිරීම සඳහා පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන හෝ පාවිච්චි විය හැකි අකුරුවලින් හෝ ඉලක්කම්වලින් හෝ සලකුණුවලින් හෝ එකී ක්‍රම එකකට වැඩි ගණනකින් යම් ද්‍රව්‍යයක් මත ප්‍රකාශ කරන ලද හෝ විස්තර කරන ලද යම් දෙයකි.

Scanned with CamScanner

**නිදර්ශන**

1. ලියවිල්ලක්, ලේඛනයක් වේ.
2. මුද්‍රණය කරන ලද, "ලිතෝග්‍රාෆ්" කරන ලද, හෝ ඡායාරූප ගන්නා ලද වචන ලේඛන වේ.
3. සිතියමක් හෝ සැලැස්මක් ලේඛනයක් වේ.
4. ලෝහ තහඩුවක හෝ ගලක කොටන ලද සටහනක් ලේඛනයක් වේ.
5. විකට චිත්‍රයක් ලේඛනයක් වේ.

"සාක්ෂි" යන්නෙන් අදහස් වන්නේ හා ඊට ඇතුළත් වන්නේ— සාක්ෂි.

(අ) විභාගයට භාජන ව පවත්නා කරුණුවලට සම්බන්ධව සාක්ෂිකරුවන් විසින් අධිකරණයේදී ප්‍රකාශ කරන ලෙස අධිකරණය මගින් වුවමනා කරන හෝ අවසර දෙනු ලබන සියලු ප්‍රකාශ; මෙබඳු ප්‍රකාශ කථිත සාක්ෂි යි කියනු ලැබේ.

(ආ) අධිකරණයේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන සියලු ලේඛන; මෙබඳු ලේඛන ලේඛනගත සාක්ෂි යි කියනු ලැබේ.

සත්‍ය බැව් ඔප්පු වූ බව.

අධිකරණය ඉදිරියේ ඇති දේ සලකා බැලීමෙන් පසු, කරුණක් පවතින බැව් අධිකරණය විශ්වාස කරන්නේ නම්, හෝ එම විශේෂ අවස්ථාවේ යෙදී ඇති තත්ත්වයේ හැටියට එය පවතින බැව් පිළිගනිමින් නුවණැති තැනැත්තකුට ක්‍රියා කළ හැකි වන තරමට එහි පැවතීම විය හැකියයි අධිකරණය සලකන්නේ නම්, එම කරුණ සත්‍ය බැව් ඔප්පු වූ බව කියනු ලැබේ.

අසත්‍ය බැව් ඔප්පු වූ බව.

අධිකරණය ඉදිරියේ ඇති දේ සලකා බැලීමෙන් පසු, කරුණක් නො පවතින බැව් අධිකරණය විශ්වාස කරන්නේ නම්, හෝ එම විශේෂ අවස්ථාවේ යෙදී ඇති තත්ත්වයේ හැටියට එය නො පවතින බැව් පිළිගනිමින් නුවණැති තැනැත්තකුට ක්‍රියා කළ හැකි වන තරමට එහි නො පැවතීම විය හැකි යයි අධිකරණය සලකන්නේ නම්, එම කරුණ අසත්‍ය බැව් ඔප්පු වූ බව කියනු ලැබේ.

ඔප්පු නොවූ බව.

යම් කරුණක් සත්‍ය බැව් ඔප්පු නො වූ කල හෝ අසත්‍ය බැව් ඔප්පු නො වූ කල, එය ඔප්පු නො වූ බව කියනු ලැබේ.

පූර්ව නිගමනය කළ හැකි බව.

4. (1) යම් කරුණක් අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකි යයි මේ ආඥාපනතින් සලස්වා ඇති හැම විට ම එය අසත්‍ය බැව් ඔප්පු කරතොත් මිස හෝ ඔප්පු කරන තෙක්, සත්‍ය බැව් ඔප්පු වී තිබේ යයි අධිකරණය විසින් සැලකිය හැකිය. නැතහොත් ඒ කරුණ ඔප්පු කරන ලෙස ඉල්ලිය හැකිය.

පූර්ව නිගමනය කළ යුතු බව

(2) යම් කරුණක් අධිකරණය විසින් පූර්ව නිගමනය කළ යුතු යයි මේ ආඥාපනතින් නියම කරනු ලබන හැම විටම, එය අසත්‍ය බැව් ඔප්පු කරතොත් මිස හෝ ඔප්පු කරන තෙක්, සත්‍ය බැව් ඔප්පු වූ ලෙස අධිකරණය සැලකිය යුතුය.

Scanned with CamScanner

**තීරණාත්මක සාධක.**

(3) එක කරුණක් තවත් කරුණක තීරණාත්මක සාධකයක් ලෙස මේ ආඥාපනතින් ප්‍රකාශ කර ඇති විට, එක කරුණක් සත්‍ය බැව් ඔප්පු වූ පසු අනෙක ද සත්‍ය බැව් ඔප්පු වූ ලෙස අධිකරණය සැලකිය යුතුය; එය අසත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්යය සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමට ඉඩ නොදිය යුතුය.

## II වැනි පරිච්ඡේදය

### කරුණුවල අනුකූලතාවය

**ඉදිරිපත් කරුණු පිළිබඳව හා අනුකූල කරුණු පිළිබඳ ව සාක්ෂි දිය හැකිය.**

5. යම් නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී සෑම ඉදිරිපත් කරුණක හා මෙතැන් පටන් අනුකූල යයි මෙහි ප්‍රකාශයට පමුණුවනු ලබන වෙනත් කරුණුවල පැවැත්ම හෝ නොපැවැත්ම ගැන සාක්ෂි දිය හැකි ය. අන් කිසි කරුණක් ගැන සාක්ෂි දිය නො හැකිය.

පැහැදිලි කිරීම.—සිවිල් නඩු විධානය සම්බන්ධයෙන් තත් කාලයෙහි වලංගුව පවත්නා නීතියේ යම් විධිවිධානයක්, මගින් සත්‍ය බව ඔප්පු කිරීමට තමා හිමිකම් ලබා නැති කරුණක් ගැන සාක්ෂි දීමට යම් තැනැත්තකුට මේ වගන්තියෙන් ඉඩ නො ලැබිය යුතුය.

නිදර්ශන

(අ) "බී" ගේ මරණය සිදු කිරීමේ අදහස ඇතිව පොල්ලකින් ගසා "බී" මැරීම ගැන "ඒ" ට විරුද්ධව නඩු විසඳනු ලබයි.

"ඒ" ට විරුද්ධ නඩු විසඳීමේදී පහත සඳහන් කරුණු ඉදිරිපත් කරුණු වේ:—

"ඒ" විසින් "බී" ට පොල්ලකින් ගැසීම.

එසේ ගැසීමෙන් "ඒ" විසින් "බී" ගේ මරණය සිදු කිරීම.

"බී" ගේ මරණය සිදු කිරීමට "ඒ" තුළ ඇති අදහස.

(ආ) නඩුවක පාර්ශ්වකරුවකු වන "ඒ" තමාගේ උත්තරවාදවල සඳහන් ලේඛනයක් නඩුවේ අනෙක් පාර්ශ්වකරුවන් "බී" ගේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලෙස "බී" නිකුත් කළ දැන්වීම අනුව ක්‍රියා නොකරයි. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 104 වෙනි වගන්තියෙන් නියමිත කොන්දේසිවලට අනුව මිස, ඊට වෙනස්ව එබඳු නඩුවක දී තමා වෙනුවෙන් සාක්ෂි වශයෙන් එබඳු ලේඛනයක් ඉදිරිපත් කිරීමට මේ වගන්තියෙන් "ඒ" ට ඉඩ නොලැබේ.

**එකම කටයුත්තක කොටස් වශයෙන් පවතින කරුණුවල අනුකූලතාවය.**

6. එක ම වේලාවක දී සහ ස්ථානයක දී හෝ එකිනෙකට වෙනස් වේලාවල දී සහ ස්ථානවල දී සිදු වුව ද, එකම කටයුත්තක කොටසක් වශයෙන් සකස් වන පරිද්දෙන් ඉදිරිපත් කරුණක් හා සම්බන්ධව පවත්නා කරුණු ඉදිරිපත් කරුණු නොවුව ද අනුකූල වේ.

නිදර්ශන

(අ) "බී" ට පහර දීමෙන් ඔහුගේ මරණය සිදු කිරීම ගැන "ඒ" චෝදනා ලබා ඇත. පහර දීම සිදුවූ අවස්ථාවේදී හෝ ඒ කටයුත්තේ කොටසක් වශයෙන් සකස් වන පරිද්දෙන් පහර දීමට පෙරාතුවම හෝ පසුවම, "ඒ" විසින් හෝ "බී" විසින් හෝ අසල සිටි අය විසින් කියන ලද හෝ කරන ලද මොනයම් දෙයක් වුවද, අනුකූල කරුණක් වෙයි.

Scanned with CamScanner

(ආ) දේපල විනාශවීම්, හට හමුදාවලට පහරදීම් සහ සිර ගෙවල් කැඩීම්ද ඇතිව ආයුධ සන්නද්ධ කැරලිලක කොටස්කරුවකු වී රජුට විරුද්ධව සටනත් කිරීම ගැන "ඒ" චෝදනා ලැබ සිටී. මේ කරුණු සියල්ලම සිදුවූ අවස්ථාවන්හිදී "ඒ" නොසිටියද ප්‍රධාන කටයුත්තේ කොටසක් වශයෙන් සකස් වී ඇති හෙයින්, මෙකී කරුණු සිදුවීම අනුකූලය.

(ඇ) ලිපි හුවමාරුවකට ඇතුලත් වූ ලියමනකින් තමාට ලිඛිත අපහාසයට කරන ලදැයි "බී" ට විරුද්ධව "ඒ" නඩු පවරයි. ලිඛිත අපහාසයට මුල්වූ කාරණය සම්බන්ධයෙන් දෙපක්ෂය අතර හුවමාරුවූද, ලිඛිත අපහාසය ඇතුලත් ලිපි හුවමාරුවේ කොටසක්වූද, ලියුම් ලිඛිත අපහාසය අඩංගු නොවූවද අනුකූල කරුණුය.

(ඈ) ප්‍රශ්නය නම් "බී" ගෙන් ඉල්ලා යවන ලද ඇතැම් බඩු "ඒ" ට භාර දෙන ලදද යනුයි. ආන්තරිකයන් කීප දෙනකුට මේ බඩු අනුපිළිවෙලින් භාර දෙන ලදී. එක් එක් භාර දීමක් අනුකූල කරුණකි.

7. අනුකූල කරුණුවල හෝ ඉදිරිපත් කරුණුවල සමීප හෝ නො එසේ වූ අවස්ථාව, හේතුව හෝ ප්‍රතිඵලය වූ කරුණු හෝ එකී කරුණු සිදු වූ විට පැවති තත්ත්වය සමන්විත වූ කරුණු හෝ ඒවා සිදුවීමට හෝ ඉටුවීමට අවස්ථාවක් සැලැස් වූ කරුණු අනුකූල කරුණු ය.

ඉදිරිපත් කරුණුවල අවස්ථාව, හේතුව, හෝ ප්‍රතිඵලය වන කරුණු.

නිදර්ශන

(අ) ප්‍රශ්නය නම්, "බී" ගේ වස්තුව "ඒ" කොල්ල කෑවේ ද යනු යි. කොල්ලකෑම සිදුවීමට ස්වල්ප වේලාවකට පෙර මුදල් අතේ ඇති ව "බී" වෙළඳ පොළකට ගිය බවත්, තුන් වැන්නවුනට ඒ මුදල් පෙන්වූ බව හෝ තමා ළඟ ඒ මුදල් තුබූ බැව් පැවසූ බවත් අනුකූල කරුණු ය.

(ආ) ප්‍රශ්නය නම් "බී" ගේ මරණය "ඒ" සිදු කළේ ද යනු යි. මරණය සිදු කරන ලද ස්ථානයෙහි හෝ ඊට ආසන්නව ඇගලීමකින් බිම ඇති වූ සලකුණු අනුකූල කරුණු ය.

(ඇ) ප්‍රශ්නය නම් "ඒ" විසින් "බී" ට වස දෙන ලදද යනු යි. වස නිසා ඇති වී යයි සැලකෙන රෝග ලක්ෂණ පහළ වීමට පෙර පැවති "බී" ගේ සෞඛ්‍ය තත්ත්වය ද, වස දීමට අවස්ථාවක් ගෙන දුන්, "ඒ" දැන සිටි "බී" ගේ ගති පැවතුම් ද අනුකූල කරුණු ය.

8. (1) යම් ඉදිරිපත් කරුණකට හෝ යම් අනුකූල කරුණකට පෙළඹීමේ හේතුවක් හෝ සූදානමක් දක්වන්නා වූ හෝ සමන්විත වන්නා වූ යම් කරුණක් අනුකූල කරුණකි.

පෙළඹීමේ හේතුව හෝ සූදනම.

(2) යම් නඩුවක දී හෝ අධිකරණ කටයුත්තක දී එබඳු නඩුවක් හෝ අධිකරණ කටයුත්තක් සම්බන්ධයෙන්, නැතහොත් එහි යම් ඉදිරිපත් කරුණක් හෝ ඊට අනුකූල යම් කරුණක් සම්බන්ධයෙන් යම් පාර්ශ්වකරුවකුගේ හෝ පාර්ශ්වකරුගේ නියෝජිතයකුගේ හැසිරීම ද, යම් අධිකරණ කටයුත්තක දී විභාග කෙරෙන කාරණය යමකුට කරන ලද අපරාධයක් නම්, එම තැනැත්තාගේ හැසිරීම ද, යම් ඉදිරිපත් කරුණක් හෝ අනුකූල කරුණක් කෙරෙහි එවැනි හැසිරීම බලපායි නම් හෝ එවැනි හැසිරීම කෙරෙහි යම් ඉදිරිපත් කරුණක් හෝ අනුකූල කරුණක් බලපෑයි නම්, එ වැනි හැසිරීම ඉදිරිපත් කරුණට හෝ අනුකූල කරුණට පෙර හෝ පසු ඇති වුව ද අනුකූල කරුණු ය.

පෙර හෝ පසු හැසිරීම.

පැහැදිලි කිරීම 1.—මේ වගන්තියෙහි "හැසිරීම" යන වචනයට ප්‍රකාශයන් නො වන ක්‍රියාවන් සමග යෙදී ඒවා පැහැදිලි කර දෙන ප්‍රකාශයන් මිස එසේ නො වන ප්‍රකාශ ඇතුලත් නො වේ. එහෙත් මේ ආඥාපනතේ අන් කිසි වගන්තියක් යටතේ ඇති ප්‍රකාශයන්හි අනුකූලභාව කෙරෙහි මේ පැහැදිලි කිරීම බලපෑ යුතු නොවේ.

Scanned with CamScanner

**පැහැදිලි කිරීම 2.—යම් තැනැත්තකුගේ හැසිරීම අනුකූල වන විට, එ බඳු හැසිරීම කෙරෙහි බලපාන්නා වූ, ඔහුට හෝ ඔහු ඉදිරිපිට දී හා ඔහුට ඇසෙන සේ කරන ලද, යම් ප්‍රකාශනයක් අනුකූල කරුණකි.**

**නිදර්ශක**

(අ) "බී" මරන ලද සි "ඒ" ට විරුද්ධ ව නඩු විසඳනු ලබයි.

"සී" ගේ මරණය "ඒ" සිදු කළේ ය, යනු ද, "සී" ගේ මරණය "ඒ" සිදු කළේ යයි "බී" දැන සිටි බව ද, මේ කාරණය තමා දන්නා බැව් ප්‍රසිද්ධ කරන බවට තර්ජනය කිරීමෙන් "ඒ" ගෙන් මුදල් බලෙන් ලබා ගැනීමට "බී" තැත් කළ බව ද අනුකූල කරුණු ය.

(ආ) මුදලක් ගෙවීම සඳහා වූ නීත්‍යනුකූල ලේඛනයක් පිට "බී" ට විරුද්ධ ව "ඒ" නඩු පවරයි. එම ලේඛනය තමා විසින් කරන ලද්දක් නො වේ යයි "බී" කියයි.

මේ නීත්‍යනුකූල ලේඛනය කරන ලදැයි කියන කාලයේ එක්තරා කටයුත්තක් සඳහා "බී" ට මුදල් වුවමනා වූ බව අනුකූල කරුණකි.

(ඇ) වස දීමෙන් "බී" මරන ලද යි "ඒ" ට විරුද්ධ ව නඩු විසඳනු ලබයි. "බී" ට දෙන ලද වස වලට සමාන වස "බී" ගේ මරණය සිදුවීමට කලින් "ඒ" විසින් ලබා ගන්නා ලදැ යි යනු අනුකූල කරුණකි.

(ඈ) ප්‍රශ්නය නම්, එක්තරා ලේඛනයක් "ඒ" ගේ අන්තිම කැමති පත්‍රය ද යනු යි.

පිළියෙළ කරන ලදැ යි කියන අන්තිම කැමති පත්‍රයේ දිනයට නොබෝ කලකට පෙර එම අන්තිම කැමති පත්‍රයේ විධිවිධානවලට අදාළ වන කරුණු සම්බන්ධයෙන් විභාගයක් "ඒ" විසින් කරන ලදැ යි යන්න ද අන්තිම කැමති පත්‍රය සකස් කිරීම පිළිබඳ ව ඔහු නීතිඥවරුන්ගේ අදහස් විමසූ බව ද, වෙනත් කැමති පත්‍රවල කෙටුම්පත් පිළියෙළ කිරීමට කටයුතු සැලැස් වූ බව ද, එකී කෙටුම් පත් ඔහු අනුමත නො කළ බව ද අනුකූල කරුණු ය.

(ඉ) අපරාධයක් කරන ලදැ යි "ඒ" චෝදනා ලැබ සිට, කරන ලදැ යි කියන අපරාධය සිදු වූ වේලාවේ හෝ ඊට පෙර හෝ ඊට පසු ව තමාට වාසි වන අන්දමේ ස්වභාවයක් නඩුවේ කරුණුවලට ලබා දිය හැකි සාක්ෂි "ඒ" සැපයුයේ ය යි ද, නැතහොත් ඔහු සාක්ෂි විනාශ කළේ ය යි හෝ සැඟවූයේ ය යි ද, නැතහොත් සාක්ෂිකරුවන් විය හැකි වූ තැනැත්තන් ගේ පැමිණීම වැළැක්වූයේ ය යි හෝ ඔවුන්ගේ නොපැමිණීමට කටයුතු සැලැස් වූයේ ය යි ද නැතහොත් අපරාධය සම්බන්ධයෙන් බොරු සාක්ෂි දීමට අයවලුන් පෙලඹුයේ ය යි ද යනු අනුකූල කරුණු ය.

(ඊ) ප්‍රශ්නය නම්, "බී" ගේ වස්තුව "ඒ" කොල්ලකෑවේ ද යනුයි. "බී" ගේ වස්තුව කොල්ල කෑ තැනැත්තා සොයා ගැනීමට පොලීසිය පැමිණේ යි "බී" ගේ කොල්ලකෑමෙන් පසු "ඒ" ඉදිරිපිට දී "සී" කී බවත් ඊට ඉක්බිතිවම "ඒ" පලාගිය බවත් අනුකූල කරුණු ය.

(උ) ප්‍රශ්නය නම්, "ඒ" "බී" ට රුපියල් 10,000 ක් ණය ද යනු යි. තමාට මුදල් ණයට දෙන ලෙස "සී" ගෙන් "ඒ" ඉල්ලූ බවත්, "ඒ" ගෙන් "බී" ට රුපියල් 10,000 ක් ලැබිය යුතු හෙයින් ඔහු කෙරෙහි විශ්වාසයක් නොතබන ලෙස මම ඔබට අවවාද කරමි" යි "ඒ" ඉදිරිපිට දී යන ඔහුට ඇසෙන සේ "සී" ට "බී" කී බවත් කිසි පිළිතුරක් නො දී "ඒ" ඉවත් ව ගිය බවත් අනුකූල කරුණු ය.

(ඌ) ප්‍රශ්නය නම්, "ඒ" අපරාධයක් කළේ ද යනු යි. අපරාධ කරු සම්බන්ධ යෙන් විභාගයක් කරනු ලබන බැව් දන්වා ලියමනක් තමා වෙත ලැබුණු පසු "ඒ" සැඟවී ගියේ ය යන කරුණ ද, ලියමනේ අඩංගු දේ ද අනුකූල කරුණු ය.

Scanned with CamScanner

(එ) අපරාධයක් කරන ලද සි "ඒ" චෝදනා ලැබ සිටී. සිදු වී ය යි කියන අපරාධයෙන් පසු ඔහු සැඟවී සිටි බව ද, නැතහොත් අපරාධය කිරීමෙන් අත් කර ගන්නා ලද දේපළ හෝ දේපළවලින් ලැබුණු ආදායම තම ස්වාමීත්වයේ තබා සිටි බව ද, අපරාධය කිරීමට උපයෝගි කර ගනු ලැබූ හෝ උපයෝගි කර ගනු ලැබිය යි සිතිය හැකි දේ සැඟවීමට තැත් කරන ලද බව ද අනුකූල කරුණු ය.

(ඒ) ප්‍රශ්නය නම්, "ඒ" දූෂණය කරනු ලැබුවා ද යනු යි. කරන ලදැයි කියන ස්ත්‍රී දූෂණයෙන් මඳ වේලාවකට පසු අපරාධය සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඇය කළ බව ද, පැමිණිල්ල කරද්දී යෙදී තිබූ තත්ත්වය ද පැමිණිල්ල කිරීමේදී යොදන ලද පද මාලාව ද අනුකූල කරුණු ය

පැමිණිල්ලක් නොකර තමා දූෂණය කරනු ලැබුවා ය යි ඇය කී බැව් 32 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තිය යටතේ මරණාසන්න ප්‍රකාශයක් වශයෙන් හෝ 157 වෙනි වගන්තිය යටතේ තහවුරු කරන සාක්ෂි වශයෙන් අනුකූල විය හැකි වුවද, මේ වගන්තිය යටතේ හැසිරීම වශයෙන් අනුකූල කරුණක් නො වේ.

(ඔ) ප්‍රශ්නය නම්, "ඒ" ගේ වස්තුව කොල්ලකන ලද ද යනු යි. කරන ලදැ යි කියන පැහැර ගැනීමෙන් මඳ වේලාවකට පසු අපරාධය සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඔහු කළ බව ද, පැමිණිල්ල කරද්දී යෙදී තිබූ තත්වය ද පැමිණිල්ල කිරීමේ දී යොදන ලද පද මාලාව ද අනුකූල කරුණු ය.

තම වස්තුව කොල්ල කන ලදැ යි කිසි පැමිණිල්ලක් නො කර, ඔහු කී බැව් 32 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මරණාසන්න ප්‍රකාශයක් වශයෙන් හෝ 157 වෙනි වගන්තිය යටතේ තහවුරු කරන සාක්ෂි වශයෙන් අනුකූල විය හැකි වුව ද, මේ වගන්තිය යටතේ හැසිරීම වශයෙන් අනුකූල කරුණක් නොවේ.

9. ඉදිරිපත් හෝ අනුකූල කරුණක් පැහැදිලි කිරීමට හෝ හඳුන්වාදීමට අවශ්‍ය කරුණු ද, නැතහොත් ඉදිරිපත් කරුණකින් හෝ අනුකූල කරුණකින් යෝජිත නිගමනයක් තහවුරු කරන හෝ නිෂ්ප්‍රභා කරන කරුණු ද, නැතහොත් අනන්‍යතාව අනුකූල වන යම් දෙයක් හෝ පුද්ගලයකුගේ අනන්‍යතාව ඔප්පු කරන කරුණු ද, නැතහොත් යම් ඉදිරිපත් කරුණක් හෝ අනුකූල කරුණක් සිදු වූ වේලාව හෝ ස්ථානය නිශ්චය කරන කරුණු ද, නැතහොත් එබඳු යම් කරුණක් ක්‍රියාවේ යොදන ලද පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතා දක්වන කරුණු ද එම කාර්යය සඳහා අවශ්‍ය ප්‍රමාණයකින් අනුකූල ය.

අනුකූල කරුණු පැහැදිලි කිරීමට හෝ හඳුන්වාදීමට අවශ්‍ය කරුණු.

නිදසුන

(අ) ප්‍රශ්නය නම් දෙනු ලැබූ ලේඛනයක් "ඒ" ගේ අන්තිම කැමති පත්‍රය ද යනු යි.

අන්තිම කැමති පත්‍රය යි කියනු ලබන ලේඛනයේ දිනයෙහි "ඒ" ගේ දේපළවල හා ඔහුගේ පවුලේ තත්වය අනුකූල කරුණු විය හැකිය.

(ආ) නින්දා සහගත ව් හැඳුරුනේ යයි "ඒ" ට දොස් පවරමින් ලිඛිත අපහාසයක් කිරීම ගැන "බී" ට විරුද්ධ ව "ඒ" නඩු පවරයි. අපහාසාත්මක යි කියනු ලබන කරුණ සත්‍ය බැව් "බී" ස්ථිර කරයි.

අපහාසය ප්‍රකාශයට පමුණුවනු ලැබූ කල පාර්ශ්වකරුවන්ගේ තත්වය සම්බන්ධතා ඉදිරිපත් කරුණු හඳුන්වා දෙන කරුණු වශයෙන් අනුකූල විය හැකි ය. "ඒ" හා "බී" අතර සම්බන්ධතාවය කෙරෙහි බලපෑමක් ඇති වූයේ නම් ආරවුලක් සිදුවිය යනු අනුකූල කරුණක් විය හැකි වුව ද, කරන ලදැ යි කියන අපහාසයට සම්බන්ධ නො වූ කරුණක් ගැන "ඒ" හා "බී" අතර ආරවුලක විස්තර අනුකූල නොවේ.

(ඇ) අපරාධයක් කරන ලදැයි "ඒ" චෝදනා ලැබ සිටී. අපරාධය සිදු කළ වහාම "ඒ" තම නිවෙසින් පලා ගොස් සිටි බැව් ඉදිරිපත් කරුණුවලට පසුව සිදු වන්නා වූ ද, එකී කරුණුවල බලපෑමට යටත් වන්නා වූ ද හැසිරීම වශයෙන් 8 වෙනි වගන්තිය යටතේ අනුකූල වේ.

ඔහු තම නිවෙසින් නික්ම යද්දී, ඔහු ලඟා වූ ස්ථානයෙහි ඔහු විසින් වගා කළ යුතු හදිසි කටයුතු තිබුණ බැව්, නිවෙසින් හදිසියෙන් නික්ම යාම පැහැදිලි කර දීමට තුඩු දෙන කරුණක් වශයෙන් අනුකූල වේ.

යම් කටයුතු සඳහා ඔහු නිවෙසින් නික්ම ගියේ ද එම කටයුතු විගා කළ යුතු වූ හදිසි කටයුතු බැව් දැක්වීමට අවශ්‍ය වන පමණට හැර, එම කටයුතු පිළිබඳ විස්තර අනුකූල නො වේ.

(ඈ) "සී" විසින් "ඒ" හා සමග ඇති කර ගන්නා ලද සේවා ගිවිසුමක් කඩ කරන ලෙස "සී" පෙළඹවීම ගැන "බී" ට විරුද්ධව "ඒ" නඩු පවරයි. "ඒ" ගේ සේවයෙන් අස්වන විට "සී" "ඒ" ට මෙසේ කියයි. "ඔබ ගෙන් ලැබුණාට වඩා හොඳ දීමනාවක් මට දෙන බවට "බී" පොරොන්දු වී ඇති හෙයින් මම ඔබගෙන් අස් වෙමි." ඉදිරිපත් කරුණක් වශයෙන් අනුකූල වන "සී" ගේ හැසිරීම පැහැදිලි කර දෙන කරුණක් ලෙස මේ ප්‍රකාශය අනුකූල වේ

(ඉ) සොරකමක් කරන ලදැයි චෝදනා ලැබ සිටින "ඒ" තමා සොරකම් කළ වස්තුව "බී" ට දීමද, "බී" එය "ඒ" ගේ භාර්යාවට දීම ද දක්නා ලැබේ. එම වස්තුව "ඒ" ගේ භාර්යාවට භාර දෙමින් "බී" මෙසේ පවසයි. "ඔබ මෙය සැඟවිය යුතු බැව් "ඒ" කියා සිටී." මේ කටයුත්තේ කොටසක් වන කරුණක් පැහැදිලි කර දෙන හෙයින් "බී" ගේ ප්‍රකාශය අනුකූල වේ.

(ඊ) කැරලි කෝලාහලයක් කරන ලද යි "ඒ" ට විරුද්ධව නඩු විභාග කරනු ලැබේ "ඒ" පිරිසක ප්‍රමුඛස්ථානය ගෙන ඉදිරිපිට ගමන් කළ බැව් සත්‍ය බව ඔප්පු වේ. පිරිසේ කෑ ගැසීම මේ කටයුත්තේ ස්වභාවය පැහැදිලි කර දෙන හෙයින් අනුකූල වේ.

පොදු අදහසක් සම්බන්ධව කුමන්ත්‍රණ කරුවකු විසින් ලියන ලද හෝ කරන ලද දේවල්.

10. වරදක් හෝ නඩු පැවරිය හැකි අයුත්තක් කරනු සඳහා පුද්ගලයන් දෙදෙනකු හෝ වැඩි ගණනක් එකතු වී කුමන්ත්‍රණ කර ඇතැ යි විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති කල, ඔවුන් අතරින් යමෙකු විසින් එබඳු අදහසක් පළමුකොට ඇති කර ගනු ලැබීමෙන් පසුව, ඒ පුද්ගලයන්ගෙන් කෙනෙකු විසින් ඔවුන්ගේ පොදු අදහසට සම්බන්ධ ව කියන ලද හෝ කරන ලද හෝ ලියන ලද යම් දෙයක් එසේ කුමන්ත්‍රණ කරතැ යි විශ්වාස කරනු ලබන එක් එක් නැනැත්තකුට විරුද්ධ ව මෙන් ම කුමන්ත්‍රණය පැවතුණු බව සත්‍යයක් ය යි ඔප්පු කිරීමේ කාර්යය සඳහා ද, එ බඳු යම් නැනැත්තකු ඊට සහභාගි වූ බව දැක්වීමේ කාර්යය සඳහා ද අනුකූල කරුණක් වේ.

නිදර්ශනය

රජුට විරුද්ධ ම යුද්ධ කිරීම සඳහා කුමන්ත්‍රණයකට "ඒ" සම්බන්ධ වූයේ යයි විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබේ.

කුමන්ත්‍රණයේ කාර්යය සඳහා යුරෝපයෙහි දී "බී" යුද්ධායුධ සපයා ගත් බව ද, ඊට සමාන අරමුණක් සඳහා කොළඹ දී "සී" මුදලක් එකතු කළ බව ද, මහනුවර දී කුමන්ත්‍රණයට සම්බන්ධ වන ලෙස "ඩී" නැනැත්තන් පෙළඹවූ බව ද, බලාපොරොත්තු අරමුණට පක්ෂ ව සකස් කරන ලද ලේඛන ගාල්ලේ දී "ඊ" ප්‍රසිද්ධ කළ බව ද, කොළඹ දී "සී" එකතු කළ මුදල් මිගමුවේ

Scanned with CamScanner

සිට "ජී" ට "ආර්ජ" සංඥාවකින් යැවූ බවද, කුමන්ත්‍රණය පිළිබඳ විස්තරයක් කරමින් "එච්" විසින් ලියන ලද ලියමනක අඩංගු කරුණු ද මෙ එක් එක් කරුණ "ඒ" මේ සිද්ධීන් සියල්ල ගැන නො දැන සිටිය ද, ඒවා ඉටු කළ තැනැත්තන් ඔහුට අමුත්තන් වුව ද කුමන්ත්‍රණයට ඔහු සම්බන්ධවීමට පෙර හෝ ඉන් ඔහු ඈත්වීමෙන් පසු එකී සිද්ධීන් සිදු වුව ද, කුමන්ත්‍රණය පැවතුණු බව සත්‍යයක් ය යි ඔප්පු කරනු සඳහා මෙන් ම ඊට "ඒ" සම්බන්ධ වූ බව සත්‍යයකැ යි ඔප්පු කරනු සඳහා ද අනුකූල වේ.

11. වෙන ආකාරයකින් අනුකූල නොවන කරුණු—

(අ) යම් ඉදිරිපත් කරුණකට හෝ අනුකූල කරුණකට නො ගැලපෙතොත්, සහ

(ආ) ඒවායේ හේතුවෙන්ම හෝ වෙනත් කරුණු හා සම්බන්ධ වීමෙන් යම් ඉදිරිපත් කරුණක හෝ අනුකූල කරුණක පැවැත්ම හෝ නො පැවැත්ම බෙහෙවින් ම වීමට ඉඩ ඇති දෙයක් හෝ ඉඩ නැති දෙයක් බවට පත් කළොත්, අනුකූල වේ.

වෙන ආකාරයකින් අනුකූල නොවන කරුණු අනුකූල වන අවස්ථා.

නිදර්ශනය

(අ) ප්‍රශ්නය නම්, එක්තරා දිනයෙක කොළඹ දි "ඒ" අපරාධයක් කළේ ද යනු යි.

ඒ දවසෙහි 'ඒ' ගාල්ලේ සිටිය බැව් අනුකූල කරුණෙකි.

අපරාධය කරන ලද වේලාවට ආසන්න ව ඒය කරන ලද ස්ථානයෙන් එපිට "ඒ" සිටීමෙන් ඔහු විසින් එම අපරාධ නො කළ හැකි නොවන නමුදු එය වීමට බෙහෙවින් ම ඉඩ නැති බව අනුකූල කරුණකි.

(ආ) ප්‍රශ්නය නම්, "ඒ" අපරාධයක් කළේ ද යනු යි. ඒ අවස්ථාවේ අන්දමට අපරාධය කරනු ලබන්නට ඇත්තේ "ඒ" හෝ "බී" හෝ "සී" හෝ "ඩී" විසින් මය. අන් කිසිවකු විසින් අපරාධය කරනු ලැබිය හැකි නොවූ බව ද "බී" හෝ "සී" "ඩී" විසින් එය නො කරනු ලැබිය හැ- බව දක්වන සැම කරුණක් ම අනුකූල වේ.

12. අලාභ ඉල්ලා පවරනු ලබන නඩුවල දී ගෙවිය යුතු අලාභය කොපමණ දැ යි තීරණය කිරීමට අධිකරණයට ඉවහල් වන යම් කරුණක් අනුකූල වේ.

අලාභ ඉල්ලා පවරනු ලබන නඩුවල දී මුදල කොපමණ දැ යි නිශ්චය කර ගැනීමට අධිකරණයට ඉවහල් වන කරුණු අනුකූල වේ.

13. යම් අයිතිවාසිකමක් හෝ සිරිතක් පැවතීම පිළිබඳ ව ප්‍රශ්නයක් ඇති විට, පහත දැක්වෙන කරුණු අනුකූල වේ :—

අයිතිවාසිකම් හෝ සිරිත විවාදයට යෝජනාව පවත්නා කල, අනුකූල වන කරුණු.

(අ) විවාදයට භාජන ව පවත්නා අයිතිවාසිකම් හෝ සිරිත ඇති කරන ලද, ඉල්ලා සිටින ලද, වෙනස් කරන ලද, පිළිගන්නා ලද ස්ථිර කරන ලද හෝ නිෂේධ කරන ලද හෝ අයිතිවාසිකම් හෝ සිරිතේ පැවැත්ම හා නො ගැලපුණු යම් කටයුත්තක් ;

Scanned with CamScanner

(ආ) අයිතිවාසිකම හෝ සිරිත ඉල්ලුම් කරන ලද හෝ පිළිගත්තා ලද, පාවිච්චි කරන ලද හෝ එහි පාවිච්චිය ගැන වාද කරන ලද හෝ එය ස්ථිර කරන ලද හෝ උල්ලංඝනය කරන ලද විශේෂ අවස්ථා.

**නිදර්ශනය**

ප්‍රශ්නය නම් මසුන් ඇල්ලීමේ අයිතිවාසිකමක් "ඒ" ට තිබේ ද යනු යි. "ඒ" ගේ මුතුන් මිත්තන්ගට මසුන් ඇල්ලීමේ අයිතිය පවරන ඔප්පුවක් ද, "ඒ" ගේ පියා මේ අයිතිය උගසට තැබීමක් ද මේ උගසට පරස්පර විරෝධිව "ඒ" ගේ පියා විසින් එම මසුන් ඇල්ලීමේ අයිතිය පසු කලෙක දී යමෙකුට ප්‍රදානය කිරීම ද, "ඒ" ගේ පියා මේ අයිතිවාසිකම පාවිච්චි කළ විශේෂ අවස්ථා හෝ මෙ අයිතිවාසිකම පාවිච්චි කිරීම "ඒ" ගේ අසල් වැසියන් විසින් වලක්වන ලද විශේෂ අවස්ථා ද අනුකූල කරුණු වේ.

මානසික හෝ ශාරීරික තත්ත්වයේ පැවැත්ම හෝ ශාරීරික හැඟිමේ පැවැත්ම දක්වන කරුණු.

**14.** අදහස, දැනුම, සද්භාවය, නොසැලකිල්ල, අපරීක්ෂාව, යම් විශේෂ තැනැත්තකු කෙරෙහි දක්වන හොඳ හිත හෝ නො හොඳ හිත වැනි යම් මානසික තත්ත්වයක පැවැත්ම දක්වන, නැතහොත් යම් ශාරීරික තත්ත්වයක හෝ ශාරීරික හැඟීමක පැවැත්ම දක්වන කරුණු එ වැනි යම් මානසික හෝ ශාරීරික තත්ත්වයක හෝ ශාරීරික හැඟීමක පැවැත්ම, ඉදිරිපත් කරණු හෝ අනුකූල කරුණු වන විට අනුකූල වේ.

පැහැදිලි කිරීම 1.—අනුකූල මානසික තත්ත්වයක පැවැත්ම දක්වන හෙයින් අනුකූල වන කරුණක් එකී මානසික තත්ත්වය සාමාන්‍ය වශයෙන් පවතින බව නොව විවාදයට භාජන ව පවත්නා විශේෂ කරුණකට සම්බන්ධ ව පවතින බව පෙන්විය යුතු ය.

පැහැදිලි කිරීම 2.—එහෙත් අපරාධයක් කරන ලදැයි චෝදනා ලැබ සිටින තැනැත්තකුට විරුද්ධව පවත්වනු ලබන නඩු විසඳීමෙහි දී විත්තිකරු ඊට පෙර අපරාධයක් කළ බව මේ වගන්තියේ අර්ථය ඇතුළත අනුකූල වන විට, ඒ තැනැත්තා ඊට පෙර වරදකරු වීම ද, අනුකූල කරුණක් විය යුතු ය.

**නිදර්ශනය**

(අ) සොර බඩු බව දැන සොර බඩු බාර ගත්තා ලදැයි "ඒ" චෝදනා ලැබ සිටී. සොරකම් කරන ලද එක්තරා බඩුවක් ඔහුගේ ස්වාමිත්වයෙහි තුබූ බව සත්‍ය බැව් ඔප්පු කරනු ලැබේ. තම ස්වාමිත්වයෙහි තුබූ එක් එක් හා සියලු බඩු සොරකම් කරන ලද බඩු බැව් ඔහු දැන සිටි බව පෙන්නුම් කිරීමට තුඩු දෙන හෙයින් සොරකම් කරන ලද තවත් බඩු බොහොමයක් එකී වේලාවේදී ම ඔහුගේ ස්වාමිත්වයෙහි තුබූ බැව් අනුකූල කරුණක් වේ.

(ආ) තමා බාර දුන් වේලාවේ දී කූට ලෙස තැනූ කාසියක් බැව් දැන ගත් කූට ලෙස තැනූ කාසියක් තවත් කෙනෙකුට වංචක ලෙස බාර දෙන ලදැයි "ඒ" චෝදනා ලැබ සිටී.

එය බාර දුන් අවස්ථාවේ දී තවත් කූට ලෙස තැනූ කාසි ගණනක් ම "ඒ" ගේ ස්වාමිත්වයෙහි තුබූ බැව් අනුකූල කරුණකි.

කූට ලෙස තැනූ කාසියක් බැව් දැන ගත් කූට ලෙස තැනූ කාසියක් අව්‍යාජ කාසියක් ලෙස තවත් අයකුට බාර දෙන ලදැයි "ඒ" මීට පෙර වරදකරු වූ බව අනුකූල කරුණකි.

(ඇ) රෞද්‍ර බල්ලකු බව "බී" දැන සිටි "බී" ට අයිති බල්ලකු විසින් හානි කරනු ලැබීම ගැන "බී" ට විරුද්ධ ව "ඒ" නඩු පවරයි. මීට පෙර "එක්ස්" "වයි" හා "ඉසෙඩ්" නමැත්තන් මේ බල්ලා විසින් සපා කනු ලැබීමත් ඒ ගැන "බී" ට ඔවුන් පැමිණිලි කර තිබීමත් අනුකූල කරුණු වේ.

(ඇ) ප්‍රශ්නය නම්, හුවමාරු පත්‍රයක් පිළිගත්තා "ඒ" මුදල් ලැබිය යුතු තැනැත්තා ගේ නම ව්‍යාජ නමක් බැව් දැන සිටියේ ද යනු යි.

ඒ ආකාරයෙන් ම ලියන ලද වෙනත් හුවමාරු පත්‍ර මුදල් ලැබිය යුත්තා විසින් "ඒ" වෙත යවනු ලැබිය හැකි වීමට පෙර "ඒ" බාර ගත් බව මුදල් ලැබිය යුත්තා අව්‍යාජ තැනැත්තෙක් වී නම්, මුදල් ලැබිය යුත්තා ව්‍යාජ තැනැත්තකු බැව් "ඒ" දැන සිටිබව දක්වන හෙයින්, අනුකූල වේ.

(ඉ) "බී" ගේ කීර්තියට හානි පමුණුවන අදහසින් ආරෝපණයක් ප්‍රසිද්ධ කිරීමෙන් "බී" අපකීර්තියට පත් කරන ලද යි "ඒ" චෝදනා ලැබ සිටී. "බී" කෙරෙහි "ඒ" ගේ සිතේ අවගතියක් ඇති වී තිබෙන බව දැක්වෙන ප්‍රකාශන මීට ඉහත දී "බී" සම්බන්ධව කරන ලද බව විවාදයට භාජන ව පවත්නා වූ විශේෂ ප්‍රකාශනය "බී" ගේ කීර්තියට හානි පමුණුවන අදහසින් "ඒ" විසින් කරන ලද්දක් ය යි ඔප්පු වන හෙයින් අනුකූල වේ.

මීට ඉහතදී "ඒ" හා "බී" අතර අරගලයක් නොවූ බවත්, පැමිණිලි ලේ සඳහන් දේ තමා ඇසූ ලෙස ම "ඒ" නැවතත් පැවසූ බවත්, 'බී' ගේ කීර්තියට හානි පැමිණවීමට "ඒ" අදහස් නො කළ බව දැක්වීම් වශයෙන් අනුකූල වේ.

(ඊ) ණය ගෙවිය හැකි තරම් වත්කමක් "සී" ට ඇතැයි වංචක ලෙස "බී" වෙත කරුණු දන්වා සිටිම ගැන "බී" විසින් 'ඒ" ට විරුද්ධ ව නඩු පවරනු ලැබේ. බංකොලොත් ව ... "සී" කෙරෙහි මෙසේ දක්වා සිටීමේ හේතු වෙන් විශ්වාස තැබීමට පොළඹවනු ලැබූ "බී" පාඩුව වින්දේ ය.

ණය ගෙවිය හැකි තරම් වත්කමක් "සී" ට ඇතැයි "ඒ" කරුණු දන්වා සිටිද්දී "සී" ගේ අසල්වැසියන් විසින් ද "සී" සමග ගණුදෙනු කළ අය විසින් ද "සී" ණය ගෙවිය හැකි තරම් වත්කමක් ඇත්තෙකැයි කල්පනා කරනු ලැබූ බව, "ඒ" විසින් සද්භාවයෙන් කරුණු දක්වා සිටින ලද බැව් දක්වීම් වශයෙන් අනුකූල වේ.

(උ) "ඒ" ට අයිති ගෘහයක කොන්ත්‍රාත්කරුවකු වන "සී" ගේ නියමය පරිදි "බී" විසින් කරන ලද වැඩෙහි කුලිය ගැනීමට "බී" විසින් "ඒ" ට විරුද්ධ ව නඩු පවරනු ලැබේ. "බී" ගේ ගිවිසුම "සී" සමග ඇති කර ගන්නා ලද එකක් ය, යනු තම නිදහසට "ඒ" කරුණු ඉදිරිපත් කරයි.

"ඒ" ගේ නියෝජිතයකු ලෙස නොව තමන්ගේ ම වගකීම අනුව "බී" සමග ගිවිසුමකට බැඳිය හැකි තත්ත්වයකට "සී" ට පැමිණිය හැකිවන පරිදි විවාදයට භාජන වැඩෙහි පාලනය සද්භාවයෙන් "සී" ට "ඒ" පැවරූ බැව් ඔප්පු කරන හෙයින් විවාදයට භාජන වැඩය ගැන "සී" ට "ඒ" විසින් මුදල් ගෙවන ලදැයි යනු අනුකූල කරුණක් වේ.

(ඌ) තමාට සම්භවුණු වස්තුව වංක ලෙස අයුතු අත් කර ගැනීම ගැන "ඒ" චෝදනා ලැබ සිටී. ප්‍රශ්නය නම් තමා එය අත් කර ගනිද්දි එහි නියම අයිතිකරු කවුරු දැයි සොයා ගනු ලැබිය නො හැකි යයි ඔහු අවංක ලෙස විශ්වාස කළේ ද යනු යි. මේ වස්තුව නැතිවීම ගැන ප්‍රසිද්ධ දැන්වීමක් "ඒ" සිටි ස්ථානයෙහි පළ කරන ලදැයි යනු එම වස්තුවේ නියම අයිතිකරු සොයා ගනු ලැබිය නොහැකි වූයේ යයි "ඒ" අවංක ලෙස විශ්වාස නො කළ බැව් දක්වන හෙයින් අනුකූල කරුණක් වේ. වස්තුව නැතිවූ බව අසා රට බොරු අයිතිවාසිකමක් ඉදිරිපත් කිරීමට කැමති වූ "සී" විසින් දැන්වීම වංචක ලෙස පළ කරන ලදැයි "ඒ" දැන සිටි බව හෝ එසේ පල කරන ලදැයි විශ්වාස කිරීමට "ඒ" ට කරුණු තිබුණු බව "ඒ" දැන්වීම ගැන දැන ගෙන තිබීමෙන් "ඒ" ගේ සද්භාවය අසත්‍ය බැව් ඔප්පු නොවූ බව දක්වන හෙයින් අනුකූල කරුණක් වේ.

(එ) "බී" මැරීමේ අදහසින් ඔහු වෙත වෙඩි තබන ලදැයි "ඒ" චෝදනා ලැබ සිටී. "ඒ" ගේ අදහස දැක්වීම සඳහා "ඒ" විසින් ඊට පෙර "බී" වෙත වෙඩි තබනු ලැබූ බව සත්‍ය බැව් ඔප්පු කළ හැකි. ය

Scanned with CamScanner

(ඒ) "බී" වෙත තර්ජනාත්මක ලියුම් යවන ලදැයි "ඒ" චෝදනා ලැබ සිටී. ලියුම්වල අදහස දැක්වීම සඳහා, "ඒ" විසින් ඊට පෙර "බී" වෙත යවන ලද තර්ජනාත්මක ලියුම් සත්‍ය බැව් ඔප්පු කළ හැකිය.

(ඔ) ප්‍රශ්නය නම්, "ඒ" සිය භාර්යාව වන "බී" ක්‍රෘරකම් කිරීමේ වරද කරන ලද ද යනු යි.

කරන ලදැයි කියන ක්‍රෘරකම් සිදුවීමට මද වේලාවකට පෙර ඔවුන් දෙදෙනාගේ එකිනෙකා කෙරෙහි ඇති වූ හැඟීම් ප්‍රකාශ කිරීම් අනුකූල කරුණු වේ.

(ඕ) ප්‍රශ්නය නම් "ඒ" ගේ මරණය විෂ ද්‍රව්‍යයකින් සිදු කරන ලද ද යනු යි තමා රෝගීව සිටි කාලය තුල තම රෝග ලක්ෂණ සම්බන්ධයෙන් "ඒ" විසින් කරන ලද ප්‍රකාශ අනුකූල කරුණු වේ.

(ක) ප්‍රශ්නය නම් "ඒ" ගේ ජීවිතය ගැන රක්ෂණ සහතිකය කරන ලද කාලයේ දී ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය කෙබඳු වී ද යනු යි යථෝක්ත කාලයෙහි හෝ ඊට ආසන්න කාලයක "ඒ" ගේ සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධයෙන් "ඒ" විසින් කරන ලද ප්‍රකාශ අනුකූල කරුණු වේ.

(ඛ) පාවිච්චියට සෑහෙන පමණ සුදුසු නොවන රථයක් තමාට කුලියට සපයාදීමේ හේතුවෙන් තමාට තුවාල සිදු වූ බැවින්, නො සැලකිල්ල ගැන "ඒ" "බී" ට විරුද්ධ ව නඩු පවරයි.

එම විශේෂ රථයේ ඇති දෝෂය ගැන "බී" ගේ සැලකිල්ල වෙනත් අවස්ථාවලදී යොමු කරනු ලැබූ බව අනුකූල වේ.

"බී" තමා කුලියට දුන් රථවල තත්ත්වය ගැන සිපින් පරිදි නොසැලකිලිමත් වූ බව අනුකූල නොවේ.

(ග) ඕනෑකමින් වෙඩි තැබීමෙන් "බී" ගේ මරණය සිදු කරන ලදැයි "ඒ" ට විරුද්ධව නඩු විභාග කරනු ලැබේ.

වෙනත් අවස්ථාවලදී "බී" වෙත "ඒ" වෙඩි තැබූ බව "බී" ට වෙඩි තැබීමේ අදහසක් "ඒ" තුළ පැවැති බැව් දක්වන හෙයින් අනුකූල වේ. මිනිසුන් මැරීමේ අදහසින් ඔවුන් වෙත වෙඩි තැබීමේ පුරුද්දක් "ඒ" ට තුබූ බැව් අනුකූල නොවේ.

(ඝ) අපරාධයක් කරන ලදැ යි "ඒ" ට විරුද්ධ ව නඩු විසඳනු ලැබේ. එම විශේෂ අපරාධය කිරීමේ අදහසක් ඇගවමින් ඔහු කිසිවක් පැවැසූ බැව් අනුකූල වේ.

ඒ වර්ගයට අයත් අපරාධ කිරීමේ සාමාන්‍ය ගතියක් අඟවමින් ඔහු කිසිවක් පැවැසූ බැව් අනුකූල නොවේ.

**ක්‍රියාව අහම්බෙන් සිදුවූවක් ද නැතහොත් ඕනෑකමින් කරන ලද්දක් ද යන ප්‍රශ්නයට අදාල වන කරුණු.**

15. යම් ක්‍රියාවක් අහම්බෙන් සිදු වූවක් ද, නැතහොත් ඕනෑකමින් කරන ලද්දක් ද, නැතහොත් යම් විශේෂ දැනුමක් හෝ අදහසක් ඇතිව කරන ලද්දක් දැයි ප්‍රශ්නයක් ඇති වන විට, ක්‍රියාව කරන තැනැත්තාගේ සම්බන්ධය ඇතිව කෙරෙන එක් එක් සිදුවීම ඇතුළත් එක සමාන සිදුවීම ඇතුළත් එක සමාන සිදුවීම් ගණනාවක කොටස් වශයෙන් එකී ක්‍රියාව සිදු වූ බව අනුකූල වේ.

නිදසුන

(අ) තම ගෘහය රක්ෂණ කර ඇති මුදල ලබා ගැනීම පිණිස එය ගිනි තබා විනාශ කරන ලදැ යි "ඒ" චෝදනා ලැබ සිටී.

පිළිවෙළින් ගෙවල් කීපයක ම "ඒ" වාසය කළ බවද, ඒ එක් එක් ගෙයක් ඔහු රක්ෂණ කළ බවද, ඒ එක එකක් ගින්නක් හට ගත් බව ද ඒ එක් එක් ගින්නෙන් පසු වෙනත් රක්ෂණ කාර්යාලයකින් මුදලක් "ඒ" ට ලැබුණු බවද, එකී ගිනි අහම්බෙන් හට නො ගත් බැව් දක්වීමට තුඩු දෙන හෙයින් අනුකූල වේ.

(ආ) " බී " ගේ ණයකාරයන්ගෙන් මුදල් බාර ගැනීමෙහි " ඒ " යොදවනු ලැබේ. තමා බාර ගන්නා මුදල් ගණන් දක්වෙන පොතක සටහන් තැබීම " ඒ " ගේ පුහු කම ය. යම් විශේෂ අවස්ථාවක දී තමා ඇත්ත වශයෙන් ම බාර ගත් මුදලට අඩුවෙන් මුදල් බාර ගත් බැව් දක්වෙන සටහනක් ඔහු සකස් කරයි.

ප්‍රශ්නය නම් මේ බොරු සටහන අහම්බෙන් සිදු වූවක් ද නැතහොත් හිතාමතාම කරන ලද්දක් ද යනු යි.

මේ පොතේ ම " ඒ " විසින් කරන ලද වෙනත් සටහනක් බොරු සටහන් වීමත්, එක් එක් අවස්ථාවේ කර ඇති බොරු සටහන " ඒ " ගේ වාසියට තිබීමත් අනුකූල කරුණු වේ.

(ඇ) " බී " වෙත කූට ලෙස තැනූ රුපියලක් වංචක ලෙස භාරදීම ගැන " ඒ " චෝදනා ලැබ සිටී.

ප්‍රශ්නය නම්, රුපියල භාර දීම අහම්බෙන් සිදු වූවක් ද යනු යි. " බී " වෙත රුපියල බාර දීමට මඳ වේලාවකට පෙර හෝ මඳ වේලාවකට පසුව, " සී " ට, " ඩී " ට හා " ඊ " ට කූට ලෙස තැනූ රුපියල " ඒ " ට බාර දුන් බැව්, " බී " වෙත කරන ලද බාර දීම අහම්බෙන් සිදු වූවක් නො වන බැව් දක්වන හෙයින් අනුකූල වේ.

16. ක්‍රියාවක් කරන ලද්දේ දැයි ප්‍රශ්නයක් ඇතිවන කල, යම් ක්‍රියා මාර්ගයකට අනුකූලව එය ස්වභාවික කරනු ලැබිය හැකි ක්‍රියා මාර්ගයේ පැවැත්ම අනුකූල කරුණක් වේ.

ක්‍රියා මාර්ගයක පැවැත්ම අනුකූල වන අවස්ථා.

නිදර්ශන

(අ) ප්‍රශ්නය නම්, එක්තරා ලියමනක් යවන ලද්දේ ද යනුයි.

යම් ස්ථානයක තබා ඇති ලියුම් සියල්ල තැපැලට ගෙන යනු ලැබීම සාමාන්‍ය ක්‍රියා මාර්ගයට අයිති වූවක් බවද, එකී ලියමන එම ස්ථානයෙහි තබන ලද බව ද, අනුකූල කරුණු වේ.

(ආ) ප්‍රශ්නය නම් එක්තරා ලියමනක් " ඒ " වෙත ලැබුණේ ද යනු යි.

යථා කාලයෙහි එය තැපැල් කරන ලද බවත්, බාර නො දෙන ලද ලියුම් කාර්යාලය මගින් එය ආපසු නො ලැබුණු බවත් අනුකූල කරුණු වේ.

## ඒත්තු ගැනීමේ සහ වරද කියාපෑම්

17. (1) ඒත්තු ගැනීමක් යනු යම් ඉදිරිපත් කරුණක් හෝ අනුකූල කරුණක් සම්බන්ධයෙන් යම් නිගමනයක් යෝජනා වන්නා වූ ද, මෙහි පහත සඳහන් පුද්ගලයන් අතුරෙන් යමකු විසින් හා මෙහි පහත සඳහන් අවස්ථාවන්හිදී කරනු ලබන්නා වූද කථිත හෝ ලේඛනගත ප්‍රකාශයකි.

ඒත්තු ගැනීම විස්තර කිරීම.

(2) වරද කියාපෑමක් යනු වරදක් කරන ලදැයි චෝදනා ලැබ සිටින පුද්ගලයකු විසින් තමා එම වරද කළ බැව් ප්‍රකාශ කරමින් හෝ එම නිගමනය යෝජනා කරමින් යම් වේලාවක දී කරනු ලබන ඒත්තු ගැනීමකි.

වරද කියාපෑම විස්තර කිරීම.

18. (1) අධිකරණ කටයුත්තක පාර්ශ්වකරුවකු විසින් හෝ නඩුවේ පවත්නා කරුණුවල හැටියට ප්‍රකාශ නිකුත් කිරීමට පැහැදිලි ලෙසත් හැඟෙන ලෙසත් ඔහු විසින් බලය ලබා දී ඇතැයි අධිකරණය සලකන එ වැනි පාර්ශ්වකරුවකුගේ නියෝජිතයකු විසින් නිකුත් කරනු ලබන ප්‍රකාශ ඒත්තු ගැනීම් ය.

අධිකරණ කටයුත්තක පාර්ශ්වකරු විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් කරනු ලබන ඒත්තු ගැනීම.

Scanned with CamScanner

නියෝජිත විලාස යෙන් පාර්ශ්වකරු විසින් කරනු ලබන ඒත්තු ගැනීම.

(2) නියෝජිත විලාසයකින් නඩුවල පැමිණිල්ලේ හෝ විත්තියේ පාර්ශ්වකරුවන් වශයෙන් ක්‍රියා කරන්නන් විසින් කරනු ලබන ප්‍රකාශ එම ප්‍රකාශ නිකුත් කරන්නන් එකී විලාසයෙන් පෙනී සිටිය හොත් මිස නො එසේ ව ඒත්තු ගැනීම නොවේ.

නඩුවෙහි කරුණු කෙරෙහි සම්බන්ධයක් ඇති පාර්ශ්වකරුවකු විසින් කරනු ලබන ඒත්තු ගැනීම.

(3) (අ) නඩුවෙහි කරුණු කෙරෙහි යම්කිසි අයිතිවාසිකම් හෝ මුදල් සම්බන්ධයක් ඇත්තා වූ ද, එ සේ සම්බන්ධයක් ඇති තැනැත්තන් වශයෙන් ප්‍රකාශ නිකුත් කරන්නා වූ ද තැනැත්තන් ; නැතහොත්

සම්බන්ධය යමකු ගෙන් ලබාගන්නා ලද්දේ ද, ඔහු විසින් කරනු ලබන ඒත්තු ගැනීම.

(ආ) නඩුවේ කරුණු කෙරෙහි තම සම්බන්ධය පාර්ශ්වකරුවන් විසින් යම් තැනැත්තන්ගෙන් ලබා ගන්නා ලද්දේ ද, එම තැනැත්තන් විසින් කරනු ලබන ප්‍රකාශ නිකුත් කරන තැනැත්තන්ගේ සැලකිල්ල පවත්නා කාලය තුළ නිකුත් කරනු ලැබේ නම්, ඒත්තු ගැනීම වේ.

නඩුවේ පාර්ශ්ව කරුට විරුද්ධ තත්ත්වයක් දරන්නකු හැටියට ඔප්පු කළ යුතු තැනැත්තන් විසින් කරනු ලබන ඒත්තු ගැනීම.

19. නඩුවේ යම් පාර්ශ්වකරුවකුට විරුද්ධ තත්ත්වයක් දරන්නකු හැටියට තැනැත්තන්ගේ තත්ත්වය හෝ වගකීම ඔප්පු කිරීම අවශ්‍ය වන්නන් විසින් කරනු ලබන ප්‍රකාශ, ඔවුන් විසින් හෝ ඔවුනට විරුද්ධ ව පවරනු ලැබූ නඩුවක එ වැනි තත්ත්වයක් හෝ වගකීමක් සම්බන්ධයෙන් එවැනි තැනැත්තන්හට විරුද්ධ ව එවැනි ප්‍රකාශ අනුකූල විය හැකි නම්, සහ ඒවා කරන තැනැත්තා එවැනි තත්ත්වයක් දරන අතර හෝ එවැනි වගකීමකට යටත් ව සිටින අතර කරනු ලැබේ නම්, ඒත්තු ගැනීම් වේ.

නිදර්ශන

"බී" සඳහා බදු මුදල් එකතු කිරීමට "ඒ" පෙරොත්දු වෙයි. "සී" ගෙන් "'බී" ට අය විය යුතු බදු මුදලක් එකතු නො කිරීම ගැන "ඒ" ට විරුද්ධව "බී" නඩු පවරයි.

"සී" ගෙන් "බී" ට බදු මුදලක් යා යුතු නැති බැව් "ඒ" කියයි. තමාගෙන් "බී" ට බදු මුදලක් අය විය යුතුව තිබුණේ ය යනුවෙන් "සී" කරන ප්‍රකාශය ඒත්තු ගැනීමක් වන අතර, "සී" ගෙන් බදු මුදලක් "බී" ට අය විය යුතු නැතැයි "ඒ" කියයි නම් "ඒ" ට විරුද්ධ ව අනුකූල වන කරුණක් ද වේ.

නඩුවේ පාර්ශ්ව කරු විසින් පැහැදිලි ලෙස සඳහන් කොට ඇති තැනැත්තන් විසින් කරනු ලබන ඒත්තු ගැනීම.

20. විවාදයට භාජන ව පවත්නා කරුණක් සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීම සඳහා නඩුවේ පාර්ශ්වකරුවකු විසින් පැහැදිලි ලෙස සඳහන් කොට ඇති තැනැත්තන් විසින් කරනු ලබන ප්‍රකාශ ඒත්තු ගැනීම් වේ.

නිදර්ශන

ප්‍රශ්නය නම් "ඒ" විසින් "බී" ට විකුණන ලද අශ්වයෙක් හොඳ තත්ත්වයේ ද යනු යි. "බී" ට "ඒ" මෙසේ කියයි. "ඔබ ගොස් 'සී' ගෙන් විමසන්න. ඒ සම්බන්ධව සියලු මදය "සී" දනී. "සී" ගේ ප්‍රකාශය ඒත්තු ගැනීමකි.

Scanned with CamScanner

ඒත්තු ගැනීම කරන තැනැත්තාට විරුද්ධව හෝ ඔහුගේ සම්බන්ධතාවය දක්වන නියෝජිතයාට විරුද්ධව ඒත්තු ගැනීම ඔප්පු කිරීම.

21. ඒත්තු ගැනීම්, අනුකූල වන්නාක් මෙන් ම, ඒවා කරන තැනැත්තාට හෝ ඔහුගේ සම්බන්ධතාව දක්වන නියෝජිතයාට විරුද්ධ ව ඔප්පු කළ හැකි ය. එසේ වුව ද, පහත දැක්වෙන අවස්ථාවන්හි දී හැර, ඒවා කරන තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ ඔහුගේ සම්බන්ධතාවය දක්වන නියෝජිතයා විසින් ඒවා ඔප්පු කළ හැකි නො වේ.

(අ) ඒත්තු ගැනීමක්, එය කරන තැනැත්තා මරණයට පත් අවස්ථාවක දී 32 වෙනි වගන්තිය යටතේ තුන්වැන්නවුන් අතර අනුකූල වන අන්දමේ ස්වභාවයකින් යුක්ත වේ නම් එය කරන තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් ඔප්පු කළ හැකි ය.

(ආ) අනුකූල වූ හෝ ඉදිරිපත් වූ මානසික හෝ ශාරීරික තත්ත්වයක් පැවති කල හෝ ඊට ආසන්න කාලයෙක කරන ලද්දා වූ ඒ බඳු මානසික හෝ ශාරීරික තත්ත්වයක පැවැත්ම පිළිබඳ ප්‍රකාශයක් යම් ඒත්තු ගැනීමකට අන්තර්ගත වී තිබෙන විට සහ එම ඒත්තුගැනීම සමග ඒ අසත්‍යතාව විය නොහැකි තරම් තත්ත්වයකට පමුණුවන හැසිරීමක් ඇති වන විට, එය කරන තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් ඒත්තු ගැනීම ඔප්පු කළ හැකි ය.

(ඇ) ඒත්තු ගැනීමක් වශයෙන් නොව අන් ආකාරයකින් අනුකූලවන විට ඒත්තු ගැනීමක් එය කරන තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් ඔප්පු කළ හැකි ය.

නිදර්ශන

(අ) "ඒ" සහ "බී" අතර ඇති ප්‍රශ්නය නම් එක්තරා ඔප්පුවක් කූට ලේඛනයක් ද යනුයි. එය අව්‍යාජ බැව් "ඒ" සහතික කරන අතර, එය කූට එකක් බැව් "බී" කියා සිටී.

ඔප්පුව අව්‍යාජ එකක් ය යි 'බී' කළ ප්‍රකාශයෙන් සත්‍ය බැව් 'ඒ' විසින් ඔප්පු කරනු ලැබිය හැකි ය. ඒ මෙන්ම ඔප්පුව ව්‍යාජ එකක් යැයි 'ඒ' කළ ප්‍රකාශයක් සත්‍ය බැව් 'බී' විසින් ඔප්පු කරනු ලැබිය හැකි ය. එසේ වුවද, තමා විසින් ඔප්පුව අව්‍යාජ එකක් යැයි කරන ලද ප්‍රකාශයක් සත්‍ය බැව් ඔප්පු කිරීමට "ඒ" ට නො හැකි වන්නාක් මෙන් ම, තමා විසින් ම ඔප්පුව කූට එකක් ය යි කරන ලද ප්‍රකාශයක් සත්‍ය බැව් ඔප්පු කිරීමට "බී" ට ද නො හැකි ය.

(ආ) තම නැව අනිසි මාර්ගයක ගමන් කරවීම ගැන එකී "බී" නැමැති නියමුවාට විරුද්ධ නඩු විසඳා ගෙන යනු ලැබේ. නියමිත මාර්ගයෙන් බැහැර නැව ගමන් කරවන ලදැයි දැක්වීමට සාක්ෂි ඉදිරිපත් කරනු ලැබේ. තමා විසින් සාමාන්‍ය කටයුතුවල දී ප්‍රයෝජන ගන්නා ලද සටහන් පොතක් "ඒ", ඉදිරිපත් කරයි. ඔහු විසින් එදිනෙදා බලාගන්නා ලදැයි කියන කරුණු අඩංගු වන මේ සටහන් පොත නියමිත මාර්ගයෙන් බැහැර නැව ගමන් නො කරවන ලද බැව් පෙන්වා දෙයි. 32 වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තියේ ප්‍රකාර තමා මරණයට පත් වූ විටෙක තුන්වෙනි පාර්ශ්වකරුවන් අතර මෙකී ප්‍රකාශයන් බාර ගත හැකි වන හෙයින්, ඒවා සත්‍ය ලෙස "ඒ" විසින් ඔප්පු කළ හැකි ය.

(ඇ) තමා විසින් කොළඹදී කරන ලද අපරාධයක් සම්බන්ධයෙන් "ඒ" චෝදනා ලැබ සිටී. තමා විසින් ලියන ලද්දා වූ ද, එදින යපනයෙහි දී දිනය සටහන් කරන ලද්දා වූ ද, එම දිනයෙහි යාපනයේ තැපැල් මුද්‍රාව සඳහන් ව ඇත්තා වූ ද ලියමනක් ඔහු ඉදිරිපත් කරයි. "ඒ" මරණයට පත් වූයේ නම් 32 වෙනි වගන්තියේ (2) වගන්තියේ ප්‍රකාර ප්‍රකාශය බාර ගත හැකි වන හෙයින් ලියමනේ දිනයෙන් කර තිබෙන එකී ප්‍රකාශය බාර ගත හැකි ය.



Scanned with CamScanner

(ආ) සොරකම් කරන ලද බඩු, සොර බඩු යැයි දැන ම භාර ගන්නා ලද යි "ඒ" චෝදනා ලැබ සිටි. වටිනාකමට අඩුවෙන් ඒවා විකිණීමට තමා අකමැති වූ බැව් ඔප්පු කිරීමට ඔහු ඉදිරිපත් වෙයි. ඉදිරිපත් කරුණුවල බලපෑමට යටත් ව පැවති හැසිරීම විස්තර කරන හෙයින් ඒත්තු ගැනීම වශයෙන් ගණන් ගත හැකි වුව ද, මෙකී ප්‍රකාශ සත්‍ය බැව් "ඒ" විසින් ඔප්පු කළ හැකි වේ.

(ඉ) කූට ලෙස තැනූ කාසි බව දැන දැන ම තම ස්වාමිත්වයේ කූට ලෙස තැනූ කාසි වංචක ලෙස තබා ගන්නා ලද යි "ඒ" චෝදනා ලැබ සිටි. එය කූට ලෙස තැනූ කාසියක් ද නැද්ද යන්න ගැන තමා සැක කළ බැවින් කාසිය පරීක්ෂා කරන ලෙස දක්ෂ තැනැත්තකුට තමා දුන් වූ බවත්, ඒ තැනැත්තා එය පරීක්ෂා කොට එය අව්‍යාජ කාසියක් බැව් ප්‍රකාශ කළ බවත් ඔප්පු කිරීමට ඔහු ඉදිරිපත් වෙයි.

පසුගිය නිදර්ශනයේ සඳහන් හේතු නිසා මෙකී කරුණු සත්‍ය බැව් "ඒ" විසින් ඔප්පු කළ හැකි ය.

ලේඛනවල අඩංගු කරුණු පිළිබඳ කරන ඒත්තු ගැනීම අනුකූල වන අවස්ථා.

22. මෙහි පහත ඇතුළත් නීති යටතේ එවැනි ලේඛනවල අඩංගු කරුණු ගැන ද්විතීයික සාක්ෂි දීමට තමාට හිමිකම් ඇතැ යි ඒ කරුණු සත්‍ය බැව් ඔප්පු කිරීමට අදහස් කරන පාර්ශ්වය පෙන්නුම් කරන තෙක් සහ පෙන්නුම් කළ හොත් මිස නො එසේ ව හෝ ඉදිරිපත් කොට ඇති ලේඛනයක සත්‍යතාවය ප්‍රශ්න කිරීමකට භාජන වේ නම් එකී ලේඛනයේ අඩංගු කරුණු පිළිබඳ කෙරෙන කථිත ඒත්තු ගැනීම අනුකූල නොවේ.

සිවිල් නඩුවල දී කෙරෙන ඒත්තු ගැනීම් අනුකූල වන අවස්ථා.

23. සිවිල් නඩුවලදී ඒත්තු ගැනීමක් පිළිබඳ සාක්ෂි දිය යුතු නැත යන පැහැදිලි කොන්දේසියක් අනුව හෝ, ඒ පිළිබඳ සාක්ෂිදීම අවශ්‍ය නො වේ ය යි පාර්ශ්වකරුවන් කැමැති වී සිටි බැව් අධිකරණයකට නිගමනය කළ හැකි කරුණු යෙදී ඇති කල, කරනු ලැබෙන කිසි ඒත්තු ගැනීමක් අනුකූල නො වේ.

පැහැදිලි කිරීම.—126 වෙනි වගන්තිය යටතේ සාක්ෂි දීමට තමාට බල කරනු ලැබිය හැකි යම් කරුණක් සම්බන්ධයෙන් සාක්ෂි දීමෙන් යම් අධිනීතිඥයකු හෝ නීතිඥයකු නිදහස් යයි මේ වගන්තියේ කිසිවකින් සැලකිය යුතු නොවේ.

පෙළඹවීම, තර්ජනය හෝ පොරොන්දු වීම හේතු කොට ගෙන ඇති වූ වරද කියා පෑම අනුකූල නොවේ.

24. චෝදනා ලැබ සිටින තැනැත්තාට විරුද්ධව නගා ඇති චෝදනාවට සම්බන්ධ වූ ද, බලය ලත් තැනැත්තකුගෙන් හෝ බලධාරී තැනැත්තකු ඉදිරිපිට දී සහ ඔහුගේ අනුදැනීම ඇති ව තවත් කෙනකුගෙන් හට ගන්නා වූ ද යම් පෙළඹවීමක්, තර්ජනයක් හෝ පොරොන්දුවක් හේතු කොට ගෙන වරද කියාපෑම සිදු වී තිබේ යයි අධිකරණයට පෙනී යන්නේ නම් සහ එසේ වරද කියා පෑමෙන් තමාට විරුද්ධව කරනු ලබන නඩු විභාගය සම්බන්ධයෙන් ලෞකික ස්වභාවයකින් යුත් යම් පහසුකමක් ලබා ගැනීමට හෝ යම් විපතකින් වැලකීමට තමාට හැකි බව විශ්වාස කිරීමට යුක්ති සහගත ය යි තමාට පෙනෙන හේතු චෝදනා ලැබූ තැනැත්තාට අත්කර දීමට අධිකරණයේ මතය පරිදි මෙකී පෙළඹවීම, තර්ජනය හෝ පොරොන්දු වීම සෑහේ නම්, යම් අපරාධ නඩුවක දී චෝදනා ලැබ සිටින තැනැත්තකු විසින් කරනු ලබන වරද කියා පෑමක් අනුකූල නො වේ.

**25.** (1) පොලිස් නිලධාරියකු වෙත කරන ලද කිසි වරද කියා පෑමක් යම් අපරාධයක් කරන ලද සි චෝදනා ලැබ සිටින තැනැත්තකුට විරුද්ධ ව සත්‍ය බැව් ඔප්පු නො කළ යුතු ය.

පොලිස් නිලධාරියකු වෙත කරන ලද වරද කියා පෑමේ චෝදනා ලැබ සිටින්නකුට විරුද්ධව ඔප්පු නොකළ යුතු බව.

(2) කැලෑ ආඥාපනත යටතේ දඬුවම් පැමිණ විය හැකි ක්‍රියාවක් පිළිබඳ ව කැලෑ නිලධාරියකු වෙත හෝ සුරාබදු ආඥාපනත යටතේ දඬුවම් පැමිණ විය හැකි ක්‍රියාවක් පිළිබඳ ව සුරා බදු නිලධාරියකු වෙත කරන ලද කිසි වරද කියා පෑමක්, එසේ කියා පාන යම් තැනැත්තකුට විරුද්ධ ව ඔප්පු නො කළ යුතු ය.

කැලෑ නිලධාරියකු වෙත හෝ සුරා බදු නිලධාරියකු වෙත කරන ලද වරද කියා පෑම එය කරන තැනැත්තාට විරුද්ධව ඔප්පු කළ යුතු නොවේ.

26. (1) යම් තැනැත්තකු පොලිස් නිලධාරියකුගේ ආරක්ෂාව යටතේ සිටින කාලය තුළ ඔහු විසින් කරනු ලබන කිසි වරද කියා පෑමක්, සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ දී ම කරනු ලැබේ නම් මිස නො එ සේ වූ, එ වැනි තැනැත්තකුට විරුද්ධ ව ඔප්පු නො කළ යුතු ය.

පොලිස් නිලධාරියකුගේ ආරක්ෂාව යටතේ සිටින කාලය තුළ යම් තැනැත්තකු විසින් කරනු ලබන වරද කියා පෑම ඔහුට විරුද්ධව ඔප්පු නොකළ යුතු බව.

(2) කැලෑ ආඥාපනත යටතේ හෝ සුරා බදු ආඥාපනත යටතේ දඬුවම් පැමිණ විය හැකි ක්‍රියාවක් පිළිබඳ ව යම් තැනැත්තකු විසින් පිළිවෙලින් කැලෑ නිලධාරියෙකුගේ හෝ සුරා නිලධාරියකුගේ ආරක්ෂාව යටතේ සිටින කාලය තුළ, කරනු ලබන කිසි ම වරද කියා පෑමක් සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියේ දී ම කරනු ලැබේ නම් මිස නො එ සේ ව එ වැනි තැනැත්තකුට විරුද්ධ ව ඔප්පු නො කළ යුතු ය.

කැලෑ නිලධාරියකුගේ හෝ සුරා බදු නිලධාරියකුගේ ආරක්ෂාව යටතේ සිටින කාලය තුළ යම් තැනැත්තකු විසින් කරනු ලබන වරද කියා පෑම ඔහුට විරුද්ධව ඔප්පු නො කළ යුතු බව.

27. (1) එ සේ වුව ද, යම් අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා ලැබ, පොලිස් නිලධාරියකුගේ ආරක්ෂාව යටතේ සිටින තැනැත්තෙකු ගෙන් ලැබුණු තොරතුරුවල ප්‍රතිඵලයක් වශයෙන් අනාවරණය වූයේ ය යි යම් කරුණක් සහතික වශයෙන් ප්‍රකාශ කරනු ලබන කල, වරද කියාපෑමක් වශයෙන් ගණන් ගත හැකි වුව ද නො වුව ද, එ වැනි තොරතුරු අතුරෙන් ඒ හේතුවෙන් අනාවරණය කරන ලද කරුණට පැහැදිලි ලෙස සම්බන්ධ වන්නා වූ තොරතුරු ප්‍රමාණය ඔප්පු කරනු ලැබිය හැකි ය.

චෝදනා ලැබ සිටින්නාගෙන් ලැබුණු තොරතුරු අතුරෙන් ඔප්පු කළ හැකි ප්‍රමාණය.

(2) කැලෑ ආඥාපනත යටතේ හෝ සුරා බදු ආඥාපනත යටතේ දඬුවම් පැමිණ විය හැකි ක්‍රියාවක් කරන ලද යි චෝදනා ලැබ සිටින තැනැත්තකුගෙන් ලැබුණු තොරතුරු සම්බන්ධයෙන් අංක 1 දරන උපවගන්තිය, වෙනස් කළ යුතු තැන්හි වෙනස් කිරීම් සහිත ව, එ බඳු තැනැත්තා පිළිවෙලින් කැලෑ නිලධාරියකුගේ හෝ සුරාබදු නිලධාරියෙකුගේ ආරක්ෂාව යටතේ සිටින විට අදාළ විය යුතු ය.

Scanned with CamScanner

'කැලෑ නිලධාරියා' සහ 'සුරාබදු නිලධාරියා' යන පදවල අර්ථය.

27. (අ) 25, 26, 27 වෙනි වගන්තිවල "කැලෑ නිලධාරියා" සහ "සුරාබදු නිලධාරියා" යන යෙදුම්හි අර්ථ, පිළිවෙළින් කැලෑ ආඥා පනතේ සහ සුරා බදු ආඥාපනතේ එකී පදවලට දී ඇති අර්ථ ම විය යුතු ය.

පෙළඹවීම, තර්ජනය හෝ පොරොන්දුව හේතු කොටගෙන ඇතිවූ හැඟීම ඉවත් කිරීමෙන් පසුව කරනු ලබන වරද කියා පෑම අනුකූල වෙයි.

28. 24 වෙනි වගන්තියෙහි සඳහන් අන්දමේ වරද කියාපෑමක් එ බඳු පෙළඹවීමක්, තර්ජනයක් හෝ පොරොන්දුවක් හේතු කොට ගෙන ඇති වූ හැඟීම, අධිකරණයේ මතය අනු ව සම්පූර්ණයෙන් ම ඉවත් කරනු ලැබීමෙන් පසු ව, කරන ලද නම්. එය අනුකූල වෙයි.

අන් ලෙසකින් අනුකූල වූ වරද කියාපෑම, රහස් බව පොරොන්දු වීම ආදිය හේතු කොට ගෙන අනුකූල නොවන තත්ත්වයට නොපැමිණිය යුතු බව.

29. එ බඳු වරද කියාපෑමක් අන් ලෙසකින් අනුකූල වන්නේ නම්. රහස් බවේ පොරොන්දුවක් පිට හෝ එය ලබා ගැනීම සඳහා විත්ති කරු මත යොදන ලද රැවටිල්ලක ප්‍රතිඵලයක් වශයෙන් පමණක් හෝ ඔහු වෙරිමතින් සිටිය දී එය කරන ලද බැවින්, හෝ ප්‍රශ්නවල ආකාරය කුමක් වුව ද තමා විසින් පිළිතුරු සැපයිය යුතු නොවූ ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් එය කරන ලද බැවින්, හෝ එ බඳු වරද කියා පෑමක් කිරීමට තමා බැඳී නැතැ යි හා ඒ පිළිබඳ සාක්ෂි තමාට විරුඩව දෙනු ලැබිය හැකි ය යි තමාට අවවාද නො කරන ලද බැවින් පමණකින් එය අනුකූල නො වන තත්ත්වයට නො පැමිණෙයි.

එකම වරදට සාමූහිකව නඩු පවරනු ලැබූ තැනැත්තන් කිප දෙනකු අතුරෙන් එක් කෙනෙකු විසින් කරනු ලබන වරද කියා පෑම.

30. එක ම වරදක් කිරීම ගැන එක් කෙනකුට වැඩි තැනැත්තන් සංඛ්‍යාවකට විරුද්ධ ව සාමූහික නඩු විසදීමේ දී තමාට සහ එවැනි තැනැත්තන් අතුරෙන් අන් කිසිවකුටත් බලපාන අන්දමේ වරද කියාපෑමක් ඒ තැනැත්තන්ගෙන් කෙනකු විසින් කර තිබෙන බව සත්‍ය බැව් ඔප්පු වූ විට, ඒ අන්‍ය තැනැත්තකුට විරුද්ධ ව ඒ වරද කියාපෑම අධිකරණය විසින් සලකා බැලිය යුතු නො වේ.

පැහැදිලි කිරීම.—මේ වගන්තියෙහි යොදා ඇති පරිදි "වරද" යන්නට වරද කිරීමට අනුබල දීම හෝ තැත් කිරීම ඇතුළත් වෙයි.

නිදර්ශනය

"සී" ගේ මරණය සිදු කිරීම ගැන "ඒ" හා "බී" ට විරුද්ධ සාමූහිකව නඩු විසඳනු ලැබේ. "බී" සහ මම "සී" ගේ මරණය සිදු කෙළෙමුයි "ඒ" කී බව සත්‍ය බැව් ඔප්පු වෙයි. මේ වරද කියාපෑමේ බලපෑම "බී" ට විරුද්ධව අධිකරණය විසින් සලකා බැලිය යුතු නොවේ.

ඒත්තු ගැනීම තීරණාත්මක සාධක නොව නිෂේධ විය හැකිය.

31. ඒත්තු ගැනීම් වූ කලී ඒත්තු ගන්නා ලද කරුණු සම්බන්ධ තීරණාත්මක සාධක නො වන නමුදු, මෙහි පහත ඇතුළත් විධි විධාන යටතේ නිෂේධ වශයෙන් ක්‍රියාත්මක විය හැකි ය.

Scanned with CamScanner

## සාක්ෂිකරුවන් වශයෙන් කැඳවිය නො හැකි තැනැත්තන් විසින් කරනු ලබන ප්‍රකාශ

මිළ තැනැත්තකු හෝ සොයා ගත නොහැකි තැනැත්තකු ආදීන් විසින් අනුකූල කරුණක් පිළිබඳ කරනු ලබන ප්‍රකාශය අනුකූල වන අවස්ථා.

**32.** මළ තැනැත්තකු විසින් හෝ සොයා ගත නොහැකි තැනැත්තකු විසින් හෝ සාක්ෂි දීමට අපොහොසත් තත්ත්වයකට පැමිණ සිටින්නකු විසින් හෝ නඩුවේ කරුණු යෙදී තිබෙන අන්දමට අධිකරණයේ මතය අනුව සාධාරණ නො වන ප්‍රමාදයක් හෝ වියදමක් රහිත ව අධිකරණයෙහි පෙනී සිටීමට ගෙන්වාගත නො හැකි තැනැත්තකු විසින් අනුකූල කරුණු පිළිබඳ ව කරනු ලබන ලිඛිත හෝ භාෂිත ප්‍රකාශ ම පහත දැක්වෙන අවස්ථාවල දී අනුකූල කරුණු වේ:—

එය මරණයේ හේතුව හා සම්බන්ධ වන විට.

(1) එම තැනැත්තාගේ මරණයට හේතුව විවාදයට භාජන වන අවස්ථාවලදී තම මරණය සම්බන්ධයෙන් හෝ තම මරණයෙන් කෙළවර වූ කටයුත්තේ යෙදී තිබුණු කරුණු අතුරෙන් කිසිවක් සම්බන්ධයෙන් ඔහු විසින් ප්‍රකාශ කරනු ලබන විට;

එ වැනි ප්‍රකාශ කරනු ලබද්දී ඒ ප්‍රකාශ කළ තැනැත්තා මරණය බලාපොරොත්තුවෙන් සිටිය ද නො සිටිය ද, ඔහුගේ මරණයට හේතුව විවාදයට භාජන වන අධිකරණ කටයුත්තේ ස්වභාවය කුමක් වුව ද, එ බඳු ප්‍රකාශ අනුකූල වේ.

නැතහොත් සාමාන්‍ය ක්‍රියා මාර්ගය අනුව ප්‍රකාශය කරනු ලැබූ විට.

(2) එ බඳු තැනැත්තකු විසින් සාමාන්‍ය ක්‍රියා මාර්ගය අනුව ප්‍රකාශ කරනු ලැබූ විට, විශේෂයෙන් ම සාමාන්‍ය ව්‍යාපාරවල යෙදෙද්දී හෝ වෘත්තීය කාර්‍යයන් ඉටු කරද්දී, තමා විසින් පොත්වල ලියන ලද සටහනකින් හෝ සන්දේශයකින්; හෝ මුදල්, බඩු, ඈප හෝ යම් කිසි වර්ගයක දේපළ භාර ගත් බවට තමා විසින් ලියන ලද හෝ අත්සන් කරන ලද කුවිතාන්සියකින්; හෝ වාණිජයෙහි භාවිතා වන්නා වූ ද තමා විසින් ලියන ලද හෝ අත්සන් තබන ලද ලේඛනයකින්; හෝ සාමාන්‍ය වශයෙන් තම විසින් දිනය යොදන ලද, ලියන ලද, හෝ අත්සන් තබන ලද ලිපියක හෝ වෙනත් ලියවිල්ලක දිනයකින් එම ප්‍රකාශය සමන්විත වූ විට;

නැතහොත්, ප්‍රකාශය කරන්නාගේ සම්බන්ධතාවලට විරුද්ධත්වයක් සැලසෙන විට.

(3) ප්‍රකාශය කරන්නාගේ මුදල් පිළිබඳ හෝ හිමිකරු වශයෙන් ඇති සම්බන්ධතාවලට විරුද්ධත්වයක් ප්‍රකාශය මගින් සැලසෙන විට හෝ ප්‍රකාශය සත්‍ය නම්, එය කරන්නා ඒ මගින් අපරාධ නඩුවකට හෝ අලාභ ඉල්ලා පවරනු ලබන නඩුවකට මුහුණ පෑමට කටයුතු සැලසෙන විට, හෝ කටයුතු සැලැස්විය හැකි වූ විට.

නැතහොත් මහජන අයිතිවාසිකම් හෝ චාරිත්‍ර හෝ සාමාන්‍ය උනන්දුව දක්වෙන කරුණු ගැන මතයක් පළවන විට.

(4) යම් මහජන අයිතිවාසිකමක, චාරිත්‍රයක හෝ පොදු හෝ සාමාන්‍ය උනන්දුව දක්වෙන කරුණක පැවැත්ම සම්බන්ධයෙන් එකී දෙය පැවැතිණි නම් එහි පැවැත්ම ගැන දැනගැනීමට ඉඩතිබුණු යම් තැනැත්තකුගේ මතයක් එ බඳු අයිතිවාසිකම, චාරිත්‍රය හෝ කරුණ පිළිබඳ කිසි මතභේදයක් පහළ වීමට පෙර ප්‍රකාශ කරනු ලැබූ විට.

Scanned with CamScanner

නැතහොත් ඥාති සම්බන්ධයක පැවැත්ම ගැන ප්‍රකාශය අදාළ වන විට.

(5) ලේ නෑකමෙන්, විවාහයෙන් හෝ දරුකමට හදා ගැන්මෙන් වූ ඥාති සම්බන්ධයක් තැනැත්තන් අතර ඇති බැව්, ප්‍රකාශය කරන්නා විශේෂ උප ක්‍රමයකින් දැන ගත් පසු, එවැනි සම්බන්ධයක් ඔවුන් අතර පවතින බවට ප්‍රකාශය අදාළ වන විට, සහ විවාදයට භාජනව පවත්නා ප්‍රශ්නය පැන නැඟීමට පෙර ප්‍රකාශය කරනු ලැබූ විට

නැතහොත් පවුලේ කටයුතු වලට සම්බන්ධ වූ අන්තිම කැමති පත්‍රයක හෝ ඔප්පුවක ප්‍රකාශය කරනු ලබන විට.

(6) මළ තැනැත්තන් අතර ලේ නෑකමෙන්, විවාහයෙන් හෝ දරුකමට හදා ගැන්මෙන් වූ ඥාති සම්බන්ධයක් පැවතීම ගැන ප්‍රකාශය කරනු ලබන විට ද, එ බඳු යම් මළ අයකුගේ පවුලේ කටයුතු වලට අදාළ වූ යම් අන්තිම කැමති පත්‍රයක හෝ ඔප්පුවක හෝ පවුලේ යම් පෙළපත් සටහනක හෝ යම් සොහොන් ගලක, හෝ පවුලේ තොරතුරු විස්තරයක හෝ එ බඳු ප්‍රකාශ සාමාන්‍යයෙන් කරනු ලබන වෙනත් දෙයක ප්‍රකාශය කරනු ලැබෙන විට ද, විවාද යට භාජන ව පවත්නා ප්‍රශ්නය ඉදිරිපත් කරනු ලැබීමට පෙර මේ ප්‍රකාශය කරනු ලැබූ විට.

නැතහොත්, ඇක 13 (අ) දරන වගන්තියෙහි සඳහන් කටයුත්තකට අදාළ වන ලේඛනයේ මාර්ග යෙන් ප්‍රකාශය කරනු ලබන විට

(7) 13 වැනි වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් පරිදි යම් කටයුත්තකට අදාළ වන යම් ඔප්පුවක, අන්තිම කැමැති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක ප්‍රකාශය ඇතුළත් වන විට.

නැතහොත්, බොහෝ දෙනෙකු විසින් ප්‍රකාශ කරනු ලැබ විවාදයට භාජනව පවත්නා කරුණට අනුකූල හැඟීම් ප්‍රකාශ වන විට

(8) පුද්ගලයන් ගණනාවක් විසින් ප්‍රකාශය කරනු ලැබ, විවාද යට භාජන ව පවත්නා කරුණට අදාළ වන පරිදි ඔවුන් තුළ ඇති වූ හැඟීම් ඒ මගින් ප්‍රකාශ වූ විට.

නිදර්ශන

(අ) ප්‍රශ්නය නම්, "බී" විසින් "ඒ" ගේ මරණය සිදු කරන ලද ද නැතහොත් තමා දූෂණය කරනු ලැබූ කටයුත්තකදී ලත් තුවාලවල ප්‍රතිඵලයක් වශයෙන් "ඒ" මරණයට පත් වූවා ද යනුයි.

ප්‍රශ්නය නම්, ඈ "බී" විසින් දූෂණය කරනු ලැබූවාද යනුයි. නැත හොත් ප්‍රශ්නය නම්, "ඒ" ගේ වැන්දඹුව විසින් "බී" ට විරුද්ධව නඩුවක් පැවරිය හැකි වන පරිද්දෙන් "බී" විසින් "ඒ" ගේ මරණය සිදු කරන ලද ද යනුයි.

මිනී මැරීමට, දූෂණය කිරීමට සහ සැලකිල්ලට භාජනය පවත්නා නඩු පැවරිය හැකි අයුක්තකට පිළිවෙළින් අදාළ වන්නාවූද තම මරණයට හේතු වශයෙන් "ඒ" විසින් කරනු ලබන්නාවූද ප්‍රකාශ අනුකූල කරුණුය.

(ආ) ප්‍රශ්නය නම්, "ඒ" ගේ උප්පත්තිය සිදු වූ දවස පිළිබඳවයි.

නැසීගිය ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් තමාගේ ක්‍රියා මාර්ගය අනුව නිතිපතා ලියන ලද්දාවූද, එක්තරා දිනයක තමා "ඒ" ගේ මවට ප්‍රතිකාර කළ පසු ඇය පුතකු ප්‍රසූත කළ බැව් සඳහන් වූද දින පොත් සටහන් අනුකූල කරුණකි.

Scanned with CamScanner

(ඇ) ප්‍රශ්නය නම්, එක්තරා දිනක " ඒ " කොළඹ සිටියේ ද යනුයි.

නැසීගිය නිතීඥයකු විසින් තමාගේ ක්‍රියා මාර්ගය අනුව නිතිපතා ලියන ලද්දාවූද, එක්තරා දිනයක තමා කොළඹ යම් ස්ථානයකදී නියමිත කටයුත්තක ගැන " ඒ " සමග සාකච්ඡා කිරීම සඳහාවූ ඔහු හමුවූ බැව් සඳහන් වූද, දින පොත් සටහනක් අනුකූල කරුණකි.

(ඈ) ප්‍රශ්නය නම්, එක්තරා දිනයෙක නැවක් ගාලු වරායෙන් යාත්‍රා කළාද යනුයි.

නැව කුලියට ගන්නා ලද වෙළඳ සමාගමක නැසීගිය සාමාජිකයකු විසින්, නියමිත දිනයෙක ගාලු වරායෙන් එම නැව යාත්‍රා කළ බැව් සඳහන් කරමින් ලන්ඩනයේ සිටින එකී සමාගමේ බඩු ලැබුණු නියෝජිත යන් වෙත එවන ලද ලිපියක් අනුකූල කරුණකි.

(ඉ) ප්‍රශ්නය නම්, යම් කුඩමක බදු මුදල " ඒ " ට ගෙවන ලද්දේ ද යනු යි. තමා එම බදු මුදල " ඒ " වෙනුවෙන් භාර ගෙන, " ඒ " ගේ නියමය පරිදි, එය ලඟ තබා ගත් බව දන්වමින් " ඒ " ගේ නැසීගිය නියෝජිත යකු විසින් " බී " ට යවන ලද ලිපියක් අනුකූල කරුණකි.

(ඊ) ප්‍රශ්නය නම්, " ඒ " සහ " බී " නීත්‍යානුකූල ලෙස විවාහ ව සිටියේ ද යනු යි. උත්සවයක් පැවැත්වීම අපරාධයක් විය හැකි පරිදි කරුණු යෙදී තිබුණු විට, තමා ඔවුන්ගේ විවාහය කර දුන් බව පවසමින් නැසීගිය පූජකවරයකු විසින් කරන ලද ප්‍රකාශය අනුකූල වේ.

(උ) ප්‍රශ්නය නම්, ඈතට සොයා ගත නො හැකි පුද්ගලයකු වන " ඒ " එක්තරා දිනයක ලිපියක් ලිව්වේ ද යනු ඔහු විසින් ලියන ලද ලිපියක එම දිනය දමා තිබීම අනුකූල වේ.

(ඌ) ප්‍රශ්නය නම්, නැවක විනාශයට හේතු වූයේ කුමක් ද යනු යි. ඉදිරිපිට පෙනී සිටින ලෙස කැඳැවිය නො හැකි වූ, නැවේ කපිතාන් පවසන විරෝධය අනුකූල කරුණකි.

(එ) ප්‍රශ්නය නම්, එක්තරා පාරක් ප්‍රසිද්ධ මාර්ගයක් ද යනු යි. මෙය ප්‍රසිද්ධ මාර්ගයක් වශයෙන් පැවති බවට ගමේ නැසීගිය ගම්මුලාදෑනියකු වූ " ඒ " විසින් කරන ලද ප්‍රකාශය අනුකූල කරුණකි.

(ඒ) ප්‍රශ්නය නම්, යම් දිනයෙක එක්තරා වෙළඳ පොලක පැවති ධාන්‍ය මිල කුමක් ද යනුයි. තමන්ගේ සාමාන්‍ය ක්‍රියා මාර්ගය අනුව නැසීගිය බ්‍රෝකර් කෙනෙකු විසින් ධාන්‍ය මිල සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයක් අනුකූල කරුණකි.

(ඔ) ප්‍රශ්නය නම්, දැනට ජීවතුන් අතර නැති " ඒ " නැමැත්තා " බී " ගේ පියා වූයේ ද යනු යි. " බී " තමාගේ පුතෙක් වූයේ යැ යි " ඒ " විසින් කරන ලද ප්‍රකාශයක් අනුකූල කරුණකි.

(ඕ) ප්‍රශ්නය නම්, " ඒ " උපන් දිනය කුමක් ද යනු යි. එක්තරා දිනයෙක " ඒ " උපන් බැව් දන්වමින් " ඒ " ගේ නැසීගිය පියා තම මිතුරකුට යවූ ලියමනක් අනුකූල කරුණකි.

(ක) ප්‍රශ්නය නම්, " ඒ " හා " බී " විවාහ ජීවිතයට ඇතුළත් වූ ද? ඒ කවදා ද? යනු යි. එක්තරා දිනයෙක තම දියණිය " ඒ " හා සමග විවාහ වූ බවට " බී " ගේ නැසීගිය පියා වූ " සී " විසින් තම සටහන් පොතක කර ඇති සටහනක් අනුකූල කරුණකි.

(ඛ) වෙළඳ සැලක ජනේලයක අනාවරණය කොට ඇති මුද්‍රිත විකට චිත්‍රයක් මාර්ගයෙන් ප්‍රකාශ කොට ඇති ලිඛිත අපහාසයක් ගැන " බී " ට " ඒ " විසින් නඩු පවරනු ලැබේ.

ප්‍රශ්නය නම්, විකට චිත්‍රය සහ එහි ඇති අපහාසාත්මක විලාසයත් අතර ඇති සමානත්වය පිළිබඳව ය. බලා සිටින්නන් සමූහයක් මේ කරුණු සම්බන්ධයෙන් පවසන විවේචන ඔප්පු කළ හැකි ය.

කලින් ඇති වූ අධිකරණ කටයුත්තක සාක්ෂි අනුකූල වන අවස්ථා.

**33.** සාක්ෂිකරු නැසීගිය කෙනකු වූ විට හෝ සොයා ගත නො හැකි වූ විට හෝ සාක්ෂි දීමට නො හැකි කෙනකු වූ විට හෝ විරුද්ධ පක්ෂය විසින් යාමට අපහසු තැනෙක රඳවා ඇති විට හෝ, නඩුවේ කරුණු යෙදී තිබෙන අන්දමට අධිකරණයේ මතය අනුව නිසි පමණට වැඩි ප්‍රමාදයක් නොවී හෝ විය හියදමක් නො දරා ඔහු කැඳවා ගත නො හැකි වූ විට අධිකරණ කටයුත්තක දී හෝ සාක්ෂි ගැනීමට නීති ප්‍රකාර බලය ලත් යම් තැනැත්තකු ඉදිරිපිට දී සාක්ෂිකරුවකු විසින් දෙනු ලබන සාක්ෂි පසු ව ඇති වන අධිකරණ කටයුත්තක දී හෝ එම අධිකරණ කටයුත්තේ ම පසු අවස්ථාවක දී සාක්ෂියෙහි සඳහන් කරුණුවල සත්‍යතාව ඔප්පු කිරීම සඳහා අනුකූල වේ.

එසේ වන්නේ—

(අ) අධිකරණ කටයුත්ත එකම පාර්ශ්වකරුවන් අතර හෝ ඔවුන්ගේ සම්බන්ධතාව නියෝජනය කරන්නන් අතර වූ විට;

(ආ) හරස් ප්‍රශ්න ඇසීමට බලය හා අවස්ථාව ද පළමුවෙනි අධිකරණ කටයුත්තේ විරුද්ධ පාර්ශ්වයට තිබුණු විට;

(ඇ) පළමුවෙනි අධිකරණ කටයුත්තේ මෙන් ම දෙවෙනි අධිකරණ කටයුත්තේ ද ඉදිරිපත් ප්‍රශ්න වැඩි වශයෙන් එක සමාන වූ විටය.

පැහැදිලි කිරීම — මේ වගන්තියේ අර්ථය ඇතුළත, අපරාධ නඩු විසඳීමක් හෝ විභාගයක් පැමිණිලිකරු සහ විත්තිකරුන් අතර ඇතිවන අධිකරණ කටයුත්තක් ලෙස සැලකිය යුතුය.

## විශේෂ අවස්ථා යටතේ කරනු ලබන ප්‍රකාශ

ගණන් පොත්වල සටහන් අනුකූල වන අවස්ථා.

34. ක්‍රියා මාර්ගය අනුව නිතිපතා තබනු ලබන ගණන් පොත්වල සටහන් අධිකරණය මගින් විභාගයක් පැවැත්විය යුතු කරුණකට සම්බන්ධවන සෑම විට ම, අනුකූල වේ. එහෙත් එ බඳු ප්‍රකාශ යම් තැනැත්තකුට විරුද්ධ චෝදනාවක් නැගීමට සෑහෙන සාක්ෂි නොවිය යුතුය.

නිදර්ශනය

රුපියල් 1,000 ක් සම්බන්ධයෙන් "බී" ට විරුද්ධ ව නඩු පවරා ඇති "ඒ" තමාට මේ මුදලට "බී" ණය ගැතිබව දක්වන සටහන් තම ගණන් පොත්වලින් පෙන්වයි. මේ සටහන් අනුකූල වන නමුත් වෙනත් සාක්ෂි නොමැතිව ණය ඇති බව ඔප්පු කිරීමට ප්‍රමාණවත් නොවේ.

නීති මගින් නියමිත යුතුකම ඉටු කිරීමේ දී රජයේ වාර්තාවන් හි සටහන් අනුකූල වන අවස්ථා.

35. ඉදිරිපත් කරුණක් හෝ අනුකූල කරුණක් ගෙන හැර දක්වමින් තම නිල කාර්යය ඉටු කරමින් රජයේ සේවකයකු විසින් රජයේ හෝ වෙනත් නිල පොතක, ලේඛනයක හෝ වාර්තාවක ලියන ලද්දා වූ ද, නැතහොත් එබඳු පොතක්, ලේඛනයක් හෝ වාර්තාවක් පවත්වාගෙන යනු ලබන රටේ නීතිය මගින් විශේෂයෙන් නියමිත යුතුකමක් ඉටු කිරීමේ දී අනෙක් තැනැත්තකු විසින් කරණ ලද්දා වූ ද, සටහනක් එ පමණින් ම අනුකූල කරුණක් වේ.

Scanned with CamScanner

**සිතියම්, සිතියම් සටහන් සහ සැලැස්මවල් අනුකූල වන අවස්ථා**

36. මහජනයාට විකිණීම සඳහා සාමාන්‍යයෙන් ඉදිරිපත් කොට ඇති ප්‍රසිද්ධ කරන ලද සිතියම්වල හෝ සිතියම් සටහන්වල හෝ රජයේ බලය පරිදි කරන ලද සිතියම්වල හෝ සැලැස්මවල එබඳු සිතියම්වල, සිතියම් සටහන්වල හෝ සැලැස්මවල, සාමාන්‍ය වශයෙන් ගෙන හැර දක්වනු ලබන කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කරණු හෝ අනුකූල කරුණු ඇතුළත් කොට සකස් කරන ලද ප්‍රකාශ එපමණින්ම අනුකූල කරුණු වේ.

**යම් පනතක, ආඥාපනතක හෝ නිවේදනයක අඩංගු පොදු ස්වභාවයකින් යුත් කරුණක් සම්බන්ධ ප්‍රකාශය අනුකූල වන අවස්ථා.**

37. පොදු ස්වභාවයකින් යුත් කරුණක පැවැත්ම සම්බන්ධයෙන් මතයක් ඇති කර ගැනීමට අධිකරණයට වුවමනා වූ විට, යම් පාර්ලිමේන්තු පනතක හෝ ආඥාපනතක හෝ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවන රජයේ යම් ප්‍රකාශයක හෝ නිවේදනයක, නොහොත් ලන්ඩන් ගැසට් පත්‍රයයි හෝ බ්‍රිතාන්‍ය ක්‍රීටය යටතේ යම් යටත් විජිතයක ඩොමීනියන් රාජ්‍යයක, යටත් රාජ්‍යයක හෝ අයිති රාජ්‍යයක ආණ්ඩුවේ ගැසට් පත්‍රය යි හෝ එබඳු යටත් විජිතයක, ඩොමීනියන් රාජ්‍යයක යටත් රාජ්‍යයක හෝ අයිති රාජ්‍යයක යම් කොටසක පළාත් පාලනය මගින් පළ කරන ලද ගැසට් පත්‍රය යි අදහස් කරනු ලබන මුද්‍රිත ලේඛනයක ඇතුළත් තොරතුරු විස්තරයකින් කරනු ලබන යම් ප්‍රකාශයක් අනුකූල කරුණකි.

**නීති ග්‍රන්ථවල ප්‍රකාශ අනුකූල වන අවස්ථා.**

38. යම් රටක නීතියක් සම්බන්ධයෙන් මතයක් ඇති කර ගැනීමට අධිකරණයට වුවමනා වූ විට, එබඳු රටක ආණ්ඩුවේ බලය පිට මුද්‍රණය කොට හෝ ප්‍රසිද්ධ කොට ඇතැයි හා එබඳු යම් නීතියක් ඇතුළත් යයි සලකනු ලබන පොතක ඇතුළත් එ බඳු නීතියක් පිළිබඳ ප්‍රකාශයක් හා එ බඳු රටක අධිකරණයන්හි තීරණයක් ගැන යම් වාර්තාවක් අඩංගු ලෙස සලකනු ලබන පොතක එ බඳු තීරණයක් ගැන වාර්තාවක් අනුකූල වේ.

## ප්‍රකාශයකින් කොයි තරමක් ඔප්පු කළ යුතු ද යන වග

**ප්‍රකාශය, සාකච්ඡා වක, ලේඛනයක, පොතක, ලියුම් පෙළක හෝ ලිපි පෙළක කොටසක් වන විට, දියයුතු සාක්ෂි.**

39. යම් ප්‍රකාශයක් ගැන සාක්ෂි දෙනු ලබන කල, එම ප්‍රකාශය වඩා දීර්ඝ ප්‍රකාශයක, හෝ සාකච්ඡාවක හෝ තනි ලේඛනයක කොටසක් වේ නම්, හෝ පොතක හෝ එකිනෙකට සම්බන්ධ ලියුම් පෙලක හෝ ලිපි පෙලක කොටසක් වන ලේඛනයක ඇතුළත් වේ නම්, ප්‍රකාශයේ ස්වභාවය සහ ප්‍රතිඵලය මෙන් ම එය කරනු ලබද්දීයෙදී තිබුණු කරුණු පිළිබඳව ද සම්පූර්ණ අවබෝධයක් ඇතිවීම සඳහා ඒ විශේෂ අවස්ථාවෙහි දී අවශ්‍ය යයි අධිකරණය කල්පනා කරන තරමට පමණක් ප්‍රකාශය, සාකච්ඡාව, ලේඛණය, පොත, ලියුම් පෙළ හෝ ලිපි පෙළ ගැන සාක්ෂි දිය යුතු ය. ඊට වැඩියෙන් සාක්ෂි නො දිය යුතු ය.

## අධිකරණයන්හි නඩු තීන්දු අනුකූල වන අවස්ථා

**කලින් දෙන ලද නඩු තීන්දු දෙවනුව නඩුවක් හෝ නඩු විසඳීමක් නැවැත්වීමට අනුකූල වේ.**

40. යම් අධිකරණයක සැලකිල්ලට නඩුවක් භාජන කිරීම හෝ ඒ මගින් නඩු විසඳීමක් පැවැත්වීම නීත්‍යනුකූලව වලක්වන යම් නඩු තීන්දුවක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් තිබීම එ බඳු නඩුවක් සැලකිල්ලට භාජන කිරීම හෝ එ බඳු නඩු විසඳීමක් පැවැත්වීම එ බඳු අධිකරණයක් මගින් කළ යුතු දැයි යන්න ඉදිරිපත් ප්‍රශ්නය වන විට අනුකූල කරුණක් වේ.

Scanned with CamScanner

බුදල් ආදී අධිකරණ බල පිළිබඳ නඩු තීන්දුවල අනුකූල භාවය.

**41.** (1) යම් කෙනෙකු වෙත යම් නීතිමය ස්වභාවයක් පවරා දෙන්නා වූ හෝ යම් කෙනෙකුගෙන් එවැන්නක් ඉවත් කරන්නා වූ, හෝ යම් නියමිත තැනැත්තකුට විරුද්ධව නොව සම්පූර්ණ වශයෙන් එ බඳු යම් ස්වභාවයක් සඳහා යම් තැනැත්තකු තුළ හිමිකම් ඇතැයි හෝ යම් විශේෂ දෙයකට ඔහු තුළ හිමිකම් ඇතැයි ප්‍රකාශ කරන්නා වූ බුදල්, විවාහ නාවික හෝ වස්තු භංගත්ව අධිකරණ බලය පාවිච්චි කිරීමේ දී බලයලත් අධිකරණයකින් නිකුත් කරනු ලබන අවසාන නඩු තීන්දුවක්, ආඥාවක්, හෝ තීන්දු ප්‍රකාශයක් එ බඳු යම් නීතිමය ස්වභාවයක පැවැත්ම හෝ එ බඳු යම් දෙයක් සඳහා එ බඳු තැනැත්තකුට අයිතිය අනුකූල වන විට අනුකූල වේ.

(2) එ බඳු නඩු තීන්දුවක් හෝ ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක්—

(අ) එ බඳු නඩු තීන්දුවක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක බවට පත් වූ කාලයෙහි දී එයින් පිපිනැමෙන යම් නීතිමය ස්වභාවයක් අත් වූ බව; සහ

(ආ) එ බඳු යම් තැනැත්තකුට හිමිකම් ඇතැයි එයින් ප්‍රකාශ වන යම් නීතිමය ස්වභාවයක් එකී තැනැත්තාට අත් වූයේ යයි එබඳු නඩු තීන්දුවක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් මගින් පවසනු ලබන කාලයෙහි දි ඔහුට අත් වූ බව; සහ

(ඇ) එබඳු යම් තැනැත්තකුගෙන් යම් නීතිමය ස්වභාවයක් ඒ මගින් ඉවත් කරනු ලැබේ නම්, එය යම් කාලයක පටන් නතර වූයේ යයි හෝ නතර කළ යුතු යයි එ බඳු නඩු තීන්දුවක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් ප්‍රකාශ කළ කාලයෙහි දී එය නතර වූ බව; සහ

(ඈ) යම් තැනැත්තකුට හිමිකම් ඇතැයි එය ප්‍රකාශ කරන යම් කිසිවක්, ඔහුගේ දේපළ වූයේ යයි හෝ දේපළ විය යුතු යයි එ බඳු නඩු තීන්දුවක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් ප්‍රකාශ කරන කාලයෙහි පටන් එකී තැනැත්තාගේ දේපළ වශයෙන් පැවති බව,

තීරණාත්මක ව ම ඔප්පු කරයි.

41 වෙනි වගන්තියෙහි සඳහන් ඒවා හැර වෙනත් නඩු තීන්දු ආදිය අනුකූල වන අවස්ථා.

**42.** 41 වෙනි වගන්තියෙහි සඳහන් ඒවා හැර වෙනත් නඩු තීන්දු, ආඥා හෝ තීන්දු ප්‍රකාශ, නඩු විභාගයට අනුකූල වූ පොදු ස්වභාවයකින් යුත් කරුණුවලට සම්බන්ධ නම් අනුකූල වේ. එහෙත් එබඳු ආඥා හෝ තීන්දු ප්‍රකාශ ඒවායින් ප්‍රකාශ කරනු ලබන දේ පිළිබඳ තීරණාත්මක සාක්ෂි නො වේ.

**නිදර්ශනය**

තමාගේ ඉඩමට අයුතු ලෙස ඇතුළුවීම සම්බන්ධයෙන් "ඒ" "බී" ට විරුද්ධව නඩු පවරයි. ඉඩම හරහා ප්‍රසිද්ධ මාර්ග අයිතියක් ඇති බැව් "බී" කියන නමුත් "ඒ" එය නොපිළිගනී.

එම ඉඩමට අයුතු ලෙස ඇතුළුවීම ගැන "ඒ" විසින් "සී" ට විරුද්ධව පවරන ලද්දවූ ද, එම මාර්ග අයිතියම පවතින බැව් "සී" විසින් ඉදිරිපත් කරන ලද්දාවූ ද, නඩුවක විත්තිකරුට පක්ෂව තීන්දු ප්‍රකාශයක් තිබීම අනුකූල කරුණකි. එහෙත් එයින් මාර්ග අයිතිය පවතින බව තීරණාත්මක ලෙස ඔප්පු නො කෙරේ.

43. 40, 41 හා 42 වෙනි වගන්තිවල සඳහන් ඒවා හැර වෙනත් නඩු තීන්දු, ආඥා හෝ තීන්දු ප්‍රකාශ එබඳු නඩු තීන්දුවක, ආඥාවක හෝ තීන්දු ප්‍රකාශයක පැවතීම ඉදිරිපත් කරුණක් වේ නම්, හෝ මේ ආඥාපනතේ වෙන යම් විධිවිධානයක් යටතේ අනුකූල වේ නම් මිස, එසේ නො වන කල්හි, අනුකූල නො වේ.

40, 41 හා 42 වෙනි වගන්තිවල සඳහන් ඒවා හැර වෙනත් නඩු තීන්දු ආදිය අනුකූල වන අවස්ථා.

**නිදර්ශන**

(අ) තම එක් එක් කෙනාට දෙස් පැවරෙන ලිඛිත අපහාසයක් ගැන "ඒ" සහ "බී" "සී" ට විරුද්ධව ව වෙන් වෙන් වශයෙන් නඩු පවරති. අපහාසයට හේතු වෙතැයි කියනු ලබන කාරණය සත්‍ය බැව් එක් එක් නඩුවේ දී "සී" කියා සිටී. කරුණු යෙදී ඇති ආකාරයට එය එක් එක් නඩුවේ දී සත්‍ය වීමට හෝ එකකදී වත් සත්‍ය නො වීමට ඉඩ ඇත.
"සී" සිය නිර්දෝෂ භාවය ඔප්පු කිරීමට අපොහොසත් වූ හෙයින් "සී" ට විරුද්ධව අලාභය ඉල්ලා තීන්දු ප්‍රකාශයක් "ඒ" ලබා ගනී. මේ කාරණය "බී" හා "සී" අතර අනුකූල නො වේ.

(ආ) තමාගේ එළදෙනක සොරකම් කිරීම ගැන "ඒ" විසින් "බී" ට විරුද්ධව නඩු පවරනු ලැබේ. "බී" වරදකරු වෙයි.
"බී" වරදකරු වීමට පෙර ඔහු විසින් "සී" ට විකුණන ලද එළදෙන සම්බන්ධයෙන් "ඒ" විසින් "සී" ට විරුද්ධව නඩු පවරනු ලැබේ. "බී" ට විරුද්ධව නඩු තීන්දුව "ඒ" හා "සී" අතර අනුකූල නො වේ.

(ඇ) "බී" ට විරුද්ධ ව ඉඩමක ස්වාමිත්වය සඳහා තීන්දු ප්‍රකාශයක් "ඒ" විසින් ලබා ගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් "බී" ගේ පුත් "සී" "ඒ" ගේ මරණය සිදු කරයි.
අපරාධයක් සඳහා චේතනාව දක්වන හෙයින් නඩු තීන්දුව තිබීම අනුකූල වේ.

(ඈ) සොරකම් කිරීම ගැන ද සොරකම ගැන කලින් වරදකරු වීම ගැන ද "ඒ" ට විරුද්ධ ව නඩු පවරා ඇත. කලින් වරදකරු වූ බව ඉදිරිපත් කරුණක් වශයෙන් අනුකූල වේ.

(ඉ) "බී" ගේ මරණය සිදු කිරීම ගැන "ඒ" ට විරුද්ධ ව නඩු විභාග කරනු ලැබේ. තමාට අපහාස කිරීම ගැන "ඒ" ට විරුද්ධව "බී" නඩු පැවරූ බවත්, වරදකරු වූ "ඒ" ට දඬුවමක් පමුණුවන ලද බවත්, ඉදිරිපත් කරුණ සඳහා චේතනාව දක්වන හෙයින් 8 වෙනි වගන්තිය යටතේ අනුකූල වේ.

44. අංක 40, 41 හෝ 42 දරන වගන්ති යටතේ අනුකූල වූ ද, විරුද්ධ පාර්ශ්වය විසින් ඔප්පු කරන ලද්ද වූද, යම් නඩු තීන්දුවක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් එය නිකුත් කිරීමට බලය නොමැති අධිකරණයක් මගින් නිකුත් කරන ලද බැව්, හෝ වංචා වෙන් හෝ කූට කුමන්ත්‍රණයෙන් ලබා ගන්නා බැව් යම් නඩුවක හෝ වෙනත් අධිකරණ කටයුත්තක පාර්ශ්වකරුවකු විසින් පෙන්නුම් කළ හැකි ය.

වංචාව, කූට කුමන්ත්‍රණය හෝ අධිකරණයට බලය නොමැති බව ඔප්පු කළ හැකිය.

Scanned with CamScanner

## තුන්වැන්නවුන්ගේ මත අනුකූල වන අවස්ථා

විශේෂඥයින්ගේ මත.

45. විදේශීය නීතිය හෝ විද්‍යාව හෝ කලාව, හෝ අත් අකුරුවල හෝ ඇඟිලි සටහන්වල හෝ අතුල් සටහන්වල හෝ පතුල් සටහන්වල අනන්‍යතාව හෝ අව්‍යාජතාවය සම්බන්ධයෙන් මතයක් ඇති කර ගැනීමට අධිකරණයට වුවමනා කල, එබඳු නීතිය, විද්‍යාව හෝ කලාව පිළිබඳව හෝ අත් අකුරුවල හෝ ඇඟිලි සටහන්වල හෝ අතුල් සටහන්වල හෝ පතුල් සටහන්වල අනන්‍යතාව හෝ අව්‍යාජත්වය පිළිබඳව විශේෂ නිපුනත්වයක් ඇති තැනැත්තන් එකී කරුණු ගැන දරන අනුකූල කරුණු වේ.

එබඳු තැනැත්තන් හට විශේෂඥයින් යයි කියනු ලැබේ.

**නිදර්ශන**

(අ) ප්‍රශ්නය නම්, "ඒ" ගේ මරණය වස දීමෙන් සිදු වූයේ ද යනුයි. "ඒ" ගේ මරණයට හේතු වූයේ ය යි සිතන විෂ ද්‍රව්‍යය නිසා ඇති වන රෝග ලක්ෂණ සම්බන්ධයෙන් විශේෂඥයින්ගේ මත අනුකූල වේ.

(ආ) ප්‍රශ්නය නම්, එක්තරා ක්‍රියාවක් කරමින් සිටි "ඒ" තම සිහිවිකලත්වය හේතුකොට ගෙන එම ක්‍රියාවේ ස්වභාවය දැන ගැනීමට නුපුළුවන් ව සිටියේ ද නැතහොත් ඔහු අයුතු හෝ නීතියට විරුද්ධ දෙයක් කරමින් සිටියේ ද යනු යි.

"ඒ" විදහාපාන රෝග ලක්ෂණවලින් සාමාන්‍ය වශයෙන් සිහිවිකලත්වය පෙන්නුම් කරනු ලැබේ ද යන ප්‍රශ්නය ගැන හා එබඳු සිහිවිකලත්වය ඇති තැනැත්තෝ තමන් යෙදී සිටින ක්‍රියාවල ස්වභාවය දැන ගැනීමට හෝ තමන් කරන දෙය අයුතු බව, හෝ නීතියට විරුද්ධ බව දැන ගැනීමට නුපුළුවන් තත්ත්වයකට පමුණුවනු ලැබෙත් ද යන වග ගැන විශේෂඥයින්ගේ මත අනුකූල වේ.

(ඇ) ප්‍රශ්නය නම්, එක්තරා ලේඛනයක් "ඒ" විසින් ලියන ලද්දක් ද යනුයි. "ඒ" විසින් ලියන ලද්දක් ය යි ඔප්පු වූ හෝ බාරගත් වෙනත් ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබේ.

ලේඛන දෙකම එකම තැනැත්තකු විසින් ලියන ලදැයි ද නැතහොත්, දෙදෙනකු විසින් ලියන ලදැයි ද යන ප්‍රශ්නය පිළිබඳ විශේෂඥයින්ගේ අදහස් වේ.

විශේෂඥයින්ගේ මත හා සම්බන්ධ කරුණු.

46. විශේෂඥයින්ගේ මත අනුකූල වන විට, ඒ මත හා පක්ෂ වේ නම් හෝ ඊට නොගැලපේ නම්, අන් ලෙසකින් අනුකූල නොවන කරුණු අනුකූල වේ.

**නිදර්ශන**

(අ) ප්‍රශ්නය නම්, එක්තරා වස වර්ගයකින් "ඒ" ට වස දෙන ලද ද යනු යි. එම වස වර්ගයෙන් ඇතිවන ලකුණුය යි විශේෂඥයින් සහතික කරන හෝ නිෂේධ කරන ඇතැම් ලකුණු එම වස වර්ගය ශරීර ගත වූ වෙනත් තැනැත්තන් විසින් විදහාපාන ලදැයි යන්න අනුකූල කරුණකි.

(ආ) ප්‍රශ්නය නම්, එක්තරා සමුද්‍ර ප්‍රාකාරයක් හේතුකොටගෙන වරායකට අවහිරයක් වේ ද යනුයි.

වෙනත් වරායවල් වෙනත් කරුණු අතින් එ ලෙසින්ම පිහිටා ඇති නමුදු, එබඳු සමුද්‍ර ප්‍රාකාර නොතිබුණු ස්ථානවල එකී වේලාවේ දී පමණක් ඒ වාට අවහිර ඇතිවීමට පටන් ගත් බව අනුකූල වේ.

**47.** යම් ලේඛනයක් ලියන ලද්දේ හෝ අත්සන් කරන ලද්දේ කිනම් තැනැත්තන් විසින් ද යන වග සම්බන්ධයෙන් මතයක් ඇති කර ගැන්මට අධිකරණයට වුවමනා කල, එකී තැනැත්තා විසින් එය ලියන ලද්දේ ය යි හෝ නැතැයිද, නො එසේ නම් අත්සන් කරන ලද්දේ ය යි හෝ නැතැයි ද, යනුවෙන් එය ලිවූ හෝ අත්සන් කළ ලෙස සලකනු ලබන තැනැත්තාගේ අත් අකුරු හඳුනන යම් තැනැත්තකුගේ මතයක් අනුකූල කරුණක් වේ. අත් අකුරු ගැන මතය.

පැහැදිලි කිරීම.—යම් තැනැත්තෙක් තවත් තැනැත්තෙකුගේ අත් අකුරු හඳුනන්නේ ය යි කියනු ලබන්නේ දෙවෙනි ව සඳහන් තැනැත්තා ලියනු ඔහු දැක තිබෙන විට හෝ ඔහු විසින් හෝ ඔහුගේ අවසරය පිට ලියන ලද්දා වූ ද, එකී තැනැත්තා වෙත යවන ලද්දා වූ ද, ලේඛනවලට පිළිතුරු වශයෙන් එකී තැනැත්තා විසින් ලියන ලදැයි අදහස් කරනු ලබන ලේඛන ඔහු වෙත ලැබී ඇති විට, හෝ එකී තැනැත්තා විසින්, සාමාන්‍ය කටයුතුවල යෙදී සිටිය දී, ලියන ලදැයි අදහස් කරනු ලබන ලේඛන සිරිත් ලෙස ඔහු වෙත ඉදිරිපත් කර ඇති විටය.

නිදර්ශන

ප්‍රශ්නය නම්, එක්තරා ලියමනක් ලන්ඩනයෙහි සිටින "ඒ" නමැති වෙළෙන්දකුගේ අත් අකුරින් ලියා තිබේ ද යනු යි.

"බී" වූකලී, "ඒ" වෙත යවන ලද ලියුම් ලියා ඇත්තා වූ ද, "ඒ" විසින් ලියන ලදැයි අදහස් කරනු ලබනු ලියුම් ලබා ඇත්තා වූ ද, කොළඹ වෙළෙන්දෙකි.

"බී" ගේ ලිපිකරු වන "සී" ගේ කාර්යය වූයේ "බී" ගේ ලියුම් පරීක්ෂා කොට ඒවා ගොනු කිරීම යි. "බී" ගේ බ්‍රෝකර් තැන "ඩී" ය. "ඒ" විසින් ලියන ලදැයි අදහස් කරනු ලබන ලියුම් "බී" විසින් සිරිත් ලෙස "ඩී" වෙත ඉදිරිපත් කරන ලද්දේ ඒ පිළිබඳ ව "ඩී" ත් සමග උපදෙස් දීම සඳහා ය. "බී" හෝ "සී" හෝ "ඩී" කිසි විටෙක "ඒ" ලියනු නො දුටු නමුත්, ලියමන "ඒ" ගේ අත් අකුරින් ලියා තිබේ ද යන ප්‍රශ්නය පිළිබඳ ව "බී", "සී" හා "ඩී" දරන මතය අනුකූල වේ.

**48.** යම් සාමාන්‍ය අයිතිවාසිකමක් හෝ සිරිතක් පැවතීම පිළිබඳ මතයක් ඇති කර ගැනීමට අධිකරණයට වුවමනා වූ විට, එවැන්නක් පැවතිණි නම් එහි පැවැත්ම දැනගැනීමට ඉඩ ඇති තැනැත්තන් එබඳු සිරිතක් හෝ අයිතිවාසිකමක් පැවැත්වීම සම්බන්ධයෙන් දරන අදහස් අනුකූල වේ. අයිතිවාසිකම හෝ සිරිතේ පැවැත්ම පිළිබඳ මතය අනුකූල වන අවස්ථා.

පැහැදිලි කිරීම.—"සාමාන්‍ය සිරිත හෝ අයිතිවාසිකම" යන පාඨයට යම් සැලකිය යුතු තරමේ තැනැත්තන් සමූහයකට පොදු සිරිත් හෝ අයිතිවාසිකම් ඇතුළත් වේ.

නිදර්ශනය

එක්තරා ලිඳක වතුර පාවිච්චි කිරීමට එක්තරා ගමක වාසය කරන්නන් සතු ව ඇති අයිතිවාසිකම, මේ වගන්තියේ අර්ථය ඇතුළත සාමාන්‍ය අයිතිවාසිකමකි.

**49.** (අ) යම් තැනැත්තන් සමූහයක හෝ පවුලක ව්‍යවහාරයන් සහ පිළිගත් ප්‍රතිපත්ති; හෝ ව්‍යවහාරයන් හෝ පිළිගත් ප්‍රතිපත්ති ආදිය පිළිබඳ මතය අනුකූල වන අවස්ථා

(ආ) යම් ආගමික හෝ පුණ්‍යාධාර ආයතනයක ව්‍යවස්ථාව සහ පාලනය; හෝ

(ඇ) විශේෂ ප්‍රදේශවල හෝ විශේෂ පන්තිවල ජනයා විසින් යොදනු ලබන වචනවල හෝ යෙදුම්වල අර්ථ;

පිළිබඳව මතයක් ඇති කර ගැන්මට අධිකරණයට වුවමනා වූ විට--

ඒ සම්බන්ධයෙන් කරුණු දැනගැනීමේ විශේෂ මාර්ග ඇති තැනැත්තාගේ මත අනුකූල කරුණු වේ.

ඥාති සම්බන්ධය ගැන මතය අනුකූල වන අවස්ථා.

50. එක් තැනැත්තකු හා තවකෙකු අතර ඇති ඥාති සම්බන්ධය ගැන මතයක් ඇති කර ගැන්මට අධිකරණයට වුවමනා වූ විට පවුලේ සාමාජිකයකු වශයෙන් හෝ අන් ලෙසකින් කාරණය ගැන තොරතුරු දැනගැනීමේ විශේෂ මාර්ග ඇති යම් තැනැත්තකු එ බඳු ඥාති සම්බන්ධයක් පැවතීම පිළිබඳව හැසිරීමෙන් ප්‍රකාශ කරනු ලබන මතයක් අනුකූල කරුණකි.

එසේ වුව ද, දික්කසාද නඩුවකදී හෝ උඩරට විවාහ ආඥාපනතේ 24 වෙනි වගන්තිය යටතේ හෝ දණ්ඩ නීති සංග්‍රහයේ 362 (ආ), 362 (ඇ) සහ 362 (ඈ) වෙනි වගන්තිය යටතේ පවරනු ලැබූ නඩු වල දී විවාහයක් ඔප්පු කිරීම සඳහා එ බඳු මතයක් ප්‍රමාණවත් නො වේ.

නිදර්ශන

(අ) ප්‍රශ්නය නම්, "ඒ" සහ "බී" විවාහ වී සිටියෝ ද යනු යි. ස්වකීය මිත්‍රයන් විසින් සාමාන්‍යයෙන් අඹු සැමි වශයෙන් ඔවුන් පිළිගනු ලැබ, සංග්‍රහ කරනු ලැබූ බව් අනුකූල වේ.

(ආ) ප්‍රශ්නය නම්, "ඒ", "බී" ට දාව උපන් සුජාතක පුත්‍රයා ද යනු යි. පවුලේ සාමාජිකයන් විසින් "ඒ" ට සැම විට ම එපරිද්දෙන් සලකනු ලැබීම අනුකූල වේ.

මතයට හේතු අනුකූල වන අවස්ථා.

51. යම් ජීවමාන තැනැත්තකුගේ මතය අනුකූල වන හැම විට ම, එබඳු මතයක් ගොඩ නැඟී ඇති හේතු ද අනුකූල වේ.

නිදර්ශනය

තම මතය ඇතිකර ගැනීම සඳහා තමා විසින් පවත්වන ලද අත්හදා බැලීම ගැන විස්තරයක් විශේෂඥයකු විසින් දිය හැකි ය.

## චරිතය අනුකූල වන අවස්ථා

සිවිල් නඩුවල දී ආරෝපණය කරනු ලැබූ හැසිරීම ඔප්පු කිරීමට චරිතය අනුකූල නොවේ.

52. සැලකිල්ලට භාජන වූ යම් තැනැත්තකු මත ආරෝපනය කරනු ලැබූ යම් හැසිරීමක් එ ලෙස වීමට ඉඩ ඇති හෝ නැති තත්ත්වයකට පමුණුවන අන්දමේ චරිතයක් ඔහුට ඇතැ යි යන කාරණය අන් ආකාරයකින් අනුකූල කරුණු වලින් ප්‍රකාශයට පැමිණෙන ප්‍රමාණයට මිස, නො එසේ ව, සිවිල් නඩු වලදී අනුකූල නොවේ.

**53.** අපරාධ නඩුවල දී චෝදනා ලැබ සිටින තැනැත්තා යහපත් චරිතයකින් යුක්ත වූ බව අනුකූල වේ.

අපරාධ නඩුවලදී පෙර පැවැති යහපත් චරිතය අනුකූල වේ.

**54.** චෝදනා ලැබ සිටින තැනැත්තා යහපත් චරිතයක් ඇති කෙනෙකැ යි සාක්ෂි දී ඇති නම් අනුකූල වනු මිස, නො එසේ ව, අපරාධ නඩුවල දී චෝදනා ලැබ සිටින්නට අයහපත් චරිතයක් ඇතැ යි යන්න අනුකූල නො වේ.

යහපත් චරිතය පිළිබඳ සාක්ෂි දෙනු ලැබේ නම් මිස, නො එසේ පෙර පැවති අයහපත් චරිතය, අනුකූල නොවේ.

පැහැදිලි කිරීම.—යම් කෙනකුට අයහපත් චරිතයක් ඇතැ යි යන්න ම ඉදිරි පත් කරුණක් වන නඩුවලට මේ වගන්තිය අදාළ නො වේ.

පැහැදිළි කිරීම.—එ බඳු නඩුවක දී කලින් වරදකරුවකු වූ බව අයහපත් චරිත යක් ඇතැ යි යන්නට සාක්ෂි වශයෙන් අනුකූල වේ.

**55.** සිවිල් නඩුවල දී යම් තැනැත්තෙකුගේ චරිතයක් තමාට ලැබිය යුතු අලාභ ප්‍රමාණය කෙරෙහි බලපාන පරිදි පැවතීම අනුකූල වේ.

අලාභ කෙරෙහි චරිතය බලපෑම.

පැහැදිලි කිරීම.—52, 53, 54 සහ 55 වෙනි වගන්තිවල සඳහන් "චරිතය" යන වචනයට ප්‍රසිද්ධිය හා සිතේ ස්වභාවය යන දෙක ම ඇතුළත් වේ. එහෙත් 54 වෙනි වගන්තියෙන් සලස්වා ඇති අන්දම් හැරුණු විට සාක්ෂි දිය හැක්කේ සාමාන්‍ය ප්‍රසිද්ධිය සහ සාමාන්‍ය සිතේ ස්වභාවයක් සම්බන්ධයෙන් පමණකි; ප්‍රසිද්ධිය හෝ සිතේ ස්වභාවය දක්වන ලද විශේෂ ක්‍රියාවක් සම්බන්ධයෙන් නො වේ.

## 2 වැනි කාණ්ඩය

## සත්‍ය බැව් ඔප්පු කිරීම

## III වැනි පරිච්ඡේදය

### සත්‍ය බැව් ඔප්පු කිරීම අවශ්‍ය නො වන කරුණු

**56.** අධිකරණය විසින් අධිකරණමය ලෙස සලකනු ලබන කිසි ම කරුණක් ඔප්පු කිරීම අවශ්‍ය නොවේ.

අධිකරණමය ලෙස සලකනු ලබන කරුණක් ඔප්පු කිරීම අවශ්‍ය නොවේ.

**57.** පහත දැක්වෙන කරුණු ගැන අධිකරණය විසින් අධිකරණමය ලෙස සලකා බැලිය යුතු ය :—

අධිකරණය විසින් අධිකරණමය ලෙස සැලකිය යුතු කරුණු.

(1) දිවයිනේ යම් කොටසක දැනට වලංගුව පවත්නා, හෝ මේ දක්වා වලංගු ව පැවතුණු, හෝ මින් මතු වලංගු වන්නා වූ සියලු නීති හෝ නීතියේ බලය ඇති ව්‍යවස්ථා ;

(2) පාර්ලිමේන්තුව මගින් සම්මත වී ඇති, හෝ මින්මතු සම්මත වන්නා වූ සියලුම ප්‍රසිද්ධ පනත් සහ අධිකරණමය ලෙස සැලකිය යුතු ය යි පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලබන සියලු ප්‍රාදේශික හා පුද්ගලික පනත් ;

(3) මහ රජතුමාණන් වහන්සේ නාවික භට හෝ ගුවන් හමුදාවට අවශ්‍ය යුද්ධ සේවා නියෝග;

Scanned with CamScanner

(4) පාර්ලිමේන්තුවේ සහ දිවයිනේ ව්‍යවස්ථාදායක මණ්ඩලයේ ක්‍රියා පිළිවෙල.

පැහැදිලි කිරීම.—2 හා 4 වෙනි උප වගන්තිවල සඳහන් "පාර්ලිමේන්තුව" යන වචනයට—

(අ) මහා බ්‍රිතාන්‍යයේ සහ උතුරු අයර්ලන්තයේ එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුව;

(ආ) මහා බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව;

(ඇ) එංගලන්තයේ පාර්ලිමේන්තුව;

(ඈ) ස්කොට්ලන්තයේ පාර්ලිමේන්තුව; සහ

(ඉ) උතුරු අයර්ලන්තයේ පාර්ලිමේන්තුවට ඇතුළත් වේ.

(5) මහා බ්‍රිතාන්‍යයේ සහ උතුරු අයර්ලන්තයේ එක්සත් රාජධානියේ තත් කාලයෙහි භූපතිගේ රාජපද ප්‍රාප්තිය හා රාජකීය අත්සන;

(6) ඉංග්‍රීසි අධිකරණ මගින් අධිකරණමය ලෙස සලකනු ලබන සියලු මුද්‍රා; දිවයිනේ සියලු ම අධිකරණයන්හි මුද්‍රා; නාවික අධිකරණයන්හි සහ නාවික අධිකරණ බලයේ ද, ප්‍රසිද්ධ නොතාරිස් වරුන්ගේ ද මුද්‍රා; සහ පාර්ලිමේන්තුවෙන් සම්මත වූ යම් පනතක් යටතේ හෝ දිවයිනේ තත් කාලයෙහි වලංගු ව පවත්නා වෙනත් නීතියක් යටතේ පාවිච්චි කිරීමට යම් තැනැත්තෙකුට බලය ඇති සියලු මුද්‍රා;

(7) දිවයිනේ යම් කොටසක යම් රජයේ නිලයක් තත් කාලයෙහි දරන තැනැත්තන් එකී නිලවලට පත් වූ බව ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් නිවේදනය වුවහොත්, එකී නිලවලට පත් වීම, ඔවුන්ගේ නාම, පදවි නාම, කාර්යයන් සහ අත්සන්;

(8) බ්‍රිතාන්‍ය ක්‍රිටය මගින් පිළිගනු ලබන සෑම රාජ්‍යයේ හෝ භූපතිගේ පැවතීම, පදවි නාමය සහ ජාතික කොඩිය;

(9) ස්වභාව ධර්මයාගේ සාමාන්‍ය ක්‍රියා මාර්ගය, ස්වාභාවික ව සහ කෘත්‍රිම ලෙසින් කාලය බෙදා ඇති කොටස්, භූගෝල විද්‍යාව අනු ව ලෝකය බෙදා ඇති විවිධ කොටස්, ඉංග්‍රීසි පදවල අර්ථ සහ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලබන ප්‍රසිද්ධ උත්සව, මංගල්‍ය සහ නිවාඩු දවස්;

(10) බ්‍රිතාන්‍ය ක්‍රිටයේ පාලන බලය යටතේ පවත්නා ප්‍රදේශ;

(11) බ්‍රිතාන්‍ය ක්‍රිටය සහ කිසියම් වෙනත් රාජ්‍යයක් හෝ පුද්ගල යන් සමූහයක් අතරේ විරුද්ධකම් ඇරඹීම, පැවතීම හා කෙළවර වීම;

(12) අධිකරණයේ සාමාජිකවරුන්ගේ සහ නිලධාරීන්ගේ ද, ඔවුන්ගේ නියෝජ්‍ය නිලධාරීන්ගේ හා යටත් නිලධාරීන්ගේ ද, සහකාර නිලධාරීන්ගේ ද, එහි කැඳවීම් නියෝග ක්‍රියාවේ යොදවන සියලු නිලධාරීන්ගේ ද, සියලු අධිනීතිඥවරුන්ගේ ද, නීතිඥවරුන්ගේ ද, අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට හෝ ක්‍රියා කිරීමට නීති මගින් බලය ලත් වෙනත් තැනැත්තන්ගේ ද නම්;

Scanned with CamScanner

(13) ගොඩ බිමෙහි සෝ මුහුදෙහි මාර්ග නීතිය ;

(14) පනවන ලද යම් නීතියක් මගින් සලකා බැලිය යුතු ලෙස නියම කරනු ලබන අන් සියලු කරුණු.

මේ සියලු අවස්ථාවන් හි දී, මෙන් ම ජනතාවගේ ඉතිහාසයට, සාහිත්‍යයට, විද්‍යාවට හෝ කලාවට අදාළ සියලු කරුණුවල දී සහාය ලබා ගැන්ම සඳහා සුදුසු පොත් හෝ ලේඛන කියවා බැලීමට අධිකරණයට හැකි ය.

යම් කරුණක් අධිකරණමය ලෙස සලකා බලන ලෙස යම් කෙනෙකු විසින් අධිකරණයෙන් ඉල්ලීමක් කරනු ලැබේ නම්, එසේ කිරීමට හැකි වන පරිදි අවශ්‍ය යයි අධිකරණය විසින් සලකනු ලැබිය හැකි යම් පොතක් හෝ ලේඛනයක් එබඳු තැනැත්තකු ඉදිරිපත් කළොත් මිස සහ ඉදිරිපත් කරන තුරු එම ඉල්ලීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

58. නඩු විභාගයේ දී ඒත්තු ගැනීමට යම් නඩුවක පාර්ශ්වකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතවරුන් එකඟ වන්නා වූ, හෝ තමන්ගේ අත් අකුරින් ලියන ලද ලියවිල්ලකින් නඩු විභාගයට පෙර ඒත්තු ගැනීමට ඔවුන් එකඟ වන්නා වූ, හෝ ඒවකට වලංගු ව පවත්නා උත්තර වාද දීමේ යම් නීතියක් අනුව ස්වකීය උත්තර වාදවලින් ඔවුන් විසින් පිළිගනු ලැබී යයි සලකනු ලබන්නා වූ, කිසි කරුණක් කිසි නඩුවක දී සත්‍ය බැව් ඔප්පු කිරීම අවශ්‍ය නො වේ.

ඒත්තු ගත් කරුණු සත්‍ය බැව් ඔප්පු කිරීමට අවශ්‍ය නොවේ.

එසේ වුව ද, ඒත්තු ගන්නා ලද කරුණු එබඳු ඒත්තු ගැනීම්වලින් හැර අන් අයුරින් ඔප්පු කළ යුතු ය යි අධිකරණය විසින් තම අභිමතය පරිදි ඉල්විය හැකි ය.

## IV වැනි පරිච්ඡේදය

### කථිත සාක්ෂි

59. ලේඛනවල අඩංගු කරුණු හැර, අන් සියලු කරුණු කථිත සාක්ෂිවලින් සත්‍ය බැව් ඔප්පු කළ හැකි ය.

කථිතසාක්ෂිවලින් කරුණු සත්‍ය බැව් ඔප්පු කළ හැකිය.

60. සියලු අවස්ථාවන් හි කථිත සාක්ෂි ප්‍රත්‍යක්ෂව තිබිය යුතු යි. එහි අදහස මෙසේ ය:—

කථිත සාක්ෂි ප්‍රත්‍යක්ෂ සාක්ෂි විය යුතුයි.

(1) දැක ගතහැකි කරුණකට සම්බන්ධ සාක්ෂියක් නම්, එය, එකී කරුණ තමා දුටු බැව් පවසන සාක්ෂිකරුවකුගේ සාක්ෂි විය යුතුයි ;

(2) ඇසිය හැකි කරුණකට සම්බන්ධ සාක්ෂියක් නම්, එය, එකී කරුණ තමා ඇසූ බැව් පවසන සාක්ෂිකරුවකුගේ සාක්ෂි විය යුතු යි ;

(3) යම්කිසි වෙනත් ඉන්ද්‍රියකට ගෝචර විය හැකි හෝ අන් කිසි ආකාරයකින් දැනගත හැකි කරුණකට සම්බන්ධ සාක්ෂියක් නම් එය එකී ඉන්ද්‍රියේ ආධාරයෙන් හෝ එකී ආකාරයෙන් එම කරුණ තමා දැන ගත් බැව් පවසන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විය යුතුයි ;



Scanned with CamScanner

(4) යම් මතයකට හෝ එම මතය දැරීමට ඇති හේතුවලට සම්බන්ධ සාක්ෂියක් නම්, එය එකී හේතු නිසා එම මතය දරන තැනැත්තකුගේ සාක්ෂි විය යුතු යි.

එසේ වුව ද, වෙළඳාම පිණිස පොදුවේ ඉදිරිපත් කොට ඇති යම් රචනාවක සඳහන් විශේෂඥ මත සහ එබඳු මත දරනු ලැබීමට ඇති හේතු ද, එකී රචනාවල කර්තෘ මිය ගොස් නම් හෝ සොයා ගත නොහැකි නම්, හෝ සාක්ෂි දීමට අපොහොසත් තත්ත්වයකට පැමිණ සිටි නම්, හෝ යුක්ති සහගත නොවේ යයි අධිකරණය කල්පනා කරන්නාවූ ප්‍රමාදයක් හෝ වියදමක් නොමැතිව සාක්ෂිකරුවකු වශයෙන් ඔහු කැඳවාගත නොහැකි නම්, එබඳු රචනා ඉදිරිපත් කිරීමෙන් සත්‍ය බැව් ඔප්පු කළ හැකි ය.

තවද එසේ වුව ද, ලේඛනයක් හැර අන් කිසි භෞතික ද්‍රව්‍යයක පැවැත්මට හෝ තත්ත්වයට කථිත සාක්ෂි සම්බන්ධ වේ නම්, අධිකරණය සුදුසු ය යි සලකතොත්, එබඳු භෞතික ද්‍රව්‍යයක් පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින් ඉල්ලා සිටිය හැකි ය.

## V වැනි පරිච්ඡේදය

### ලේඛනගත සාක්ෂි

ලේඛනවල අන්තර්ගත කරුණු සත්‍ය බැව් ඔප්පු කිරීම.

61. ලේඛනවල අන්තර්ගත කරුණු ප්‍රාථමික සාක්ෂිවලින් හෝ ද්විතියික සාක්ෂිවලින් සත්‍ය බැව් ඔප්පු කළ හැකි ය.

ප්‍රාථමික සාක්ෂි.

62. අධිකරණයේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනයේ ම ප්‍රාථමික සාක්ෂි යන්නෙන් අදහස් වේ.

පැහැදිලි කිරීම.—1. කොටස් කිපයක් සහිත ව යම් ලේඛනයක් ලියා අත්සන් කරනු ලැබූ කල, එක් එක් කොටසක් ලේඛනය සම්බන්ධ ප්‍රාථමික සාක්ෂි වේ.

පූරණයකින් යුක්තකොට යම් ලේඛනයක් ලියා අත්සන් කරනු ලැබූ විට එක් එක් පූරණය එක පාර්ශ්වකරුවකු විසින් හෝ ඇතැම් පාර්ශ්වකරුවන් විසින් පමණක් ලියා අත්සන් කරනු ලැබී නම්, එක් එක් පූර්ණය එය ලියා අත්සන් කරන පාර්ශ්වකරුවනට විරුද්ධ ප්‍රාථමික සාක්ෂි වේ.

පැහැදිලි කිරීම.—2. මුද්‍රණ ශිල්පයෙන්, "ලිතෝග්‍රාෆ්" කිරීමෙන්, හෝ ඡායාරූප ශිල්පයෙන් මෙන් ඒකාකාර ක්‍රියා පිළිවෙලකින් ලේඛන ගණනාවක් සකස් කරනු ලැබූ කල එක් එක් ලේඛනය ඉතිරි සියල්ලෙහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් ප්‍රාථමික සාක්ෂි වේ. එහෙත් එකී ලේඛන සියල්ල එකම පොදු මූලික ලේඛනය පිටපත් වූකල, ඒවා මූලික ලේඛනයෙහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් ප්‍රාථමික සාක්ෂි නො වේ.

නිදර්ශන

එක ම මුල් පිටපතකින් එකම වේලාවකදී මුද්‍රණය කරන ලද දැන්වීම් පත්‍ර ගණනාවක් යම් තැනැත්තකුගේ ස්වාමිත්වයෙහි තිබුණේ යයි පෙන්වා දී ඇත. දැන්වීම් පත්‍ර අතුරෙන් ඕනෑ ම එකක් අනෙක් දැන්වීම් පත්‍රයෙක අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් ප්‍රාථමික සාක්ෂි වන නමුදු ඒවා අතුරෙන් කිසිවක් මුල් පිටපතෙහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් ප්‍රාථමික සාක්ෂි නො වේ.

63. ද්විතීය සාක්ෂි යනුවෙන් අදහස් කරනු ලබන්නේ හා ඊට ඇතුළත් වන්නේ— *ද්විතීයික සාක්ෂි*

(1) මෙහි පහත සඳහන් විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන සහතික කළ පිටපත් ;

(2) පිටපතේ නිවැරදි බව එපමණින් ම සුරැකෙන යාන්ත්‍රික ක්‍රම අනු ව පිටපතෙන් සකස් කරන ලද පිටපත් සහ එබඳු පිටපත් හා සමග සසඳනු ලැබූ පිටපත් ;

(3) මුල් පිටපතෙන් සකස් කර ගන්නා ලද හෝ මුල් පිටපත හා සමග සසඳනු ලැබූ පිටපත් ;

(4) ලේඛන ලියා අත්සන් නො කළ පාර්ශ්වකරුවන්ට විරුද්ධ ව ලේඛනවල පූරණ ; හා

(5) ලේඛනයක් සියැසින් දුටු කෙනකු විසින් එහි අන්තර්ගත කරුණු පිළිබඳ කරනු ලබන කථිත විස්තර ය.

නිදර්ශන

(අ) ඡායාරූපය ගන්නා ලද දෙය මුල් පිටපත බැව් ඔප්පු කරනු ලැබේ නම්, එකිනෙක සමග සැසඳීමක් සිදු නො වුව ද මුල් පිටපතක ඡායාරූපයක් එහි අන්තර්ගත කරුණු සම්බන්ධ ද්විතීයික සාක්ෂි වේ.

(ආ) පිටපත් යන්ත්‍රයේ ආධාරයෙන් සකස් කර ගන්නා ලද පිටපත මුල් පිටපතෙන් ගන්නා ලද්දක් බැව් පෙන්නුම් කරනු ලැබේ නම්, පිටපත් යන්ත්‍රයෙන් සකස් කර ගන්නා ලද ලියුම් පිටපතක් හා සමග සසඳනු ලැබූ පිටපතක් ලියුමේ අන්තර්ගත කරුණු සම්බන්ධ ද්විතීයික සාක්ෂි වේ.

(ඇ) පිටපතකින් අත් අකුරෙන් පිටපත් කර ගනු ලැබ, එහෙත් පසු ව මුල් පිටපත හා සමග සසඳනු ලැබූ පිටපතක් ද්විතීයික සාක්ෂි වේ. එහෙත් අත් අකුරෙන් පිටපත් කර ගනු ලැබුවේ යම් පිටපතකින් ද, එය මුල් පිටපත හා සමග සසඳන ලද වුවත් එ ලෙස සසඳනු නොලැබූ පිටපත මුල් පිටපත සම්බන්ධ ද්විතීයික සාක්ෂි නො වේ.

(ඈ) මුල් පිටපත හා සමග සසඳන ලද පිටපතක කථිත විස්තරයක් හෝ මුල් පිටපත හා සමග සසඳන ලද වුවත් එලෙස සසඳනු නොලැබූ පිටපත මුල් පිටපතේ ඡායාරූපයක හෝ යන්ත්‍ර පිටපතක කථිත විස්තරයක් මුල් පිටපත සම්බන්ධ ද්විතීයික සාක්ෂි නො වේ.

64. මෙහි පහත සඳහන් කරනු ලබන අවස්ථාවන්හි දී හැරුණු විට, ලේඛන ප්‍රාථමික සාක්ෂිවලින් සත්‍ය බැව් ඔප්පු කළ යුතු ය. *ප්‍රාථමික සාක්ෂි වලින් ලේඛන සත්‍ය බැව් ඔප්පු කිරීම.*

65. පහත දක්වෙන අවස්ථාවන්හි ලේඛනයක පැවැත්ම, තත්ත්වය හෝ අන්තර්ගත කරුණු පිළිබඳ ද්විතීයික සාක්ෂි දිය හැකි ය :— *ලේඛනවලට අදාළ වන ද්විතීයික සාක්ෂි ඉදිරිපත් කළ හැකි අවස්ථා.*

(1) ලේඛනය යමකුට විරුද්ධ ව ඔප්පු කිරීමට බලාපොරොත්තු වනු ලැබේ ද එම තැනැත්තාගේ, හෝ

(ii) අධිකරණයේ කෑදවීම් නියෝගයක් බල පවත්වන ප්‍රදේශයෙන් පිට සිටින හෝ එවැන්නකට යටත් නොවන යම් තැනැත්තකුගේ.

(iii) මුල් පිටපත ඉදිරිපත් කරන ලෙස නීත්‍යානුකූල ව බැඳී සිටින යම් තැනැත්තෙකුගේ

ස්වාමිත්වයේ හෝ බලයේ මුල් පිටපත තිබේ යයි පෙන්වා දුන් කල හෝ පෙනෙන කල.

සහ 66 වෙනි වගන්තියෙහි සඳහන් දැන්වීමෙන් පසු ව එබඳු තැනැත්තකු එය ඉදිරිපත් නො කරන කල

(2) ලේඛනය යමකුට විරුද්ධව ඔප්පු කිරීමට බලාපොරොත්තු වනු ලැබේ ද, මුල් පිටපතේ පැවැත්ම, තත්ත්වය හෝ අන්තර්ගත කරුණු එකී තැනැත්තා විසින් හෝ ඔහු ගේ සම්බන්ධතාව නියෝජනය කරන තැනැත්තා විසින් ලියවිල්ලකින් ඒත්තු ගත් බැව් ඔප්පු වී ඇති කල;

(3) මුල් පිටපත විනාශ කරනු ලැබූ කල හෝ නැති වී ඇති කල, හෝ එහි අන්තර්ගත කරුණු පිළිබඳ සාක්ෂි දීමට ඉදිරිපත් වන තැනැත්තාට, වැරදීමෙන් හෝ නොසැලකිල්ලෙන් උද්ගත නොවන අන් කිසි හේතුවක් නිසා එය සෑහෙන කාලයකදී ඉදිරිපත් කිරීමට නුපුළුවන් කල;

(4) මුල් පිටපත පහසුවෙන් සෙලවිය නො හැකි අන් දමේ ස්වභාවයකින් යුක්ත වන කල;

(5) මුල් පිටපත, 74 වෙනි වගන්තියේ අර්ථය ඇතුළත, ප්‍රසිද්ධ ලේඛනයක් වන කල;

(6) මුල් පිටපත, සහතික කළ පිටපතක් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබීමට මේ ආඥපනත මගින් හෝ මේ දිවයිනේ වලංගු අන් කිසි නීතියක් මගින් අවසර දෙනු ලැබෙන ලේඛනයක් වන කල;

(7) මුල් පිටපත්, අධිකරණයේ දී පහසුවෙන් පරීක්ෂා කළ නො හැකි නොයෙක් විස්තරවලින් හෝ වෙනත් ලේඛනවලින් යුක්ත වන කල, සහ ඔප්පු කළ යුතු කරුණු සම්පූර්ණ ලිපි ලේඛන රාශියේ ම ප්‍රතිඵලය වන කල,

අංක (1), (3), හා (4) දරන අවස්ථාවලදී ලේඛනයේ අන්තර්ගත කරුණු පිළිබඳ යම් ද්විතීයික සාක්ෂියක් බාර ගත හැකි ය.

අංක (2) දරන අවස්ථාවේ දී ලිඛිත ඒත්තු ගැනීම බාර ගත හැකි ය.

Scanned with CamScanner

අංක (5) හෝ (6) දරන අවස්ථාවේ දී ලේඛනයෙහි සහතික කළ පිටපතක් මිස අන් කවර ආකාරයක වුවත් ද්විතීයික සාක්ෂි භාර ගත නොහැකි ය.

අංක (7) දරන අවස්ථාවේ දී ලේඛනයේ සාමාන්‍ය ප්‍රතිඵලය සම්බන්ධයෙන් ඒවා පරීක්ෂා කළා වූ ද, එබඳු ලේඛන පරීක්ෂා කිරීමේ නිපුණත්වයක් ඇත්තා වූ ද. යම් තැනැත්තකු විසින් සාක්ෂි දිය හැකි ය.

ඉදිරිපත් කරන ලෙස දැන්වීම යැවීමේ වාවස්ථා.

66. 65 වෙනි වගන්තියේ (i) වෙනි උප වගන්තියෙහි සඳහන් ලේඛනවල අන්තර්ගත කරුණු පිළිබඳ ද්විතීයික සාක්ෂි, එබඳු ද්විතීයික සාක්ෂි දීමට අදහස් කරන පාර්ශ්වය, ලේඛනය ඉදිරිපත් කිරීමට නීති මගින් නියමිත දැන්වීම ලේඛනය තම ස්වාමිත්වයේ හෝ තම බලයේ ඇති පාර්ශ්වයට හෝ ඔහුගේ නීතිඥවරයාට කල් ඇති ව නිකුත් කර ඇති නම් මිස හෝ නීති මගින් කිසි ම දැන්වීමක් නියම කර නැති නම් හා, නඩුවේ කරුණු යෙදී ඇති අන්දමට යුක්ති සහගත ය යි අධිකරණය සලකන පරිදි, එබඳු දැන්වීමක් කර ඇති නම් මිස, නො එ සේ ව, දිය යුතු නො වේ.

එ සේ වුව ද. පහත දැක්වෙන ඕනෑ ම නඩුවක දී ද්විතීයික සාක්ෂි අත්හැරීම සුදුසු යයි අධිකරණය කල්පනා කරන අන් කිසි නඩුවක දී ද්විතීයික සාක්ෂි බාර ගත හැකි තත්ත්වයට පමුණුවාලීම සඳහා එ බඳු දැන්වීමක් අවශ්‍ය නො විය යුතු ය:—

(1) සත්‍ය බැව් ඔප්පු කිරීමට ඇති ලේඛනය ම දැන්වීමක් වන කල;

(2) නඩුවේ ස්වභාවය අනුව, එය තමා විසින් ඉදිරිපත් කරන ලෙස ඉල්වනු ඇතැ යි විරුද්ධ පක්ෂය දැන සිටිය යුතු කල;

(3) වංචාවෙන් හෝ බලයෙන් විරුද්ධ පක්ෂය මුල් පිටපත තම ස්වාමිත්වයට ගෙන ඇති බැව් පෙනෙන කල හෝ ඔප්පු වන කල,

(4) විරුද්ධ පාර්ශ්වකරු හෝ ඔහුගේ නියෝජිතයා මුල් පිටපත අධිකරණයෙහි තබාගෙන සිටින කල,

(5) විරුද්ධ පාර්ශ්වකරු හෝ ඔහුගේ නියෝජිතයා ලේඛනය නැති වූ බැව් ඒත්තු ගෙන ඇති කල,

(6) ලේඛනය ස්වාමිත්වයට ගෙන සිටින තැනැත්තා අධිකරණයේ කැඳවීම් නියෝගය බල පවත්වන ප්‍රදේශයෙන් පිට සිටින කල හෝ එවැන්නකට යටත් නොවන කල.

*ඉදිරිපත් නොකොට ඇති ලේඛනය අත්සන් කරන ලදයි හෝ ලියන ලදයි කියන තැනැත්තාගේ අත්සන හා අත් අකුරු සත්‍ය බැව් ඔප්පු කිරීම.*

**67.** යම් ලේඛනයක් යම් කෙනෙකු විසින් අත්සන් කරන ලදැයි හෝ සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් ලියන ලදැයි කියනු ලැබේ නම්, ලේඛනයේ එකී තැනැත්තාගේ අත් අකුරින් ලියැවී ඇතැයි කියනු ලබන ප්‍රමාණය හා අත්සන ඔහුගේ අත් අකුරින් ලියැවී ඇතැයි සත්‍ය බැව් ඔප්පු කළ යුතු වේ.

*සහතික කිරීම නීති මගින් අවශ්‍ය ලේඛනයක් ලියා අත්සන් කරන ලද බව සත්‍ය බැව් ඔප්පු කිරීම.*

**68.** යම් ලේඛනයක් සහතික කිරීම නීති මගින් අවශ්‍ය වුව හොත් අධිකරණයේ කැඳවීම් නියෝගයකට යටත් වන්නා වූ ද සාක්ෂි දීමට පුළුවන් වූ ද සහතික කරන සාක්ෂිකරුවෙක් ජීවත්ව සිටී නම්, එය ලියා අත්සන් කරන ලද බව සත්‍ය බැව් ඔප්පු කිරීම සඳහා යටත් පිරිසෙයින් සහතික කරන එක සාක්ෂිකරුවකු කැඳවනු ලබන තෙක් එම ලේඛනය සාක්ෂි වශයෙන් පාවිච්චි කළ යුතු නොවේ.

*සහතික කරන සාක්ෂිකරුවකු සොයාගත නොහැකි වූ විට සත්‍ය බැව් ඔප්පු කිරීම.*

**69.** එබඳු සහතික කරන සාක්ෂිකරුවකු සොයා ගත නො හැකි නම්, හෝ ලේඛනය මහා බ්‍රිතාන්‍යයේ සහ උතුරු අයර්ලන්තයේ එක්සත් රාජධානියෙහි දී ලියා අත්සන් කරනු ලැබී ය යි අදහස් වේ නම්, යටත් පිරිසෙයින් සහතික කරන එක සාක්ෂිකරුවකුගේ වත් සහතික කිරීම ඔහුගේ අත් අකුරින් ඇතැයිද, ලේඛනය ලියා අත්සන් කරන ලද තැනැත්තාගේ අත්සන ඔහුගේම අත් අකුරින් ඇතැයි ද, යන වග සත්‍ය බැව් ඔප්පු කළ යුතු ය.

*සහතික කරන ලද ලේඛනයක් තමා ලියා අත්සන කළ බැව් පාර්ශ්වකරුවකු විසින් ඒත්තු ගැනීම.*

**70.** සහතික කරන ලද ලේඛනයක් තමා ලියා අත්සන් කළ බැව් පාර්ශ්වකරුවකු විසින් ඒත්තු ගැනීම, එය සහතික කළ යුතුය යි නීති මගින් අවශ්‍ය ව ඇති නමුදු එය ලියා අත්සන් කරන ලද බව ඔහුට විරුද්ධව සෑහෙන සාධක විය යුතු ය.

*ලේඛනය ලියා අත්සන් කරන ලද බැව් සහතික කරන සාක්ෂිකරු නො පිළිගන්නා කල, එය සත්‍ය බැව් ඔප්පු කිරීම.*

**71.** සහතික කරන සාක්ෂිකරු ලේඛනය ලියා අත්සන කරන ලද බැව් නො පිළිගන්නේ නම් හෝ සිහිපත් නො කරන්නේ නම්, එය ලියා අත්සන් කරන ලද බව වෙනත් සාක්ෂිවලින් සත්‍ය බැව් ඔප්පු කළ හැකි ය.

*සහතික කිරීම නීති මගින් අවශ්‍ය නොවන ලේඛනයක් සත්‍ය බැව් ඔප්පු කිරීම.*

**72.** සහතික කිරීම නීති මගින් අවශ්‍ය නො වන කල, සහතික කරන ලද ලේඛනයක් සහතික නො කරන ලද්දක් මෙන් සලකා සත්‍ය බැව් ඔප්පු කළ හැකි ය.

*අත් අකුරු සංසන්දනය කිරීම.*

**73.** (1) අත්සනක්, ලිපියක් හෝ මුද්‍රාවක්, එය ලියන ලදැයි හෝ සකස් කරන ලදැයි අදහස් කරනු ලබන තැනැත්තාගේ ද යනු නිශ්චය කර ගැනීම සඳහා එකී තැනැත්තා විසින් ලියන ලද්දේ ය යි හෝ සකස් කරන ලද්දේ ය යි අධිකරණයට සතුටු විය හැකි පරිදි ඒත්තු ගන්නා ලද හෝ ඔප්පු කරන ලද යම් අත්සනක්, ලිපියක් හෝ මුද්‍රාවක් ඔප්පු කිරීමට තිබෙන්නක් සමග එය අන් කිසි කරුණක් සඳහා ඉදිරිපත් කරනු නො ලැබුව ද හෝ ඔප්පු කරනු නො ලැබුව ද සැසඳිය හැකි ය.

Scanned with CamScanner

(2) අධිකරණයෙහි පෙනී සිටින යම් තැනැත්තෙකුට එබඳු තැනැත්තකු විසින් ලියන ලද යි සලකනු ලබන යම් අකුරු හෝ ඉලක්කම් සමග සැසඳීමට අධිකරණයට හැකි වන පරිද්දෙන් යම් අකුරු හෝ ඉලක්කම් ලියන ලෙස අධිකරණය විසින් නියම කළ හැකි ය.

(3) මේ වගන්තිය, යම් අවශ්‍ය සුළු වෙනස් කිරීම් සහිත ව, ඇඟිලි සටහන්, ඇතුල් සටහන් සහ පතුල් සටහන්වලට ද අදාළ වේ.

## ප්‍රසිද්ධ ලේඛන

**ප්‍රසිද්ධ ලේඛන.**

74. පහත දැක්වෙන ලේඛන ප්‍රසිද්ධ ලේඛන වේ:—

(i) පරම බලධාරියාණන්ගේ ද;

(ii) නිල මණ්ඩලවල සහ විනිශ්චය සභාවල ද;

(iii) මේ දිවයිනේ හෝ මහාරාජෝත්තමයාණන් වහන්සේගේ ඩොමිනියන්හී අන් කිසි කොටසක හෝ විදේශීය රටක ව්‍යවස්ථාදායක, අධිකරණ සහ විධායක රජයේ නිලධාරීන්ගේ ද;

(අ) පනත් හෝ පනත්වල වාර්තාවන්ගෙන් යුත් ලේඛන;

(ආ) දිවයිනේ තබා ඇති පුද්ගලික ලේඛනවල ප්‍රසිද්ධ වාර්තා;

(ඇ) මිනුම්පති හෝ ඔහු වෙනුවට ක්‍රියා කරන නිලධාරියකු විසින් අත්සන් කරන ලදැයි අදහස් කරනු ලබන සැලැස්මවල්, මිනුම් සටහන් හෝ සිතියම්.

**පුද්ගලික ලේඛන.**

75. අන් සියලු ලේඛන පුද්ගලික ලේඛන වේ.

**ප්‍රසිද්ධ ලේඛන යන් හි සහතික කරන ලද පිටපත්.**

76. පරීක්ෂා කිරීම සඳහා යම් කෙනෙකුට අයිතිවාසිකමක් හිමි ප්‍රසිද්ධ ලේඛනයක භාරකාරත්වය ඇති රජයේ සෑම නිලධාරියකු ම, එ බඳු කෙනකු ඒ සඳහා නියමිත නීත්‍යනුකූල ගාස්තු ගෙවා ඉල්වූ විටෙක, ඉන් පිටපතක්, එය එ බඳු ලේඛනයක හෝ එහි කොටසක සත්‍ය පිටපතක් ය යන්න අවස්ථාවේ හැටියට එ බඳු පිටපතක පහ තින් සඳහන් කොට, එකී තැනැත්තාට දියයුතුය; එ බඳු නිලධාරි යකු විසින් එ බඳු සහතිකයක්, දිනය යොදා තමාගේ නම සහ නිල නාමය සඳහන් කිරීමෙන් අනුමත කළ යුතු ය. තවද, මුද්‍රාවකින් ප්‍රයෝජන ගැනීමට එ බඳු නිලධාරියකුට නීතියෙන් බලය ලැබෙන හැම විටෙක ම, එහි මුද්‍රා තැබිය යුතු ය. එ ලෙස සහතික කරනු ලබන එ බඳු පිටපත් සහතික කරන ලද පිටපත් යැයි හැඳින්විය යුතු ය.

පැහැදිලි කිරීම.—ස්වකීය නිල කටයුතු වල සාමාන්‍යය ක්‍රියා මාර්ගය අනුව එබඳු පිටපත් භාර දීමට බලය ලත් යම් නිලධාරියකුට මේ වගන්තියේ අර්ථය ඇතුළත එබඳු ලේඛනවල භාරකාරත්වය ඇතැයි සැළකිය යුතුය.

**සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කිරීමෙන් ලේඛන ඔප්පු කිරීම.**

77. ප්‍රසිද්ධ ලේඛනවල හෝ ප්‍රසිද්ධ ලේඛන කොටස්වල පිටපත් ය යි අදහස් කරනු ලැබෙන එ බඳු සහතික කරන ලද පිටපත් එම ප්‍රසිද්ධ ලේඛනවල හෝ ප්‍රසිද්ධ ලේඛන කොටස්වල ඇතුළත් කරුණු සත්‍ය බැව් ඔප්පු කිරීම සඳහා ඉදිරිපත් කළ හැකිය.

Scanned with CamScanner

මෙතෙක් රාජ්‍ය ලේඛන සත්‍ය බැව් ඔප්පු කිරීම.

**78.** පහත සඳහන් ප්‍රසිද්ධ ලේඛන පහත දක්වෙන පරිදි සත්‍ය බැව් ඔප්පු කළ හැකිය :—

(1) දිවයිනේ ආණ්ඩුවේ හෝ එහි යම් දෙපාර්තුමේන්තුවක පනත්, ආඥා හෝ නිවේදන—

(i) පිළිවෙළින් එකී දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් හෝ ස්ථිර ලේකම් හෝ නියෝජ්‍ය හෝ සහකාර ස්ථිර ලේකම් කෙනකු විසින් සහතික කරනු ලැබූ එම දෙපාර්තමේන්තු වල සටහන් මගින් ;

(ii) ආණ්ඩුවේ ආඥාව අනු ව මුද්‍රණය වී ඇතැ යි අදහස් කරනු ලබන යම් ලේඛනයකින්.

(2) ව්‍යවස්ථාදායක මණ්ඩලයේ කටයුතු –

(i) ඒ මණ්ඩලයේ වාර්තාවලින්, හෝ

(ii) පළ කරන ලද ආඥාපනත්වලින් හෝ ඒවායින් උපුටා ගත් කොටස්වලින්, හෝ

(iii) ආණ්ඩුවේ ආඥාව අනුව මුද්‍රණය වී ඇතැ යි අදහස් කරනු ලබන යම් ලේඛනයකින්.

(3) අතිශ්‍රේෂ්ඨතම මහාරාජෝත්තමයාණන් වහන්සේ විසින් හෝ රාජාධිකරණය විසින් හෝ අතිශ්‍රේෂ්ඨතම මහාරාජෝත්තමයාණන් වහන්සේගේ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් විසින් නිකුත් කරනු ලබන රාජ ප්‍රකාශ, ආඥා හෝ නියෝග—

ලන්ඩන් ගැසට් පත්‍රයෙහි හෝ දිවයිනේ පළවන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ඇතුළත් වන්නා වූ හෝ රාජකීය මුද්‍රණ කරු විසින් මුද්‍රණය කොට ඇතැ යි අදහස් කරනු ලබන්නා වූ පිටපත් හෝ උපුටා ගත් කොටස් මගින්.

(4) විදේශ රටක විධායක මණ්ඩලයේ පනත් හෝ ව්‍යවස්ථාද යක මණ්ඩලයේ වාර්තා—

(i) එකී මණ්ඩලවල බලය පිට පළ කරනු ලබන්නා වූ හෝ එම රටෙහි පොදුවේ එ පරිද්දෙන් පිළිගනු ලබන්නා වූ සංග්‍රහ වලින්, හෝ

(ii) රටේ හෝ පරම බලධාරියාණන්ගේ මුද්‍රාව තැබීමෙන් සහතික කරනු ලබන පිටපතකින්, හෝ

(iii) දිවයිනේ යම් ප්‍රසිද්ධ ආඥාපනතක ඒ සම්බන්ධයෙන් කරනු ලබන පිළිගැනීමකින්.

(5) දිවයිනේ නාගරික මණ්ඩලයක වාර්තා—

(i) එහි නීත්‍යානුකූල භාරකරු විසින් සහතික කරන ලද එබඳු වාර්තා පිටපතකින්, හෝ

(ii) එබඳු මණ්ඩලයක බලය පිට පළ වී ය යි අදහස් කරනු ලබන මුද්‍රිත පොතකින්.

(6) විදේශ රටක් ඇති වෙන යම් ගණයකට අයත් ප්‍රසිද්ධ ලේඛන—

(i) මුල් පිටපතෙන්, හෝ

(ii) මුල් පිටපතේ නීත්‍යනුකූල භාරකාරීත්වය හිමි නිලධාරී තැන විසින් විදේශ රටේ වලංගු නීතිය අනුව ලේඛනයේ ස්වරූපය ඔප්පු වීමෙන් පිටපත නිසි පරිදි සහතික කරනු ලැබී ඇතැ යි ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුගේ හෝ බ්‍රිතාන්‍ය තානාපතිවරයකුගේ හෝ තානාපති සේවයට අයත් නියෝජිතයකුගේ මුද්‍රාව තැබීමෙන් කරන ලද සහතිකයක් සහිත ව නීත්‍යනුකූල භාරකරු විසින් සහතික කරනු ලැබූ පිටපතකින්.

## ලේඛන සම්බන්ධ පූර්ව නිගමන

79. (1) යම් විශේෂ කරුණක් සම්බන්ධ සාක්ෂියක් වශයෙන් භාර ගත හැකි ය යි නීතියෙන් ප්‍රකාශිත සහතික පත්‍රයක් හෝ සහතික කරන ලද පිටපතක් හෝ වෙනත් ලේඛනයක් ලෙස අදහස් කරනු ලබන්නා වූ ද, දිවයිනේ යම් නිලධාරියකු විසින් නිසිපරිදි සහතික කරන ලද්දේ ය යි අදහස් කරනු ලබන්නා වූ ද හැම ලේඛනයක් ම නිර්ව්‍යාජ බව අධිකරණය විසින් පූර්ව නිගමනය කළ යුතු ය. සහතික කරන ලද පිටපත්වල නිර්ව්‍යාජත්වය සම්බන්ධ පූර්ව නිගමනය

එසේ විය හැක්කේ එ බඳු ලේඛනයක් ඒ සම්බන්ධයෙන් නීති මගින් නියෝග කරන ලද ස්වරූපයෙන් හා බෙහෙවින් එ ලෙස ලියා අත්සන් කර ඇතැයි අදහස් කරනු ලැබෙන ආකාරයෙන් පැවතුණ හොත් ය.

(2) එ බඳු ලේඛනයක් යම් නිලධාරියකු විසින් අත්සන් කරන ලදැයි හෝ සහතික කරන ලදැයි අදහස් කරන විට එ බඳු ලේඛනයක් මගින් ඔහුට ඇතැ යි කියන නිල තත්ත්වය, එය අත්සන් කරද්දී, ඔහු දැරූ බව අධිකරණය පූර්ව නිගමනය කළ යුතු ය.

80. අධිකරණ කටයුත්තක දී හෝ එබඳු සාක්ෂි ගැනීමට නීතියෙන් බලය ලත් යම් නිලධරයකු ඉදිරිපිට දී සාක්ෂිකරුවකු විසින් දෙනු ලබන සාක්ෂියේ හෝ සාක්ෂියේ යම් කොටසක වාර්තාවක් හෝ සත්දේශයක් යයි, හෝ යම් සිරකරුවකු විසින් හෝ චෝදනා ලැබ සිටින තැනැත්තකු විසින් කරන ලදුව නීතියට අනුව සටහන් කර ගන්නා ලද ප්‍රකාශයක් හෝ වරද කියා පෑමක් යයි හා යම් විනිශ්චයකරුවකු විසින් හෝ සුළු අපරාධ විනිශ්චයකරුවකු විසින් හෝ ඉහත සඳහන් අන්දමේ එ බඳු යම් නිලධරයකු විසින් අත්සන් කරන ලද්දේ ය යි අදහස්කරනු ලබන යම් ලේඛනයක්, යම් අධිකරණයක් ඉදිරියේ ඉදිරිපත් කෙරෙන කවර විටෙක වුව ද, සාක්ෂි වාර්තාව ඉදිරිපත් කිරීමෙන් ඇති කරගතයුතු පූර්ව නිගමනය

(1) ලේඛනය නිර්ව්‍යාජ බව,

(2) එය සටහන් කරනු ලැබූ විට පැවති තත්ත්වයන් පිළිබඳව එය අත්සන් කළ තැනැත්තාන් විසින් කරන ලද්දේ ය යි අදහස් කරනු ලබන යම් ප්‍රකාශ ඇතොත්, ඒවා සත්‍ය බව, සහ

(3) ඒ සාක්ෂිය, ප්‍රකාශය හෝ වරද කියාපෑම නිසි පරිදි සටහන් කරනු ලැබූ බව,

අධිකරණය විසින් පූර්ව නිගමනය කළ යුතු ය.

ගැසට් පත්‍ර සම්බන්ධ පූර්ව නිගමනය.

81. ලන්ඩන් ගැසට් පත්‍රය හෝ දිවයිනෙහි හෝ බ්‍රිතාන්‍ය ක්‍රීටයේ යටත් විජිතයක, ඩොමිනියන් රාජ්‍යයක, යටත් රාජ්‍යයක හෝ අයත් රාජ්‍යයක ගැසට් පත්‍රය ය යි හෝ එබඳු යටත් විජිතයක, ඩොමිනියන් රාජ්‍යයක, යටත් රාජ්‍යයක හෝ අයත් රාජ්‍යයක් යම් කොටසක් ප්‍රාදේශීය ආණ්ඩුව මගින් නිකුත් කරන ලද ගැසට් පත්‍රය යි හෝ ප්‍රවෘත්ති පත්‍රයක් හෝ සඟරාවක් ය යි, හෝ රජුගේ මුද්‍රණකරු විසින් මුද්‍රණය කරන ලද පුද්ගලික පාර්ලිමේන්තු පනතක පිටපතක් ය යි අදහස් කරනු ලබන සෑම ලේඛනයක් සහ යම් තැනැත්තකු විසින් තබාගත යුතුයයි යම් නීතියක් මගින් නියම කර ඇති සෑම ලේඛනයක ම බෙහෙවින් ම් නීතියෙන් අවශ්‍ය ආකාරයට තබනු ලැබ නිසි ආරක්ෂාවෙන් ගෙන ඉදිරිපත් කරනු ලැබුවහොත් එහි නිර්ව්‍යාජත්වය අධිකරණය විසින් පූර්ව නිගමනය කළ යුතු ය.*

මුද්‍රාව හෝ අත්සන ඔප්පු නොකර එංගලන්තයේ දී බාර ගත හැකි ලේඛනය සම්බන්ධ පූර්ව නිගමනය.

82. එංගලන්තයෙහි හෝ උතුරු අයර්ලන්තයෙහි තත් කාලයෙහි වලංගු වන නීතියක් මගින් එංගලන්තයේ හෝ උතුරු අයර්ලන්තයේ යම් අධිකරණයක දී යම් විශේෂ දෙයක සාධකයක් වශයෙන්—එය සැබෑ බව සහතික කරන මුද්‍රාවේ හෝ සළකුණේ හෝ අත්සනේ හෝ එය අත්සන් කළේ යයි අදහස් කරනු ලබන තැනැත්තා හිමිකම් කියන අධිකරණ හෝ නිල තත්ත්වයේ ඔප්පු කිරීමක් නොමැතිව—බාර ගත හැකිවන ලේඛනයක් යයි අදහස් කරනු ලබන යම් ලේඛනයක් යම් අධිකරණයක් ඉදිරිපිටට පමුණුවනු ලැබූ විට—

(අ) ඒ බඳු මුද්‍රාව, සලකුණ හෝ අත්සන නිර්ව්‍යාජ බව ද,

(ආ) එය අත්සන් කරන තැනැත්තා තමා හිමිකම් කියන අධිකරණ හෝ නිල තත්ත්වය, එය අත්සන් කරන විට දැරූ බව ද,

අධිකරණය විසින් පූර්ව නිගමනය කළ යුතු ය.

එම ලේඛනය එංගලන්තයේ දී හෝ උතුරු අයර්ලන්තයේ දී බාර ගත හැකි වන කාර්‍යය සඳහා ම බාර ගත හැකි විය යුතුය.

මිනුම්පති විසින් සකස් කරන ලද හෝ අත්සන් කරන ලද සිතියම් හෝ සැලැස්මවල් සම්බන්ධ පූර්ව නිගමනය.

83. මිනුම්පති විසින් හෝ ඔහු වෙනුවට ක්‍රියා කරන නිලධාරියකු විසින් අත්සන් කරන ලදැයි අදහස් කරනු ලබන සිතියම්, සැලැස්මවල් හෝ මිනුම් සටහන් ඔහුගේ බලය යටතේ නිසි පරිදි සකස් කරන ලදැයි හා නිවැරදි යයි අධිකරණය විසින් පූර්ව නිගමනය කළ යුතු ය. එහෙත්, ඒ ලෙස අත්සන් නො කරන ලද සිතියම්, සැලැස්මවල් හෝ මිනුම් සටහන්වල නිවැරදි බව සත්‍ය බැව් ඔප්පු කළ යුතු ය.

නීති සංග්‍රහය සහ තීරණ පිළිබඳ වාර්තා සම්බන්ධ පූර්ව නිගමනය.

84. යම් රටක ආණ්ඩුවේ බලය යටතේ මුද්‍රණය කරන ලදැයි හෝ පළ කරන ලදැයි ද, එකී රටේ නීති අතරින් කිසිවක් ඇතුළත් ය යි ද අදහස් කරනු ලබන සෑම පොතක සහ එබඳු රටක අධිකරණයන්හි තීරණ පිළිබඳ වාර්තා ඇතුළත් ය යි අදහස් කරනු ලබන සෑම පොතක ද නිර්ව්‍යාජත්වය අධිකරණය විසින් පූර්ව නිගමනය කළ යුතු ය.

---

*96 වැනි වගන්තියේ පැහැදිලි කිරීම බලනු මැනවි.

85. පරකාර්යසාධක බලයක් ය යි ද ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හෝ ඒ වෙනුවට නීති මගින් නිසි පරිදි බලය ලත් තැනැත්තකු හෝ යම් අධිකරණයක් හෝ විනිශ්චයකරුවකු හෝ සුලු අපරාධ විනිශ්චයකරුවකු හෝ බ්‍රිතාන්‍ය තානාපතිවරයකු හෝ උප තානාපතිවරයකු හෝ මහාරාජෝත්තමයාණන් වහන්සේගේ හෝ දිවයිනේ අග්‍රාණ්ඩුකාරතුමන්ගේ හෝ ඉන්දියා ආණ්ඩුවේ නියෝජිතයකු ඉදිරිපිටදී ලියා අත්සන් කරනු ලැබ එවැන්නකු විසින් සහතික කරන ලදැයි අදහස් කරනු ලබන සෑම ලේඛනයක් ම, එ ලෙස ලියා අත්සන් කරන ලදුව සහතික කරන ලදැයි අධිකරණය විසින් පූර්ව නිගමනය කළ යුතු ය.

පරකාර්යසාධක බල සම්බන්ධ පූර්ව නිගමනය.

86. මහාරාජෝත්තමයාණන් වහන්සේගේ ඩොමීනියන් රාජ්‍යයන් අතුරෙන් කොටසක් වශයෙන් සමන්විත නො වන්නා වූ යම් රටක අධිකරණ වාර්තාවක සහතික කරන ලද පිටපතක් යැයි අදහස් කරනු ලබන යම් ලේඛනයක්, මහාරාජෝත්තමයාණන් වහන්සේගේ හෝ දිවයිනේ අග්‍රාණ්ඩුකාරතුමන්ගේ හෝ ඉන්දියා ආණ්ඩුවේ නියෝජිතයකු විසින් අධිකරණ වාර්තා පිටපත් සහතික කිරීම සඳහා එරටෙහි පොදු වශයෙන් භාවිත වන ආකාරයට එබඳු රටක හෝ එබඳු රටක් වෙනුවෙන් එකී ලේඛනය සහතික කර ඇතැයි අදහස් කරනු ලැබේ නම්, එහි නිර්ව්‍යාජ හා නිවැරදි බව අධිකරණය විසින් පූර්ව නිගමනය කළ යුතු ය.

විදේශීය අධිකරණ වාර්තාවල සහතික කරන ලද පිටපත් සම්බන්ධ පූර්ව නිගමනය.

87. මහජන හෝ සාමාන්‍ය උනන්දුව දැක්වෙන කරුණු පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා අධිකරණය විසින් බැලිය හැකි යම් ග්‍රන්ථයක් ද, අධිකරණයේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කර ඇති ප්‍රකාශ අනුකූල කරුණු වන්නා වූ යම් සිතියමක් හෝ සිතියම් සටහනක් ද, එය ලියන ලදැ යි හෝ පළ කරන ලදැ යි අදහස් කරනු ලබන කාලයේදීත් ස්ථානයේදීත් තැනැත්තා විසිනුත් ලියනු ලැබ, පළ කරන ලද්දේ යයි අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකි ය.

ග්‍රන්ථ හා සිතියම් සම්බන්ධ පූර්ව නිගමනය.

88. යම් පණිවිඩයක් යවනු ලැබේ ය යි අදහස් කරනු ලබන තැනැත්තා වෙන විදුලි පණිවුඩ කාර්යාලයකින් යවනු ලබන පණිවිඩයක් එය නිකුත් කරනු ලැබේ ය යි අදහස් කරනු ලබන කාර්යාලයෙහි දී විසුරුවා හැරීම සඳහා භාර දෙනු ලබන පණිවිඩයට අනුරූප වන්නේ ය යි අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකි ය. එහෙත් එබඳු පණිවිඩයක් විසුරුවා හැරීම සඳහා ගෙනැවිත් භාර දෙනු ලබන්නේ කවර තැනැත්තකු විසින් ද යන වග පිළිබඳ ව අධිකරණය විසින් කිසි පූර්ව නිගමනයක් නො කළ යුතු ය.

විදුලි පණිවිඩ සම්බන්ධ පූර්ව නිගමනය.

89. ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබ, 66 වෙනි වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලෙස දැන්වීම් නිකුත් කිරීමෙන් පසු ව, ඉදිරිපත් කරනු නො ලබන සෑම ලේඛනයක් ම නීතියට අවශ්‍ය අන්දමින් සහතික කරන ලද බවත් මුද්දර ගසන ලද බවත් ලියා අත්සන් කරන ලද බවත් අධිකරණය විසින් පූර්ව නිගමනය කළ යුතු ය.

ඉදිරිපත් නොකළ ලේඛන නිසිපරිදි ලියා අත්සන් කිරීම ආදිය සම්බන්ධ පූර්ව නිගමනය.

Scanned with CamScanner

තිස් වර්ෂයක් පැරණි ලේඛනයක් සම්බන්ධ පූර්ව නිගමනය.

**90.** තිස් වර්ෂයක් පැරණි ය යි අදහස් කරනු ලබන හෝ ඔප්පු කරන ලද යම් ලේඛනයක්, එම විශේෂ අවස්ථාව පරිදි සුදුසු යයි අධිකරණය අදහස් කරන යම් භාරයකින් ගෙන ඉදිරිපත් කරනු ලබන කල, යම් විශේෂ තැනැත්තකුගේ අත් අකුරින් ලියැවී ඇතැ යි අදහස් කරනු ලබන එ බඳු ලේඛනයේ අත්සන හා අත් සෑම කොටසක් ද, එකී තැනැත්තාගේ අත් අකුරින් ලියැවී ඇති බවත්, ලියා අත්සන් කරනු ලැබූ හෝ සහතික කරනු ලැබූ ලේඛන යක් සම්බන්ධයෙන් නම්, එය ලියා අත්සන් කරන ලදැයි හා සහතික කරන ලද යි සලකනු ලබන තැනැත්තන් විසින් නිසි පරිදි ලියා අත්සන් කරන ලද බවත්, සහතික කරන ලද බවත්, අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකි ය.

පැහැදිලි කිරීම.—ලේඛන සුදුසු භාරයෙහි පවතී ය යි කියනු ලබන්නේ ඒවා ස්වභාවයෙන් ම තිබිය හැකි ස්ථානයෙහි සහ ස්වභාවයෙන් ම තිබිය හැකි තැනැත්තාගේ ආරක්ෂාව යටතේ පැවතුණොත් ය. එහෙත් යම් භාරයකට නීත්‍යානුකූල ආරම්භයක් තිබුණේ යැයි ඔප්පු වුවහොත් හෝ එ බඳු ආරම්භයක් ඇති වීමට ඉඩ ඇති වන පරිද්දෙන් කරුණු යෙදී ඇතොත් කිසිම භාරයක් නුසුදුසු නො වේ.

මේ පැහැදිලි කිරීම 81 වෙනි වගන්තියට ද අදාල වෙයි.

නිදර්ශන

(අ) "ඒ" දීර්ඝ කාලයක පටන් ඉඩ කඩම් දේපළ නම ස්වාමිත්වයෙහි ඇති ව සිටී. ඒ ඉඩ කඩම්වලට සම්බන්ධ වූ ද ඊට ස්වකීය අයිතිය දක්වන්නා වූද ඔප්පු තමාගේ භාරයෙන් ගෙන "ඒ" ඉදිරිපත් කරයි. භාරය සුදුසු ය.

(ආ) තමා උකස් හිමි වන ඉඩ කඩම් දේපළ සම්බන්ධ ඔප්පු "ඒ" ඉදිරිපත් කරයි. මෙම දේපළ උකස්කරුගේ ස්වාමිත්වයයෙහි ඇත. භාරය සුදුසු ය.

(ඇ) "බී" ගේ ස්වාමිත්වයෙහි තිබෙන ඉඩ කඩම් සම්බන්ධ ඔප්පු "බී" හා සම්බන්ධකමක් ඇති "ඒ" ඉදිරිපත් කරයි. මේ ඔප්පු ආරක්ෂා කර දීම සඳහා "බී" විසින් "ඒ" වෙත තැන්පත් කර තබන ලදී. භාරය සුදුසු ය.

## VI වැනි පරිච්ඡේදය

### බැංකුකරුගේ පොත්

අර්ථ නිරූපනය.

**90අ.** මේ පරිච්ඡේදයේ විෂයයෙන් හෝ පද සංසන්දනයෙන් විරුද්ධ යමක් නො දක්වෙන විට,

දිවයිනෙහි හෝ බ්‍රිතාන්‍ය ඉන්දියාවෙහි කලින් කළ වලංගු සමාගම් වලට අදාල ආඥාපනත් හෝ පනත් යටතේ හෝ යම් පාර්ලිමේන්තු පනත් යටතේ ලියාපදිංචි කරන ලද හෝ පාර්ලිමේන්තුවේ හෝ රාජසභාගත ඉන්දියාවේ අග්‍රාණ්ඩුකාරතුමාගේ පනතකින්, හෝ රාජ සන්නසකින් හෝ රාජ අක්ත පත්‍රයකින් නීති ගත කරන ලද සමාගමක් "සමාගම" යන්නෙන් අදහස් වේ.

"බැංකුව" සහ "බැංකුකරු" යන පදවලින්—

(i) බැංකුකරුවන්ගේ ව්‍යාපාරය පවත්වා ගෙන යන යම් සමාගමක්.

(ii) මේ පරිච්ඡේදයෙහි සඳහන් විධිවිධාන මෙහි මින්මතු විධිවිධාන යොදා ඇති අන්දමට පැතිරිය යුතු වූ පොත් අයිති යම් හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගලයකු,

(iii) යම් මුදල් ඉතිරි කිරීමේ බැංකුවක්, හෝ තැපැල් කාර්යාල සිය ඉතිරි කිරීමේ බැංකුවක් හෝ මුදල් ඇණවුම් කාර්යාලයක්,

අදහස් වේ.

"බැංකුකරුවන්ගේ පොත්" යන්නට ලැජර් පොත්, දවස් පොත, මුදල් ගණන් පොත්, ගණන් හිලව් පොත් සහ බැංකුවක සාමාන්‍ය කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන අන් සියලු පොත් ඇතුළත් වේ.

"සහතික කරන ලද පිටපත" යන්නෙන් අදහස් කරනු ලබන්නේ, බැංකුවක පොත්වල ඇති යම් සටහනක පිටපතක් එබඳු සටහනක සැබෑ පිටපතක් යයි ද, බැංකුවේ සාමාන්‍ය පොත් අතුරෙන් එකක එබඳු සටහනක් ඇතුළත් යයි ද, එය සාමාන්‍ය සුපුරුදු ක්‍රියා මාර්ගය අනුව අරන ලදැයි ද, එබඳු පොතක් තවමත් බැංකුව භාරයේ ඇතැයි ද, ඒ පිටපත අග කරන ලද සහතිකයක් සහිතව බැංකුවක පොත්වල ඇති යම් සටහනක පිටපතකි. ප්‍රධාන ගණකාධිකාරී තැන හෝ බැංකුවේ කළමනාකරු ස්වකීය නම සහ නිල නාමය යොදා දිනය ද සඳහන් කොට එබඳු සහතිකයක් පිළිගනිමින් අත්සන් කර තිබිය යුතු ය.

90 ආ. දිවයින තුළ බැංකුකරුවන්ගේ ව්‍යාපාරය පවත්වා ගෙන යන්නා වූ ද, මුදල් පොතක්, දවස් පොතක් හෝ දින ගණන් පොතක් සහ ලැජර් පොතක් යන සාමාන්‍ය ගණන් පොත් තුනකට නො අඩු පොත් පෙළක් තබා ගන්නා වූ ද යම් හවුල් ව්‍යාපාරයක හෝ පුද්ගලයකුගේ පොත්වලට කලින් කල ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි නිවේදනයක් පළ කිරීමෙන්, මේ පරිච්ඡේදයේ විධිවිධාන පැතිර වීමට ද, එබඳු නිවේදනයක් එලෙසම අවලංගු කිරීමට ද ඇමතිවරයාට හැකි ය. පරිච්ඡේදයේ විධිවිධාන පැතිරවීමට ඇති බලය.

90 ඇ. මේ පරිච්ඡේදයේ විධිවිධානවලට යටත් ව, බැංකුකරුවකුගේ පොතක ඇති යම් සටහනක සහතික කරන ලද පිටපතක් එබඳු සටහනක් පවතින බවට පළමු වරට පෙනෙන සාක්ෂියක් ලෙස, සියලු නීති කටයුතුවලදී ලැබ ගත යුතු ය. කවද මුල් සටහන ම දැනට නීතියෙන් භාර ගත හැකි අවස්ථාවලදී ඊට අතිරේක ව හෝ වෙනස් ව නොව, එකී ප්‍රමාණයට ම සෑම අවස්ථාවක දී එහි සටහන් කර ගනු ලබන කරුණු, ගණුදෙනු සහ ගණන් හිලව් සම්බන්ධයෙන් සාක්ෂි හැටියට එය භාරගත යුතු ය. බැංකුකරුවන්ගේ පොත්වල සටහන් ඔප්පු කරන අන්දම.

90 ඇ. බැංකුව පාර්ශ්වකරුවකු නොවන යම් නීති කටයුත්තක දී, මේ පරිච්ඡේදය යටතේ ඔප්පු කළ හැකි කරුණු ඇතුළත් යම් බැංකුකරුවකුගේ පොතක් ඉදිරිපත් කරන ලෙස හෝ එහි සටහන් කරනු ලබන කරුණු, ගනුදෙනු සහ ගණන් හිලව් ඔප්පු කිරීම සඳහා සාක්ෂිකරුවකු වශයෙන් පෙනී සිටීමට, විශේෂ හේතු සහිතව නිකුත් කරන ලද අධිකරණයේ හෝ විනිශ්චයකරුවකුගේ ආඥාවකින් මිස නො එසේ ව, බැංකුවක කිසි ම නිලධාරියකුට බල නො කළ යුතු ය. පොත් ඉදිරිපත් කරන ලෙස බැංකු නිලධාරියාට බල කළ නොහැකි අවස්ථාව.

Scanned with CamScanner

අධිකරණයේ හෝ විනිශ්චය කරුගේ ආඥාවක් පරිදි පොත් පරීක්ෂා කිරීම.

90 ඉ. (1) නීති කෘත්‍යයක පාර්ශ්වකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් අනුව, එබඳු නීති කෘත්‍යයක කාර්යයන් අතුරෙන් යමක් සඳහා බැංකුකරුවකුගේ පොතක් ඇතම් සටහන් පරීක්ෂා කිරීමට හා පිටපත් ගැනීමට එබඳු පාර්ශ්වකරුවකුට නිදහස ලැබෙන සේ ආඥාවක් නිකුත් කිරීම හෝ එබඳු සියලු සටහන්වල සහතික කරන ලද පිටපත්, එබඳු නීති කෘත්‍යයක දී ඉදිරිපත් කරුණුවලට අනුකූලව බැංකුවේ ගණන් පොත්වල සටහන් කිසිවක් දක්නට නොලැබෙ නැයි යනුවෙන් අමතර සහතිකයක් ද සමග, ආඥුවේ නියමිත කාල යක් තුළ පිළියෙළ කොට ඉදිරිපත් කරන ලෙස ආඥාවක් නිකුත් කිරීම අධිකරණය හෝ විනිශ්චයකරුවකු විසින් කළ හැකිය. තවද, සහතික කරන ලද පිටපත් සම්බන්ධයෙන් මින් පෙර මෙහි නියම කරනු ලැබූ ආකාරයට එබඳු අමතර සහතිකයෙහි දිනය යොදා අත්සන් කළ යුතුය.

(2) මේ වගන්තිය යටතේ හෝ මීට ඉහතින් වූ වගන්තිය යටතේ ආඥුවක් බැංකුවට සිතාසි නිකුත් කිරීමක් සහිතව හෝ රහිතව කළ හැකිය. අධිකරණය හෝ විනිශ්චයකරු වෙත නියෝ ගයක් නොකළ හොත් එබඳු ආඥුවක් පිළිපැදිය යුතු දිනයට බැංකු නිවාඩු දිනයන් හැර සම්පූර්ණ දින තුනකට කලින් බැංකුව වෙත භාර දිය යුතුය.

(3) ඉහත සඳහන් පරිදි එබඳු යම් ආඥුවක් පිළිපැදීමට නියමිත කාලයෙන් පෙර, ඕනෑම අවස්ථාවකදී නඩු විසඳීමෙහි දී ඔවුන්ගේ පොත් ඉදිරිපත් කිරීම හෝ එබඳු ආඥුවකට විරුද්ධව හේතු දක් වීමට ඔවුන් තුල ඇති අදහස පිළිබඳ දැනුම්දීම බැංකුව විසින් කළ හැකිය. ඉන් පසු වැඩිපුර ආඥුවක් නොමැතිව එම ආඥුව ක්‍රියාවේ නො යෙදවිය යුතුය.

ගාස්තු.

90 ඊ. (1) මේ පරිච්ඡේදය යටතේ හෝ මේ පරිච්ඡේදයේ කාර්ය යන් සඳහා අධිකරණය වෙත හෝ විනිශ්චයකරුවෙකු වෙත කරනු ලබන ඉල්ලීමක ගාස්තුද, මේ පරිච්ඡේදය යටතේ හෝ මේ පරිච් ඡේදයේ කාර්යයන් සඳහා අධිකරණය විසින් හෝ විනිශ්චයකරු වෙකු විසින් පනවන ලද ආඥුවක් යටතේ කරන ලද්දා වූ හෝ කිරී මට ඇත්තා වූ යම් දෙයක ගාස්තු ද අධිකරණයේ හෝ විනිශ්චය කරුගේ අභිමතය පරිද්දෙන් විය යුතුය. වියදම් දරන ලද්දේ බැංකුව මගින් වූ යම් වරදක් හෝ අනිසි ප්‍රමාදයක් හේතුකොට ගෙන නම්, එ බඳු ගාස්තු හෝ එයින් යම් කොටසක් යම් පාර්ශ්ව කරුවෙකුට බැංකුව විසින් ගෙවනු ලබන ලෙස ද අධිකරණය හෝ විනිශ්චයකරු විසින් අමතර ලෙස නියම කළ හැකිය.

(2) බැංකුවකට හෝ බැංකුවක් විසින් ගාස්තු ගෙවීම සඳහා මේ වගන්තිය යටතේ කරනු ලබන යම් ආඥුවක් බැංකුව නඩුවේ පාර්ශ්වකරුවෙකු වූ විටෙක මෙන් ක්‍රියාවේ යෙදවිය හැකිය.

(3) නඩු ගාස්තු හිමි කරමින් මේ වගන්තිය යටතේ කරනු ලබන ආඥුවක්, එහි නම් කරන ලද සිවිල් අධිකරණ බලය ඇති යම් අධි කරණයක් වෙත ඉදිරිපත් කළ විට, ඒ අධිකරණය මගින්ම මුදල් සඳහා දෙන ලද තීන්දු ප්‍රකාශයක් මෙන් ඒ අධිකරණය මගින් ක්‍රියා වේ යෙදවිය හැකි ය.

Scanned with CamScanner

එසේ වුව ද, ශාස්තු ගෙවීම සම්බන්ධයෙන් ස්වකීය නියමයන් ක්‍රියාවේ යෙදවීම සඳහා ආඥාව පනවන අධිකරණය හෝ විනිශ්චය කරු සතුව තිබිය හැකි යම් බලයක් අඩු කරන පරිද්දෙන් මේ වගන්තියෙහි සඳහන් කිසිවක් තේරුම් කර නො ගත යුතු ය.

## VII වැනි පරිච්ඡේදය

### ලේඛනයක සාක්ෂි යෙදීමෙන් කථිත සාක්ෂි බැහැර කිරීම

*ලේඛන බවට පමුණුවනු ලැබූ ගිවිසුම්වල, ප්‍රදාන වල හෝ අන් අයුරින් දේපළ හිමි කිරීම්වල කොන්දේසි පිළිබඳ සාක්ෂි*

91. ගිවිසුමක හෝ ප්‍රදානයක හෝ අන් අයුරින් දේපළ හිමි කිරීමක කොන්දේසි පාර්ශ්වකරුවන් විසින් හෝ පාර්ශ්වකරුවන්ගේ කැමැත්තෙන් ලේඛනයකට පමුණුවා ඇති විට ද, යම් කරුණක් ලේඛනයකට පමුණුවාලිය යුතු යයි නීතියෙන් අවශ්‍ය වී ඇති සියලු විට ද, ලේඛනය ම හෝ, මෙහි ඉහත ඇතුළත් විධිවිධාන යටතේ පිළිගනු ලැබිය හැකි ද්විතියික සාක්ෂි සහිත නඩුවල දී ලේඛනයෙහි ඇතුළත් කරුණු පිළිබඳ ද්විතියික සාක්ෂි හැර, එබඳු ගිවිසුමක ප්‍රදානයක හෝ වෙනත් අන්දමකින් දේපළ හිමි කිරීමට කොන්දේසි ඔප්පු කිරීම සඳහා හෝ එබඳු කරුණක් ගැන කිසි සාක්ෂියක් නො දිය යුතු ය.

ව්‍යතිරේකය අංක 1. රජයේ නිලධාරියකු ලියවිල්ලකින් පත් කළ යුතු යයි නීතියෙන් අවශ්‍ය වී තිබෙන කල, එබඳු නිලධාරියකු වශයෙන් එක්තරා තැනැත්තකු කටයුතු කර ඇති බැව් පෙන්වා දුන් විට, ඔහුගේ පත්වීම ඇති කළ ලියවිල්ල සත්‍ය බැව් ඔප්පු කිරීම අවශ්‍ය නොවේ.

ව්‍යතිරේකය අංක 2. දිවසිනෙහි බුදල් බල ලැබූ අන්තිම කැමති පත්‍ර, බුදල් බල පත්‍රයෙන් ඔප්පු කළ හැකි ය.

පැහැදිලි කිරීම 1. මෙහි සඳහන් ගිවිසුම් ප්‍රදාන හෝ දේපළ හිමි කිරීම් එකම ලේඛනයක අන්තර්ගත වී ඇති නඩු සම්බන්ධයෙන් ද, එකට වැඩි ගණනකින් යුත් ලේඛනවල අන්තර්ගත වී ඇති නඩු සම්බන්ධයෙන් ද මේ වගන්තිය එක සේ අදාළ වේ.

පැහැදිලි කිරීම 2. මුල් පිටපත් සංඛ්‍යාව එකකට වැඩි අවස්ථාවන්හි එක් මුල් පිටපතක් පමණක් ඔප්පු කිරීම අවශ්‍ය වේ.

පැහැදිලි කිරීම 3. මේ වගන්තියෙහි සඳහන් කරුණු හැර වෙන යම් කරුණක් සම්බන්ධයෙන් යම් කිසි ලේඛනයක ඇතුළත් ප්‍රකාශය නිසා එකී කරුණ සම්බන්ධයෙන් කථිත සාක්ෂි බාර ගැනීම වැළැක්විය යුතු නොවේ.

#### නිදර්ශන

(අ) ගිවිසුමක් ලියුම් කීපයෙක අන්තර්ගත වේ නම්, එය අන්තර්ගත වන ලියුම් සියල්ලම ඔප්පු කළ යුතු ය.

(ආ) ගිවිසුමක් හුවමාරු පත්‍රයෙක අන්තර්ගත වේ නම්, ඒ හුවමාරු පත්‍රය ඔප්පු කළ යුතු ය.

(ඇ) හුවමාරු පත්‍රයක් තුන් කට්ටලයකින් සකස් කොට ඇති නම්, ඉන් එකක් පමණක් ඔප්පු කිරීම සෑහෙයි.

(ඈ) ඇතැම් කොන්දේසි අනුව මිනිරන් ගෙන ගොස් භාරදීමට "ඒ" ලියවිල්ලකින් "බී" සමග ගිවිසුමකට බැඳෙයි. තවත් අවස්ථාවක දී කට වචනයෙන් පොරොන්දු වන ලද වෙනත් මිනිරන්වල වටිනාකම "බී" විසින් "ඒ" වෙත ගෙවන ලදැයි යන කරුණ ගිවිසුමේ සඳහන්ව ඇත.

අනෙක් මිනිරන් සඳහා කිසිම මුදලක් නොගෙවන ලද බවට කථිත සාක්ෂි ඉදිරිපත් කරනු ලැබේ. මේ සාක්ෂි බාරගත හැකි ය.

(ඉ) "බී" විසින් ගෙවන ලද මුදල් සඳහා කුවිතාන්සියක් "බී" ට "ඒ" දෙයි. මුදල් ගෙවීම සම්බන්ධයෙන් කථිත සාක්ෂි ඉදිරිපත් කරනු ලැබේ. මේ සාක්ෂි භාරගත හැකි ය.

කථිත පොරොත්දුවක් පිළිබඳ සාක්ෂි බැහැර කිරීම.

92. යම් ගිවිසුමක, හෝ ප්‍රදානයක හෝ අන් අයුරින් දේපළ හිමි කිරීමක හෝ ලේඛනයකට පමුණුවා ලිය යුතුය යි නීතියෙන් අවශ්‍ය යම් කරුණක කොන්දේසි පසුගිය වගන්තියේ ප්‍රකාර සත්‍ය බැව් ඔප්පු කර ඇති විට එහි කොන්දේසිවලට විරුද්ධවීම හෝ වෙනස් වීම හෝ ඊට එක් කිරීම හෝ ඉන් අඩු කිරීම සඳහා යම් කථිත පොරොත්දුවක් හෝ ප්‍රකාශයක් ගැන කිසිම සාක්ෂියක් එබඳු යම් නීත්‍යානුකූල ලේඛනයක පාර්ශ්වකරුවන් අතර හෝ ඔවුන් ගේ සම්බන්ධතාව නියෝජනය කරන්නන් අතර භාර නොගත යුතු ය.

අතුරු විධානය. (1) වංචාව, බිය ගැන්වීම, නීති විරෝධි බව, නිසි පරිදි ලියා අත්සන් කර නැති බව, ගිවිසුමට බැඳෙන යම් පාර්ශ්වයක නොහැකි බව, දිනය වැරදි ලෙස යොදා තිබීම, අපේක්ෂණය නැති බව හෝ නිෂ්ඵල වීම, හෝ සිද්ධිය හෝ නීතිය පිළිබඳ වරද වැනි යම් ලේඛනයක බලය නැති කළ හැකි වූ හෝ, ඊට සම්බන්ධ යම් තීන්දු ප්‍රකාශයකට හෝ ආඥාවකට හිමිකමක් සමකුට ලබා දෙන්නා වූ යම් කරුණක් ඔප්පු කළ හැකි ය.

අතුරු විධානය. (2) යම් කරුණක් සම්බන්ධයෙන් ලේඛනයෙක කිසිවක් සඳහන් නොවන විට ඒ කරුණ සම්බන්ධ කොන්දේසි සමග අනුකූල කථිත පොරොන්දුවක් වෙනම පැවතීම ඔප්පු කළ හැකි ය. මේ අතුරු විධානය අදාළ වන්නේ ද නැද්ද යන වග සලකා බැලීමේදී, ලේඛනයේ විධිමත්භාවයේ ප්‍රමාණය ගැන අධිකරණය සැලකිලිමත් විය යුතු ය.

අතුරු විධානය. (3) එබඳු යම් ගිවිසුමක් ප්‍රදානයක් හෝ දේපළ හිමි කිරීමක් යටතේ යම් යටත්වීමක් සම්බන්ධ කිරීමට කලින් ඇති විය යුතු කොන්දේසියක් බවට පත්වන කථිත පොරොන්දුවක් වෙන ම පැවැතීම ඔප්පු කළ හැකි ය.

අතුරු විධානය. (4) එබඳු යම් ගිවිසුමක්, ප්‍රදානයක් හෝ දේපළ හිමි කිරීමක් අවලංගු කිරීම සඳහා හෝ සුළු වශයෙන් වෙනස් කිරීම සඳහා යම් පැහැදිලි පොරොන්දුවක් පසුව ඇති වී තිබෙන බැව් ඔප්පු කළ හැකි ය. එසේ නොකළ හැක්කේ එබඳු යම් ගිවිසුමක්, ප්‍රදානයක් හෝ දේපළ හිමිකිරීමක් ලියවිල්ලකින් සකස් විය යුතු යයි නීති මගින් අවශ්‍ය වන්නා වූ හෝ ලේඛන ලියාපදිංචි කිරීම සම්බන්ධව තත් කාලයෙහි වලංගුවූ පවත්නා නීතියට අනුව එබන්දක් ලියාපදිංචි කර ඇත්තා වූ අවස්ථාවන්හි ය.

අතුරු විධානය. (5) යම් ගිවිසුමක ප්‍රකාශිත ව සඳහන් නොවූ සිද්ධීන් එබඳු විස්තර සහිත ගිවිසුම්වලට සාමාන්‍යයෙන් සම්බන්ධ කිරීමට යෙදෙන යම් ව්‍යවහාර හෝ සිරිත් ඔප්පු කළ හැකි ය.

එසේ විය හැක්කේ එබඳු සිද්ධියක් සම්බන්ධ කර ගැනීම ගිවිසුමේ ප්‍රකාශිත කොන්දේසිවලට විරුද්ධ හෝ නොගැලපෙන දෙයක් නොවූ විටය.

Scanned with CamScanner

**අතුරු විධානය. (6) ලේඛනයක භාෂාව, පවතින කරුණුවලට සම්බන්ධ වී ඇත්තේ කිනම් ආකාරයකින් දැයි දක්වන යම් කරුණක් ඔප්පු කළ හැකි ය.**

**නිදර්ශන**

(අ) "කොළඹ සිට ලන්ඩනය දක්වා නැව්වල" බඩු බාහිරාදිය සම්බන්ධයෙන් රක්ෂණ සහතික පත්‍රයක් ලබා ඇත. බඩු පටවා යවනු ලබන විශේෂ නැව් නැතිවේ. එම විශේෂ නැව කට වචනයෙන් රක්ෂණ සහතික පත්‍රයෙන් බැහැර කරන ලද බව සත්‍ය බැව් ඔප්පු කළ නොහැකි ය.

(ආ) වර්ෂ 1896 මාර්තු මස 1 වෙනි දින රුපියල් 1,000ක් "බී" ට ගෙවන ලෙස "ඒ" ඒකාන්තයෙන් ම ලියවිල්ලක මාර්ගයෙන් පොරොන්දු වෙයි. මාර්තු මස 31 වෙනි දින තෙක් මුදල නොගෙවිය යුතු යයි කථිත පොරොන්දුවක් ඒ සමගම ඇති කරන ලද බව් සත්‍ය බැව් ඔප්පු කළ නොහැකි ය.

(ඇ) "රම්පෝර් වත්ත" නමැති වත්තක් ඔප්පුවක් පිට විකුණනු ලැබේ. විකුණන ලද ඉඩ කඩම්වල සිතියමක් ඔප්පුවට ඇතුළත් ය. සිතියමෙහි ඇතුළත් නොවූ ඉඩම් වත්තේ කොටසක් වශයෙන් සැම විටම සලකන ලද බවත්, ඔප්පුවෙන් ඒ බව පිළිගෙන ඇති බවත් සත්‍ය බැව් ඔප්පු කළ නොහැකි ය.

(ඈ) "බී" ගේ දේපළ වූ ඇතැම් ආකරවල වැඩකරවන ලෙස පොරොන්දුවෙමින් එක්තරා කොන්දේසි කීපයක් ඇතුළත් ලිඛිත ගිවිසුමකට "ඒ" අතුළු වෙයි. එසේ ක්‍රියා කිරීමට "ඒ" පොළඹවන ලද්දේ එම ආකරවල වටිනාකම සම්බන්ධයෙන් "බී" විසින් අසත්‍ය ලෙස කරුණු ඉදිරිපත් කිරීමේ හේතුවෙනි. මේ කාරණය සත්‍ය බැව් ඔප්පු කළ හැකිය.

(ඉ) ගිවිසුමක් එ පරිද්දෙන් ම ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා "බී" ට විරුද්ධව නඩුවක් පවරන "ඒ", ගිවිසුමේ ඇතුළත් එක් විධිවිධානයක් වැරදීමකින් එහි ඇතුළත් කරන ලදැයි යන හේතුව ඉදිරිපත් කරමින් එකී විධිවිධානය සම්බන්ධයෙන් ගිවිසුම වෙනස් කළ යුතු යයි ද ඉල්ලා සිටී. ගිවිසුම වෙනස් කරවා ගත හැකිවීමට තමාට නීති මගින් බලය ලැබෙන පරිද්දෙන් එබඳු වැරැද්දක් සිදු කරන ලද බව "ඒ" විසින් සත්‍ය බැව් ඔප්පු කළ හැකි ය.

(ඊ) "ඒ" මුදල් ගෙවීම ගැන කිසිවක් සඳහන් නැති ලියුමකින් "බී" ගෙන් බඩු ඉල්ලා යවයි. එවනු ලබන බඩු "ඒ" භාර ගනී. බඩුවල වටිනාකම ඉල්ලා "ඒ" ට විරුද්ධව "බී" නඩු පවරයි. එතෙක් ගෙවී නැති කාලයකට මේ බඩු ණයට සපයන ලද බව "ඒ" විසින් සත්‍ය බැව් ඔප්පු කළ හැකි ය.

(උ) "බී" ට අශ්වයකු විකුණන "ඒ" අශ්වයා හොඳ බව ඔහුට කට වචනයෙන් සහතික කරයි. "රුපියල් 500කට "ඒ" ගෙන් අශ්වයකු මිළයට ගතිමි." යන වචන සහිත ලියවිල්ලක් "ඒ" විසින් "බී" ට දෙනු ලැබේ. කට වචනයෙන් කරන ලද එම සහතික කිරීම "බී" විසින් සත්‍ය බැව් ඔප්පු කළ හැකි ය.

(ඌ) නවාතැන් ගන්නා ස්ථානයක් "බී" ගෙන් "ඒ" කුලියට ලබාගත් පසු "මසකට රුපියල් 200 බැගින් වූ කාමර" යන්න ලියා ඇති කාඩ්පතක් "බී" ට "ඒ" විසින් දෙනු ලැබේ. මේ කොන්දේසිවලට කෑම බීමෙන් කොටසක් ඇතුළත් වන බවට කට වචනයෙන් වූ එකඟවීමක් ඇති බව "ඒ" විසින් සත්‍ය බැව් ඔප්පු කළ හැකි ය.

නවාතැන් ගන්නා ස්ථානයක් "බී" ගෙන් වර්ෂයකට "ඒ" කුලියට ගනී. නොතාරිස් කෙනකු විසින් කරන ලදු ව නිසි පරිදි මුද්දර ගසන ලද එකඟවීම් පත්‍රයක් ඔවුන් අතර හුවමාරු කර ගනු ලැබේ. කෑම බීම ප්‍රශ්නය ගැන මේ එකඟවීම් පත්‍රයෙහි කිසිවක් සඳහන් ව නැත. කෑම බීම පිළිබඳ ව එහි කොන්දේසිවල යමක් කට වචනයෙන් ඇතුළත් වී තිබෙන බව "ඒ" විසින් සත්‍ය බැව් ඔප්පු කළ නො හැකි ය.



Scanned with CamScanner

(ඔ) තමාට ලැබිය යුතු ණයක් ලබා ගැනීම සඳහා "ඒ" එම මුදල කුවිතාන්සියක් යැවීමෙන් "බී" ගෙන් ඉල්ලීමක් කරයි. කුවිතාන්සිය තමා වෙත තබා ගන්න "බී" මුදල නො එවයි. මුදල ලබා ගැනීමට දමන නඩුවක ද "ඒ" විසින් මෙය සත්‍ය බව ඔප්පු කළ හැකි ය.

(ඕ) එක්තරා සිද්ධියක් ඇති වූ විට ක්‍රියාත්මක වන සේ ලියවිල්ලකින් "ඒ" සහ "බී" ගිවිසුමක් කර ගනිති. ලියවිල්ල "බී" ගේ භාරයේ තබනු ලැබේ. එහි බලය පිට ඔහු "ඒ" ට විරුද්ධ ව නඩු පවරයි. එය භාර දෙනු ලබද්දී පැවැති තත්ත්වයන් "ඒ" විසින් පෙන්නුම් කළ හැකි ය.

නොපැහැදිලි ලේඛනයක් පැහැදිලි කිරීමට හෝ සංශෝධනය කිරීමට සාක්ෂි බැහැර කිරීම.

93. ලේඛනයක යොදා ඇති භාෂාව එක් වරට පෙනෙන පරිදි නො පැහැදිලි හෝ අඩුපාඩු සහිත නම්, එහි අදහස පෙන්විය හැකි හෝ එහි අඩුපාඩු සම්පූර්ණ කළ හැකි කරුණු සම්බන්ධයෙන් සාක්ෂි දිය නොහැකිය.

නිදර්ශන

(අ) "රුපියල් 1,000 කට හෝ රුපියල් 1,500 කට" අශ්වයකු "බී" ට විකුණන ලෙස "ඒ" ලියවිල්ලකින් පොරොන්දු වෙයි. කිනම් මිළක් ගෙවිය යුතුව තිබුණේදැයි දැක්වීම සඳහා සාක්ෂි දිය නොහැකිය.

(ආ) ඔප්පුවක හිස්තැන් තිබේ. ඒවා කෙසේ සම්පූර්ණ කිරීමට අදහස් කරන ලද්දේදැයි දැක්විය හැකි කරුණු සම්බන්ධයෙන් සාක්ෂි දිය නොහැකිය.

පවතින කරුණු වලට ලේඛනය අදළවීමට විරුද්ධ සාක්ෂි බැහැර කිරීම.

94. ලේඛනයක යොදා ඇති භාෂාව ඒ පමණින් ම සරල වූ විට ද පවතින කරුණුවලට එය නිවැරදිව අදාළ වන විට ද, එබඳු කරුණු වලට අදාළ වීම ඒ මගින් අදහස් නො කරන ලද බැව් දැක්වීමට සාක්ෂි දිය නො හැකිය.

නිදර්ශන

"මීගමුවේ පිහිටි අක්කර 100 ක් විශාලවූ මාගේ වත්ත "ඒ" ඔප්පුවකින් "බී" ට විකුණයි. අක්කර 100 ක ප්‍රමාණයෙන් යුත් වත්තක් "ඒ" ට මීගමුවෙහි තිබේ. අදහස් කරන ලද වත්ත වෙනත් ස්ථානයක පිහිටි වෙනත් ප්‍රමාණයකින් යුත් වත්තක්ය යන්න පිළිබඳ සාක්ෂි දිය නොහැකිය ය.

පවතින කරුණු පිළිබඳව තේරුමක් නොමැති ලේඛනය සම්බන්ධයෙන් සාක්ෂි.

95. ලේඛනයක යොද ඇති භාෂාව ඒ පමණින් ම සරල වූ නමුදු, පවතින කරුණු පිළිබඳ ව එහි තේරුමක් නැති කල, එය එක්තරා විශේෂ අර්ථයක් සහිතව යොදන ලදැයි දක්වීමට සාක්ෂි දිය හැකිය.

නිදර්ශන

"කොළඹ පිහිටි මාගේ නිවාසය" "ඒ" ඔප්පුවකින් "බී" ට විකුණයි.

"ඒ" ට හිමි නිවාසයක් කොළඹ නොතිබිණ. එහෙත් ඔහුට කෝට්ටේ නිවාසයක් තිබුණු බව ද, ඔප්පුව ලියා අත්සන් කිරීමෙන් පසු එහි නිවාසය "බී" ගේ ස්වාමිත්වයෙහි තිබුණු බව ද පැහැදිලි වේ.

ඔප්පුවේ සඳහන් වූයේ කෝට්ටේ පිහිටි නිවාසය සම්බන්ධයෙන් බව දැක්වීමට මේ කරුණු සත්‍ය බැව් ඔප්පු කළ හැකි ය.

Scanned with CamScanner

**96.** යොදා ඇති භාෂාව ඔනෑ ම පුද්ගලයකුට අදාළ විය හැකි යැයි ද, පුද්ගලයන් කීප දෙනකු හෝ ද්‍රව්‍ය කීපයක් අතුරෙන් එක් කෙනෙකුට හෝ එකකට වැඩියෙන් එම භාෂාව අදාළ නොවිය හැකි යයි ද අදහස් කළ හැකි පරිදි කරුණු යෙදී ඇති විට එය අදල වේයයි අදහස් කරන ලද්දේ එකී පුද්ගලයන් හෝ ද්‍රව්‍යයන් අතුරෙන් කිනම් පුද්ගලයකුට හෝ ද්‍රව්‍යයකට දැයි දක්වන කරුණු ගැන සාක්ෂි දිය හැකි ය.

පුද්ගලයන් කීප දෙනකු අතරින් එක් කෙනෙකුට පමණක් අදළ විය හැකි භාෂාව අදළවීම සම්බන්ධ සාක්ෂි.

**නිදර්ශන**

(අ) "මගේ සුදු අශ්වයා", රුපියල් 1,000 කට "බී" ට විකිණීමට "ඒ" පොරොන්දු වෙයි. "ඒ" ට සුදු අශ්වයෝ දෙදෙනෙක් ඇත. මෙයින් කිනම් එකෙක් අදහස් දක්වන කරන ලද්දේ දැයි දක්වන කරුණු පිළිබඳ සාක්ෂි දිය හැකිය.

(ආ) "බී" කැටුව හැලිෆැක්ස් නගරයට යෑමට "ඒ" පොරොන්දු වෙයි. අදහස් කරන ලද්දේ. යෝර්ක්ෂයර් පිහිටි හැලිෆැක්ස් නගරය ද නැතහොත්, නෝවා ස්කෝටියාහි පිහිටි හැලිෆැක්ස් නගරයද යන වග දක්වන කරුණු පිළිබඳ සාක්ෂි දිය හැකි ය.

**97.** යොදා ඇති භාෂාව, දක්නට ලැබෙන එක් කරුණු රැසකට කොටස් වශයෙන් ද, එබඳු තවත් කරුණු රැසකටත් කොටස් වශයෙන් ද අදාල වන නමුත්, සම්පූර්ණ වශයෙන් එම භාෂාව මේ එකකට වත් නිවැරදිව අදාල නොවන විට, මේ කොටස් දෙක අතුරෙන් කුමන කොටසකට අදාල වන සේ එය අදහස් කරන ලද්දේ දැයි දැක්වීම සඳහා සාක්ෂි දිය හැකි ය.

කරුණු සමූහයන් දෙකක් අතුරෙන් කිසිවකට සම්පූර්ණයෙන් නිවැරදිව අදළ නොවන භාෂාව මෙකී සමූහයෙන් දෙකෙන් එකකට අදළවීම පිළිබඳ සාක්ෂි.

**නිදර්ශනය**

"වයි" පදිංචි වී සිටින, "එක්ස්" හි තිබෙන "මගේ ඉඩම" "බී" ට විකිණීමට "ඒ" පොරොන්දු වෙයි. "එක්ස්" හි "ඒ" ට ඉඩම් ඇතත් එහි "වයි" පදිංචි වී නැත. "වයි" පදිංචි වී ඇති ඉඩමක් ඔහුට ඇතත්, එය "එක්ස්" එහි පිහිටා නැත. ඔහු විකිණීමට අදහස් කළේ කුමන ඉඩමක් ද යන්න දක්වන කරුණු පිළිබඳ සාක්ෂි දිය හැකි ය.

**98.** කියවීමට අපහසු හෝ සාමාන්‍ය වශයෙන් තේරුම් ගත නොහැකි අක්ෂර වලද, විදේශීය, අභාවිත, කාර්මික, දේශීය සහ ප්‍රාදේශික යෙදුම්වල ද සංක්ෂිප්ත පදවල ද, විශේෂ අර්ථ සහිතව යොදා ඇති වචන වල ද අර්ථ දැක්වීම සඳහා සාක්ෂි දිය හැකි ය.

කියවීමට අපහසු අක්ෂර ආදියේ අර්ථ පිළිබඳ සාක්ෂි.

**නිදර්ශනය**

මූර්ති ශිල්පියකු වන "ඒ" "මාගේ රූප මෝස්තර සියල්ල" "බී" ට විකිණීමට පොරොන්දු වෙයි. "ඒ" සතුව රූප මෝස්තර මෙන් ම රූප ඇඹීමේ උපකරණ ද තිබේ. මෙයින් කුමක් විකිණීමට ඔහු අදහස් කළේ ද යන්න දක්වීමට සාක්ෂි දිය හැකි ය.

**99.** ලේඛනයක පාර්ශ්වකරුවන් නොවන තැනැත්තන් විසින් හෝ ඔවුන්ගේ සම්බන්ධතාව නියෝජනය කරන්නන් විසින් ලේඛනයේ කොන්දේසි වෙනස් කරවන්නා වූ සමකාලීන එකඟ වීමක දැක්වීමට තුඩු දෙන යම් කරුණු පිළිබඳව සාක්ෂි දිය හැකිය.

ලේඛනයේ කොන්දේසි වෙනස් කරවන එකඟවීම පිළිබඳ සාක්ෂි දියහැක්කේ කවුරුන් විසින් ද?

**නිදර්ශනය**

ගෙනැවිත් භාර දුන් විට මුදල් ගෙවීමට නියමිත කඩු පුලුන් තොගයක් "ඒ" ට "බී" විසින් විකිණිය යුතු ය යි "ඒ" සහ "බී" ලියවිල්ලකින් ගිවිසුමකට බැඳෙති. ඒ සමගම තුන් මසක් යන තුරු "ඒ" ට ණයට බඩු දිය යුතු බවට කටින් එකඟවීමක් ඔවුහු ඇති කර ගනිති. මෙය "ඒ" සහ "බී" අතර පෙන්විය නො හැකි නමුදු "සී" ගේ අයිතිවාසිකම් කෙරෙහි බල පාන්නේ නම්, මෙය ඔහු විසින් පෙන්විය හැකි ය.

## VIII වැනි පරිච්ඡේදය

### සක්ෂි පිළිබඳ ඉංග්‍රීසි නීතිය බලපවත්වන අවස්ථා

*සාක්ෂි පිළිබඳ ඉංග්‍රීසි නීතිය අනුව නිශ්චය කළ යුතු ප්‍රශ්න කවරේ ද?*

100. මේ ආඥාපනත මගින් හෝ මේ දිවයිනෙහි වලංගු අන් කිසි නීතියක් මගින් විධිවිධාන නො යොදා ඇති සාක්ෂි පිළිබඳ ප්‍රශ්නයක් නීති කෘත්‍යයක දී මතු වන ඕනෑ ම විටෙක, ඒ බඳු ප්‍රශ්නයක් තත් කාලයෙහි බල පවත්නා සාක්ෂි පිළිබඳ ඉංග්‍රීසි නීතිය අනුව නිශ්චය කළ යුතුය.

## 3 වැනි කාණ්ඩය

### සාක්ෂි ඉදිරිපත් කිරීම සහ සාක්ෂිවල ප්‍රතිඵලය

## IX වැනි පරිච්ඡේදය

### සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය

*සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය.*

101. තමා කියා සිටින කරුණුවල පැවැත්ම මත රඳා පවතින යම් නීත්‍යානුකූල අයිතිවාසිකමක් හෝ යටත්වීමක් සම්බන්ධයෙන් තීන්දුවක් දෙන ලෙස යම් අධිකරණයකින් ඉල්ලා සිටින කෙනකු විසින් එකී කරුණු පවතින බව සත්‍ය බැව් ඔප්පු කළ යුතුය.

යම් කරුණක පැවැත්ම සත්‍ය බැව් ඔප්පු කිරීමට යම් තැනැත්තකු බැඳී සිටින විට, සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය ඔහු වෙත පැවරී තිබේ යයි කියනු ලැබේ.

**නිදර්ශන**

(අ) "බී" විසින් කරන ලද යි "ඒ" ප්‍රකාශ කරන අපරාධයක් සම්බන්ධයෙන් "බී" ට දඬුවම් පැමිණ විය යුතු යැයි තීන්දු කරන ලෙස "ඒ" අධිකරණයෙන් ඉල්ලා සිටී. අපරාධය "බී" විසින් කරන ලද බව සත්‍ය බැව් "ඒ" ඔප්පු කළ යුතු ය.

(ආ) "ඒ" කියා සිටින එහෙත් "බී" විරුද්ධ වන කරුණුවල හේතුවෙන් "බී" ගේ ස්වාමිත්වයෙහි ඇති ඉඩමක් සම්බන්ධයෙන් තමාට හිමිකම් ඇතැයි යන පරිද්දෙන් තීන්දුවක් දෙන ලෙස "ඒ" අධිකරණයකින් ඉල්ලා සිටී. එම කරුණු පවතින බව "ඒ" විසින් සත්‍ය බැව් ඔප්පු කළ යුතු ය.

Scanned with CamScanner

**102.** නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී සත්‍ය බව ඔප්පු කිරීමේ කාර්‍ය්‍ය භාරය පැවරෙන්නේ දෙපාර්ශ්වයෙන් එක පාර්ශ්වයක් වෙනුවෙන් වත් කිසිම සාක්ෂියක් නොදුනහොත් සත්‍ය බැව් ඔප්පු කිරීමට අපොහොසත් වන තැනැත්තා මත ය.

සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්‍ය්‍ය භාරය පැවරෙන්නේ කවරකු මත ද?

නිදර්ශන

(අ) 'බී' ගේ ස්වාමිත්වයෙහි ඇති ඉඩම සම්බන්ධයෙන් 'බී' ට විරුද්ධව "ඒ" නඩු පවරයි. "ඒ" කියා සිටින අන්දමට මේ ඉඩම "බී" ගේ පියා වූ "සී" විසින් සිය අන්තිම කැමති පත්‍රයෙන් "ඒ" වෙත පවරන ලදී.

එක පාර්ශ්වයක් වෙනුවෙන' වත් සාක්ෂි නොදුන හොත්, තම ස්වැමින්වය රැක ගැනීමට "බී" ට හිමිකම් ලැබෙනු ඇත. එබැවින් සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්යභාරය "ඒ" මත රැඳේ.

(ආ) බැඳුම්කරයක් පිට ලැබිය යුතු මුදලක් සඳහා "බී" ට විරුද්ධව "ඒ" නඩු පවරයි.

බැඳුම්කරය ලියා අත්සන් කිරීමට "බී" විසින් පිළිගනු ලබන නමුදු එය වංචක ලෙස ලබා ගන්නා ලද බැව් "බී" පවසයි. එය එසේ නො වන බව "ඒ" කියයි. එක පාර්ශ්වයක් වෙනුවෙන් වත් සාක්ෂි නොදුනහොත්, බැඳුම්කරය ගැන විවාදයක් නොමැති හෙයින් ද, වංචාව ඔප්පු වී නැති නිසා ද, සත්‍ය බැව් ඔප්පු කිරීමෙහි "ඒ" සමර්ථ වනු ඇත. එබැවින් සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය "බී" මත රුඳේ.

**103.** යම් විශේෂ කරුණක් සත්‍ය බැව් ඔප්පු කිරීම යම් විශේෂ තැනැත්තකු වෙත පැවරිය යුතු ය යි යම් නීතියක් මගින් විධි විධාන යෙදී ඇති නම් මිස, එසේ නොවන කල එය සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්‍ය්‍ය භාරය පැවරෙන්නේ එම කරුණෙහි පැවැත්ම අධිකරණය විශ්වාස කරනු ඇතැ යි බලාපොරොත්තු වන තැනැත්තා වෙතය.

යම් විශේෂ කරුණක් සම්බන්ධයෙන් කරුණු සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්‍ය්‍ය භාරය.

නිදර්ශක

සොරකම් කිරීම ගැන "බී" ට විරුද්ධව නඩු පවරන "ඒ", තමා සොරකම් කළ බව "සී" සමග සාකච්ඡාවකදී "බී" විසින් ඒත්තු ගන්නා ලදැයි අධිකරණය විශ්වාස කරනු ඇතැයි බලාපොරොත්තු වෙයි. මේ ඒත්තු ගැනීම "ඒ" විසින් සත්‍ය බැව් ඔප්පු කළ යුතු ය.

ප්‍රශ්නාත්මක වේලාවේදී තමා අන් ස්ථානයෙක සිටි බව අධිකරණය විශ්වාස කරනු ඇතැයි "බී" බලාපොරොත්තු වෙයි. ඔහු එය සත්‍ය බැව් ඔප්පු කළ යුතුය.

**104.** අන් කිසි කරුණක් ගැන සාක්ෂි දීමට යම් තැනැත්තකුට හැකි වන පරිදි සත්‍ය බැව් ඔප්පු කළ යුතු යම් කරුණක් සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය එබඳු සාක්ෂි දීමට කැමැත්ත දක්වන තැනැත්තා මත රුඳේ.

සාක්ෂි භාරගත හැකි තත්වයට පමුණුවාලීම සඳහා අවශ්‍ය කරුණු සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්‍ය්‍ය භාරය.

නිදර්ශන

(අ) "බී" විසින් කරන ලද මරණාසන්න ප්‍රකාශයක් සත්‍ය බැව් ඔප්පු කිරීමට "ඒ" බලාපොරොත්තු වෙයි. "බී" ගේ මරණය සිදුවීම "ඒ" විසින් සත්‍ය බැව් ඔප්පු කළ යුතු ය.

(ආ) නැති වූ ලේඛනයක ඇතුළත් කරුණු ද්විතීයික සාක්ෂිවලින් සත්‍ය බැව් ඔප්පු කිරීමට "ඒ" බලාපොරොත්තු වෙයි. ලේඛනය නැතිවූ බව "ඒ" විසින් සත්‍ය බැව් ඔප්පු කළ යුතු ය.



Scanned with CamScanner

විත්තිකරුගේ නඩුව ව්‍යතිරේක වලට ඇතුළත් වන බව සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්‍ය භාරය.

**105.** යම් අපරාධයක් කරන ලදැයි තැනැත්තකු චෝදනා ලැබ සිටින විට, දණ්ඩ නීති සංග්‍රහයෙහි සඳහන් සාමාන්‍ය ව්‍යතිරේක අතුරෙන් යමකට හෝ එම සංග්‍රහයේ ම අන් කිසි කොටසක, අන්තර්ගත යම් විශේෂ ව්‍යතිරේකයක් හෝ අතුරු විධානයක් හෝ වරද විස්තර කෙරෙන යම් නීතියක් තුළ මේ නඩුව ගෙනෙන කරුණු පවතින බැව් ඔප්පු කිරීමේ කාර්‍ය භාරය ඒ තැනැත්තා මත රැඳේ. එ බඳු කරුණු අවිද්‍යාමානය යන පූර්ව නිගමනය අධිකරණය විසින් ඇති කර ගත යුතු ය.

නිදර්ශන

(අ) මිනී මරණ ලදැයි චෝදනා ලැබ සිටින "ඒ", තම සිහි විකලත්වය කරණකොටගෙන තමා කළ ක්‍රියාවේ ස්වභාවය දැන නො සිටි බව දන්වා සිටී. මෙය සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය "ඒ" මත රැඳේ.

(ආ) මිනී මරණ ලදැයි චෝදනා ලැබ සිටින "ඒ" බරපතල වූත්, හදිසි වූත් ප්‍රකෝප කිරීම හේතු කොට ගෙන ආත්ම සංවරක් ඇති කර ගැනීමේ ශක්තිය තමාට අහිමි වූ බව දන්වා සිටී. මෙය සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය "ඒ" මත රැඳේ.

(ඇ) 326 වෙනි වගන්තියෙන් සලස්වා ඇති අවස්ථාවේදී හැරුණු විට කැමැත්තෙන් බරපතල තුවාළ කරවන අයකු ඇතැම් දඬුවම්වලට යටත් විය යුතු බැව් දණ්ඩ නීති සංග්‍රහයේ 316 වෙනි වගන්තියෙන් සලස්වා ඇත. කැමැත්තෙන් බරපතළ තුවාළ කිරීම ගැන 316 වෙනි වගන්තිය යටතේ "ඒ" චෝදනා ලැබ සිටී.

මේ අවස්ථාව 326 වෙනි වගන්තිය යටතට පමුණුවන කරුණු සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය "ඒ" මත රැඳේ.

යම් තැනැත්තකුගේ දනගැනීමට විශේෂයෙන් ඇතුළත් කරුණක් සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්‍ය භාරය.

**106.** යම් කරුණක් යම් තැනැත්තකුගේ දැනීමට විශේෂයෙන් ඇතුළත් වන විට, එම කරුණ සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්‍ය භාරය ඔහු මත රැඳේ.

නිදර්ශන

(අ) ක්‍රියාවේ ආකාරයෙන් සහ එහි කරුණුවලින් අදහස් කරනු ලබන අදහස හැර වෙනත් අදහසක් සහිතව යම් තැනැත්තෙක් යම් ක්‍රියාවක් කරයි නම්, එකී අදහස සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය ඔහු මත රැඳේ.

(ආ) ප්‍රවේශ පත්‍රයක් නොමැතිව දුම්රියක ගමන් කරන ලදැයි "ඒ" චෝදනා ලබ සිටී. තමන් සතුව ප්‍රවේශ පත්‍රයක් තිබුණු බව සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය ඔහු මත රැඳේ.

තිස් වර්ෂයකින් මෙපිට ජීවත්ව සිටියේ යැයි කියනු ලබන තැනැත්තකුගේ මරණය සත්‍ය බැව ඔප්පු කිරිමෙ කාර්‍ය භාරය.

**107.** යම් මිනිසෙක් ජීවත් ව සිටී ද නැතහොත් මිය ගොස් සිටි ද යන්න ප්‍රශ්නය නම්, හා තිස් වර්ෂයකින් මෙපිට ඔහු ජීවත් ව සිටියේ ය යි දක්වනු ලැබේ නම්, ඔහු මිය ගිය බව සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්‍ය භාරය එය සහතික කොට ප්‍රකාශ කරන තැනැත්තා මත රැඳේ.

Scanned with CamScanner

**108.** එසේ වුව ද, යම් මිනිසෙක් ජීවත් ව සිටී ද නැතහොත් මිය ගොස් සිටී ද, යන්න ප්‍රශ්නය වී ඇති කල, ඔහු ජීවත් ව සිටියේ නම් ඔහු ගැන ස්වභාවයෙන් ම තොරතුරු දැන ගත හැකිවූ තැනැත්තන් සත් වර්ෂයකින් ඔහු ගැන කිසිම තොරතුරක් දැන නොගත්තා ලද බව සත්‍ය බැව් ඔප්පු වී ඇති කල, ඔහු ජීවත් ව සිටී යන්න සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය ඒ බව සහතික කොට ප්‍රකාශ කරන තැනැත්තා වෙත පැවරේ.

සත් වර්ෂයකින් කිසි තොරතුරක් දනගන්නට නොලැබුණු තැනත්තෙක් ජීවත්ව සිටී යනු සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය.

**109.** යම් අය ව්‍යාපාරයක කොටස්කරුවෝ ද, ගෙවල් හිමියා ද, බදුකාරයා ද ප්‍රධානයා හා නියෝජිතයා ද, යන්න ප්‍රශ්නය වූ විට, ඔවුන් එ පරිද්දෙන් ක්‍රියා කර තිබෙන බව දක්වා ඇති නම්, එකී සම්බන්ධකම් අනු ව ඔවුන් පිළිවෙළින් එකිනෙකා සමග නො හැසිරෙන බව හෝ එසේ හැසිරීම අත්හැර සිටින බව සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය ඒ බව සහතික කොට ප්‍රකාශ කරන තැනැත්තා මත රැඳේ.

හවුල් ව්‍යාපාරය, බද්ද සහ නියෝජිත භාවය පිළිබඳව කරුණු සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය.

**110.** යමකුගේ ස්වාමිත්වයෙහි තිබේ ය යි දක්වනු ලබන යම් දෙයක අයිතිකරු එකී තැනැත්තාද යනු ප්‍රශ්නය වූ විට, ඔහු අයිතිකරු නො වන බව සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය ඔහු අයිතිකරු නො වේ ය යි සහතික කොට ප්‍රකාශ කරන තැනැත්තා මත රැඳේ.

අයිතිය සම්බන්ධයෙන් කරුණු සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය

**111.** එක් පාර්ශ්වකරුවකු අනිකා කෙරෙහි ඇඩි විශ්වාසයෙන් යුත් තත්ත්වයක සිට ක්‍රියා කිරීමෙන් පාර්ශ්වකරුවන් අතර වූ ගනු දෙනුවක සද්භාවය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති වූ විට ගනුදෙනුවේ සද්භාවය සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය ඇඩි විශ්වාසයෙන් යුතු තත්ත්වයෙහි සිටින පාර්ශ්වකරු මත රැඳේ.

එක් පාර්ශ්වයක් දැඩි විශ්වාසයකින් යුක්ත ව සිට කරන ලද ගනුදෙනුවල සද්භාවය සත්‍ය බැව් ඔප්පු කිරීම.

නිදර්ශන

(අ) සේවාදායකයකු විසින් නීතිඥයකුට කර තිබෙන විකිණීමක සද්භාවය සේවාදායකයා විසින් පවරන ලද නඩුවක දී විසඳිය යුතු ව ඇත. ගනුදෙනුවේ සද්භාවය සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය පියා මත රැඳේ.

(ආ) යන්තම් වියපැමිණි පුත්‍රයකු විසින් පියකුට කර තිබෙන විකිණීමක සද්භාවය පුත්‍රයා විසින් පවරන ලද නඩුවක දී විසඳිය යුතු ව ඇත. ගනුදෙනුවේ සද්භාවය සත්‍ය බැව් ඔප්පු කිරීමේ කාර්ය භාරය පියා මත රැඳේ.

**112.** ස්වකීය මව් හා යම් මිනිසකුත් අතර වූ වලංගු විවාහයක් පවතින කාලය තුළ දී හෝ එය අවලංගු වීමෙන් පසු දින දෙසිය අසූවක් ඇතුළත මව් අවිවාහක ව සිටින විට යම් තැනැත්තකුගේ උපත සිදුවීම ඒ තැනැත්තා එකී මිනිසාට දාව උපන් සුජාත පුත්‍රයා බවට තීරණාත්මක සාධක විය යුතු ය. එසේ නො වන්නේ ඒ තැනැත්තා පිළිබඳ ගනු ලැබිය හැකි කිසි විටෙක එකී මිනිසා මව සමග සම්බන්ධය නො පැවැත් වූ බව හෝ ඔහු ලිංගික බෙල හීනතාව යෙන් යුතු වූ බව පෙන්නුම් කළ හැකි නම් ය.

විවාහයක් පවතින කාලය තුළ සිදුවූ උපත සුජාත තත්ත්වය පිළිබඳ තීරණාත්මක සාධකයකි.

Scanned with CamScanner

**වයස අවුරුදු දොළහෙන් පහළ පිරිමි ළමයෙකුට ස්ත්‍රී දූෂණ ක්‍රියාවක යෙදිය නොහැකි යන පූර්ව නිගමනය.**

113. වයස අවුරුදු දොළහෙන් පහළ පිරිමි ළමයකුට ස්ත්‍රී දූෂණ ක්‍රියාවක යෙදිය නො හැකි බව නීතියේ බිඳ හෙළිය නො හැකි පූර්ව නිගමනයකි.

ඇතැම් කරුණු පැවැත්ම අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකිය.

114. විශේෂ අවස්ථාවේ කරුණු හා සම්බන්ධ ස්වභාවික සිදුවීම් වල සාමාන්‍ය පිළිවෙල ද, මිනිස් ගති පැවතුම් ද, හා පුද්ගලික වැඩ කටයුතු ද ගැන සැලකිල්ලක් දක්වමින් සිදුවීමට ඉඩ ඇතැයි අධිකරණය සිතන කරුණක පැවැත්ම අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකිය.

**නිදර්ශන**

අධිකරණය විසින් පහත දැක්වෙන පූර්ව නිගමන කළ හැකිය:—

(අ) සොරකම සිදු වූ ඉක්මනින් සොරකම් කරන ලද බඩු තම ස්වාමිත්වයේ තබා ගන්නා වූ මිනිසකු, තම ස්වාමිත්වයෙහි එකී බඩු තිබීම ගැන හේතු දැක්විය නො හැකි නම්, සොරා බව හෝ සොරා බඩු යයි දැන දැන ම එකී බඩු භාර ගෙන සිටින බව;

(ආ) සැලකිය යුතු කරුණුවල දි ඔහුගේ සාක්ෂි තහවුරු කරනු ලැබුවහොත් මිස නො එසේ ව අපරාධ සහායකයකුගේ සාක්ෂි විශ්වාස කිරීමට සුදුසු නො වන බව;

(ඇ) යම් දෙයක් හෝ දේවල තත්ත්වයක් සාමාන්‍ය වශයෙන් කෙළවර වන කාල සීමාවට වඩා කෙටි කාල සීමාවක් තුළ පවතින බව පෙන්නුම් කර ඇති විට, ඒ දෙය හෝ දේවල තත්ත්වය තවමත් පවතින බව බව;

(ඈ) අධිකරණ හා නිල කටයුතු ක්‍රමානුකූල ව ඉටු කර ඇති බව;

(ඉ) සාමාන්‍ය ක්‍රියා මාර්ගය විශේෂ අවස්ථාවන් හි අනුගමනය කර තිබෙන බව;

(ඊ) ඉදිරිපත් කළ හැකි, එහෙත් එසේ කරනු නොලබන සාක්ෂි ඉදිරිපත් කරනු ලැබුවහොත්, එය වලක්වා සිටින තැනැත්තාට අවැඩදායක විය හැකි බව;

(උ) යම් ප්‍රශ්නයකට පිළිතුරු දෙන ලෙස නීති මගින් තමාට බල කිරීමක් නො මැති කල, ඊට පිළිතුරු දීම මිනිසකු ප්‍රතික්ෂේප කළහොත්, පිළිතුරු දෙනු ලැබූ විට එය ඔහුට අවැඩදායක විය හැකි බව;

(ඌ) බැඳී සිටීමක් ඇති කරවන ලේඛනයක් බැඳී සිටින තැනැත්තා සතුව තිබෙන විට බැඳී සිටීමට නිදහස් කර ඇති බව.

එහෙත්. අධිකරණය ඉදිරිපිට පමුණුවා ඇති දෙයට එ බඳු සිද්ධාන්තයන් යෙදිය යුතු ද නැද්ද යන වග ගැන කල්පනා කිරීමේ දී පහත දැක්වෙන දේ වැනි කරුණු පිළිබඳව ද අධිකරණය සැලකිළිමත් විය යුතු ය:—

(අ) නිදර්ශනය පිළිබඳ ව—සොරකම් කරනු ලැබූ විගස ම සපයා ගත්, සලකුණු කරන ලද රුපියලක් වෙළෙඳසැලක් අයිතිකරුවකුගේ මුදල් පෙට්ටියේ ඇත. මෙය තම ස්වාමිත්වයට පැමිණියේ කෙසේ දැයි නියම වශයෙන් හේතු දැක්වීමට ඔහුට නො හැකි වුව ද තම වෙළෙඳාම කර ගෙන යන අතර නිරතුරු රුපියල් ගණනක් ම ඔහු භාර ගනී.

(ආ) නිදර්ශනය පිළිබඳ—ඇතැම් යන්ත්‍රෝපකරණ පිළියෙල කර තැබීමේ දී නො සැලකිලි ලෙස ක්‍රියා කිරීමක් හේතු කොට ගෙන මිනිසකුගේ මරණය සිදු කිරීම ගැන ඉතාම උසස් චරිතයක් ඇති තැනැත්තකු වන "ඒ" ට විරුද්ධව නඩු විසඳනු ලැබේ. එකී යන්ත්‍රෝපකරණ පිළියෙල කර තැබීමට සහභාගී වූ ද, එපමණට ම යහපත් චරිතයක් ඇති තැනැත්තකු වූ ද "බී" සිදු වූ දේ කුමක් දැ යි නිශ්චය වශයෙන් ම විස්තර කොට, "ඒ" ගේත් තමාගේත් පොදු නොසැලකිලි භාවය එත්තු ගනිමින් පැහැදිලි කරයි.

Scanned with CamScanner

(ඇ) නිදර්ශනය පිළිබඳව—කීප දෙනකු හවුල් වීමෙන් යම් අපරාධයක් සිදු කරනු ලැබේ. අපරාධකරුවන්ගෙන් තිදෙනකු වන "ඒ", "බී" හා "සී" එම ස්ථානයෙහි දී ම අල්ලා ගනු ලැබ, එකිනෙකාගෙන් වෙන්ව තබා ඇත. මේ එක් එක් කෙනෙක් "ඩී" ද සම්බන්ධ කරවමින් අපරාධය ගැන විස්තරයක් දෙයි. ඔවුන් ඊට පෙර එක්සත්ව ක්‍රියා කිරීමකට බෙහෙවින් ම ඉඩ නැති බව දක්වෙන පරිදි ඔවුන්ගේ විස්තර එකිනෙකට නහවුරු වේ.

(ඈ) නිදර්ශනය පිළිබඳ ව—පස් වසකට පෙර ගංගාවන් එක්තරා මාර්ගයකින් ගලා බස්ස බව ඔප්පු කරනු ලැබේ. එහෙත්, එහි මාර්ගය වෙනස් කර ලිය හැකි ජල ගැලීම ඒ කාලයෙන් පසු ඇති වූයේ ය යි දන ගන්නට ඇත.

(ඉ) නිදර්ශනය පිළිබඳ ව—ක්‍රමවත් ගාවය ප්‍රශ්නයට භාජන ව ඇති අධිකරණ ක්‍රියාවක් ඉතා විශේෂ කරුණු යෙදී ඇති අවස්ථාවකදී ක්‍රියාවේ යොදවන ලදී.

(ඊ) නිදර්ශනය පිළිබඳ ව—ප්‍රශ්නය නම් ලියුමක් ලැබුණේ ද යනු යි. එය තැපැල් කරන ලද බව පෙන්වනු ලබන නමුදු, කැළඹිලි හේතු කොට ගෙන තැපෑලෙන් ලියුම් යැවීමේ සාමාන්‍ය ක්‍රියා මාර්ගයට බාධා ඇති විය.

(උ) නිදර්ශනය පිළිබඳ ව—තමාට විරුද්ධ නවු පවරා ඇති මද වැදගත් කම කින් යුතු ගිවිසුමක් කෙරෙහි බලපෑවැත් විය හැකි ලේඛනයක් ඉදිරිපත් කිරීම මිනිසෙක් ප්‍රතික්ෂේප කරයි. එහෙත්, මේ ලේඛනයේ ස්වකීය පවුලේ අයවලුන්ගේ සිතුම් පැතුම් වලට ද කීර්තියට ද හානි ඇති විය හැකි ය.

(ඌ) නිදර්ශනය පිළිබඳ ව—පිළිතුරු සැපයීමට තමාට නීති මගින් බල කිරීමක් නැති ප්‍රශ්නයකට පිළිතුරු දීම, මිනිසෙක් ප්‍රතික්ෂේප කරයි. එසේ වුවද, එය අසනු ලබන කරුණකට සම්බන්ධ නො වන කරුණුවල දි එම ප්‍රශ්නයට ලැබිය යුතු පිළිතුරෙන් ඔහුට හානි සිදු විය හැකිය.

(ඍ) නිදර්ශනය පිළිබඳ ව—බැඳුම්කරයක් ඇත්තේ බැදි සිටින තැනැත්තාගේ ස්වාමින්වයේ ය. එහෙත් අවස්ථාවේ කරුණුවල අන්දමට ඔහු එය සොරකම් කරන්නට ඇත.

## X වැනි පරිච්ඡේදය

### ප්‍රතිබන්ධනය

115. එක් තැනැත්තකු තමාගේ ප්‍රකාශයකින්, ක්‍රියාවකින් හෝ නො කර හැරීමකින් යම් කාරණයක් සත්‍ය යයි විශ්වාස කිරීමට ද ඒ වැනි විශ්වාසයක් උඩ කටයුතු කිරීමට ද අන්‍ය තැනැත්තකු ඕනෑ කමින් ම පොළඹවා ඇති විට හෝ අන්‍ය තැනැත්තකුට අවසර දී ඇති විට තමා, සහ ඒ තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයා අතර ඇති වන යම් නඩුවක දි හෝ අධිකරණ කෘත්‍යයක දී එකී කාරණයේ සත්‍යතාවක් නැත යි කීමට ඔහුට හෝ ඔහුගේ නියෝජිතයාට අවසර නොලැබිය යුතු ය. ප්‍රතිබන්ධනය

නිදර්ශන

ඇතැම් ඉඩම් "ඒ" ට අයිති යයි "බී" විසින් විශ්වාස කරන ලෙස ඕනෑ කමිනුත් අසත්‍ය ලෙසත් "ඒ" ක්‍රියා කිරීමෙන් එය මිලයට ගැනීමටත් ඊට මුදල් ගෙවීමටත් "බී" පොළඹවනු ලැබේ.

ඉන් පසු මේ ඉඩම "ඒ" ගේ දේපළ බවට පත් වෙයි. ඉඩම විකුණනු ලබද්දී තමාට අයිතියක් නො තිබුණේ ය යන කරුණ ඉදිරිපත් කොට, විකිණීම අවලංගු කිරීමට "ඒ" වෙහෙස දරයි. අයිතිය පිළිබඳ ව තමාට ඇති අඩුපාඩුව සත්‍ය බැව් ඔප්පු කිරීමට ඔහුට අවසර නො ලැබිය යුතු ය.

බදුකරුගේ ප්‍රතිබන්ධනය.

**116.** නිශ්චල දේපළක කිසිම බදුකාරයකුට හෝ එ බඳු බදුකාරය කුගේ මාර්ගයෙන් හිමිකමක් දක්වන කිසිම තැනැත්තකුට, බද්ද වලංගු කාලය තුළදී, ඒ නිශ්චල දේපළට අයිතියක් ඒ බදුකාරයාගේ දේපළ හිමියාට බද්ද වලංගුවීම ආරම්භයේ දී නොතිබුණු බැව් කීමට අවසර නො ලැබිය යුතු ය.

ස්වාමිත්වයෙහි ඇති තැනැත්තාගෙන් අවසර ලත් අයගේ ප්‍රතිබන්ධනය.

යම් නිශ්චල දේපළක ස්වාමිත්වය ඇති තැනැත්තාගේ අවසරයෙන් ඒ දේපළට පැමිණි කිසිම තැනැත්තකුට, එබඳු අවසරයක් දෙන විට ඒ දේපළෙහි ස්වාමිත්වය ලැබීමට ඒ තැනැත්තාට කිසි අයිතියක් නොතිබුණු බැව් කීමට ඉඩ නො ලැබිය යුතු ය.

බඩු බාරගන්නා ආදීන්ගේ ප්‍රතිබන්ධනය.

**117.** තමාට බඩු භාර කළ යම් බඩු භාර දුන් අයට, ප්‍රධානයාට හෝ අවසර දුන් තැනැත්තාට බඩු බාහිරාදිය පිළිබඳව හිමිකමක් බඩු භාර දුන් අවස්ථාවේ නොතිබුනු බැව් ප්‍රකාශ කිරීමට පිළිවෙලින් බඩු භාරගන්නා අයකුට, නියෝජිතයකුට හෝ අවසර ලත් තැනැත්තකුට අවසර නො ලැබිය යුතු ය.

එසේ වුව ද, බඩු භාර දුන් තැනැත්තාට, ප්‍රධානයාට හෝ අවසර දුන් තැනැත්තාට විරුද්ධව බඩු බාහිරාදියට අයිතිවාසිකමක් ඇති යම් තැනැත්තකුට ඒ බඩු කිසිවක් බාර දීමට තමාට බල කරන ලදැයි ද, නැතහොත්, බඩු බාර දුන් තැනැත්තා, ප්‍රධානයා හෝ අවසර දුන් තැනැත්තා අයුතු ලෙස ද, බඩු බාර ගන්නා තැනැත්තාට, නියෝජිතයාට හෝ අවසර ලත් තැනැත්තාට දැන්වීමක් නොමැති ව ද, බඩු බාරගන්නා තැනැත්තාගෙන්, නියෝජිතයාගෙන් හෝ අවසර ලත් තැනැත්තාගෙන් එකී බඩු ඉල්ලා ඉදිරිපත් වී සිටින තුන්වෙනි පුද්ගලයෙකුගෙන් ඒවා ලබා ගත් බව බඩු බාර ගන්නා තැනැත්තකු නියෝජිතයකු හෝ අවසර ලත් තැනැත්තකු විසින් පෙන්නුම් කළ හැකි ය.

## XI වැනි පරිච්ඡේදය

### සාක්ෂිකරුවෝ

සාක්ෂි දියහැක්කේ කවුරුන් විසින් ද ?

**118.** සියලු තැනැත්තන්, ලාබාල වයස, අධික මහලු වයස, ශාරීරික හෝ මානසික ආබාධ හෝ එම වර්ගයේ අන් කිසි හේතුවක් නිසා තමන්ගෙන් අසනු ලබන ප්‍රශ්න අවබෝධ කර ගැනීමට ද එකී ප්‍රශ්නවලට කල්පනාවෙන් පිළිතුරු සැපයීමට ද නො හැකි ය යි අධිකරණය කල්පනා කරතොත් මිස, නො එසේ ව සාක්ෂි දීමට සුදුස්සන් විය යුතු ය.

පැහැදිළි කිරීම—තමාගේ උමතුව නිසා තමාගෙන් අසනු ලබන ප්‍රශ්න අවබෝධ කර ගැනීමට ද ඒවාට කල්පනාවෙන් පිළිතුරු සැපයීමට ද බාධා පැමිණේ නොත් මිස එසේ වූ විට උමතු අයත් සාක්ෂි දීමට නුසුදුසු නොවේ.

Scanned with CamScanner

**119.** කථා කිරීමට නුපුළුවන් සාක්ෂිකරුවකු විසින් ලියවිලි හෝ සලකුණු වැනි, තම සාක්ෂිය තේරුම් ගත හැකි තත්ත්වයට පමුණුවා ලිය හැකි අන් කිසි අන්දමකින් තම සාක්ෂිය දිය හැකි ය. එහෙත් එබඳු ලියවිලි ලියනු ලැබීම හා සලකුණු පෙන්වනු ලැබීම අධිකරණය ඉදිරියේ විවෘත ලෙස කළ යුතු ය. එ ලෙස දෙනු ලබන සාක්ෂි කථිත සාක්ෂි ලෙස සැලකිය යුතු ය. ගොළු සාක්ෂිකරුවෝ.

**120.** (1) සියලු සිවිල් නඩුවලදී නඩුවේ පාර්ශ්වකරුවන් සහ නඩුවේ යම් පාර්ශ්වයක ස්වාමි පුරුෂයා හෝ භාර්යාව ද සුදුසු සාක්ෂිකරුවන් විය යුතුය. සුදුසු සාක්ෂිකරුවෝ.

(2) යම් තැනැත්තකුට විරුද්ධ ව පවරා ඇති අපරාධ නඩුවල දී පිළිවෙලින් එබඳු තැනැත්තකුගේ ස්වාමි පුරුෂයා හෝ භාර්යාව, විත්තිකරු විසින් කැඳවනු ලැබුවහොත්, සුදුසු සාක්ෂිකරුවකු විය යුතු ය. එහෙත් එවැනි අවස්ථාවක දී ඔවුන් අතර හුවමාරු වන සියලු ලියුම් කියුම්වලට විශේෂ වරප්‍රසාද හිමි වීම නතර විය යුතු ය.

(3) තම භාර්යාවට හෝ ස්වාමි පුරුෂයාට කරන ලද ශාරීරික පීඩාවක් හෝ සාහසික ක්‍රියාවක් සම්බන්ධයෙන් ස්වාමි පුරුෂයකුට හෝ භාර්යාවකට විරුද්ධව පවරා ඇති අපරාධ නඩුවල දී එබඳු භාර්යාව හෝ ස්වාමි පුරුෂයා සුදුසු වූත් බල කළ හැකි වූත්, සාක්ෂිකරුවකු විය යුතු ය.

(4) තම භාර්යාවට හෝ ස්වාමි පුරුෂයාට යම් ශාරීරික පීඩාවක් හෝ සාහසික ක්‍රියාවක් සිදු කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් ස්වාමි පුරුෂයකුට හෝ භාර්යාවකට විරුද්ධව පවරා ඇති අපරාධ නඩුවල දී එබඳු භාර්යාව හෝ ස්වාමි පුරුෂයා පැමිණිලි පක්ෂය වෙනුවෙන් සුදුසු සාක්ෂිකරුවකු විය යුතු ය.

(5) දණ්ඩ නීති සංග්‍රහයේ අංක 362 "ආ" හෝ 362 "ඇ" දරන වගන්තිය යටතේ දඬුවම් පැමිණ විය හැකි වරදක් සම්බන්ධයෙන් ස්වාමි පුරුෂයකුට හෝ භාර්යාවකට විරුද්ධව පවරා ඇති අපරාධ නඩුවල දී විත්තිකරුගේ භාර්යාව හෝ ස්වාමි පුරුෂයා පැමිණිලි පක්ෂය වෙනුවෙන් සුදුසු සාක්ෂිකරුවකු විය යුතු ය.

(6) අපරාධ නඩු විසදීම්වලදී විත්තිකරු තමා වෙනුවෙන් සාක්ෂි දීමට සුදුස්සකු විය යුතු ය. එ මෙන් ඔහු විසින් අන් කිසි සාක්ෂිකරුවකු මෙන්, සමාන ආකාරයෙන් ම ද සමාන ප්‍රතිඵල සහිත ව ද සාක්ෂි දිය හැකිය. එසේ වුවද, යෝජිත හරස් ප්‍රශ්න ඇසීමට අන් කිසි සාක්ෂිකරුවකු සම්බන්ධයෙන් අවසර දිය හැකි වුව ද, හරස් ප්‍රශ්න ඇසීම විත්තිකරුගේ විශ්වාසය පිළිබඳ ව වන විට, අධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි, හරස් ප්‍රශ්න ඇසීම සුදුසු ප්‍රමාණයකට සීමා කළ හැකි ය.

**121.** ඉහළ අධිකරණයක විනිශ්චයකරුවකුගේ විශේෂ ආඥාවක් ඇති ව මිස එසේ නොවන කල්හි කිසිම විනිශ්චයකරුවකුට හෝ සුළු අපරාධ විනිශ්චයකරුවකුට තමා එබඳු විනිශ්චයකරුවකු හෝ සුළු අපරාධ විනිශ්චයකරුවකු වශයෙන් අධිකරණයෙහි දී තම හැසිරීම සම්බන්ධයෙන් හෝ එ බඳු විනිශ්චයකරුවකු හෝ . සුළු විනිශ්චයකරුවන් හා සුළු අපරාධ විනිශ්චයකරුවන්

අපරාධ විනිශ්චයකරුවකු වශයෙන් අධිකරණයෙහි දී තමාට දැන ගන්නට ලැබුණු යම් දෙයක් සම්බන්ධයෙන් යම් ප්‍රශ්නවලට පිළිතුරු සපයන ලෙස බල කළ යුතු නො වේ. එහෙත් ඔහු එලෙස ක්‍රියා කරද්දී ඔහු ඉදිරිපිට දී සිදු වූ වෙනත් කරුණු සම්බන්ධයෙන් ඔහු ගෙන් විමසිය හැකි ය.

නිදර්ශන

(අ) දිවුරුම් සාක්ෂියක් සුළු අපරාධ විනිශ්චයකරුවකුවූ "බී" විසින් අනිසි ලෙස සටහන් කර ගන්නා ලදැයි ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට දී කෙරෙන තම නඩු විසඳීමේ දී "ඒ" පවසයි. විනිශ්චයකරුගේ විශේෂ අාඥාව ඇතිව මිස, නො එසේ ව, මේ සම්බන්ධයෙන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන ලෙස "බී" ට බල කළ නොහැකි ය.

(ආ) සුළු අපරාධ විනිශ්චයකාර "බී" ඉදිරිපිට දී බොරු සාක්ෂි දෙන ලදැයි "ඒ" ප්‍රදේශ අධිකරණය ඉදිරිපිට චෝදනා ලැබ සිටි, ප්‍රදේශ විනිශ්චය කරුගේ විශේෂ අාඥාව ඇතිව මිස නො එසේ ව "ඒ" පැවසුවේ කුමක් දැයි "බී" ගෙන් විමසිය නො හැකි ය.

(ඇ) ප්‍රදේශ විනිශ්චයකාර "බී" ඉදිරිපිට තම නඩු විසඳීමේ දී පොලිස් නිලධාරියකු මැරීමට තැත් කිරීම ගැන ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට "ඒ" චෝදනා ලැබ සිටී. කුමක් සිදු වූයේ ද යන්න පිළිබඳ ව "බී" ගෙන් විමසිය හැකි ය.

විවාහ කාලය තුළ දන්වනු ලබන නිවේදන.

122. විවාහ වී සිටින හෝ විවාහ වී සිටි යම් තැනැත්තකු වෙත තම විවාහ කාලය තුළ තමා විවාහ වී සිටින හෝ විවාහ වී සිටි අය විසින් දන්වනු ලබන කිසි ම නිවේදනයක් අනාවරණය කරන ලෙස ඔහුට බල නො කළ යුතු ය. එම නිවේදනය දැන්වූ තැනැත්තා හෝ ඔහුගේ සම්බන්ධතාව නියෝජනය කරන්නා කැමති වේ නම් මිස නො එසේ ව, එ බඳු නිවේදනයක් අනාවරණය කරන ලෙස ද ඔහුට අවසර නො දිය යුතු ය. මෙය අදාළ නො වන්නේ විවාහ වූ තැනැත්තන් අතර නඩුවලදී හෝ විවාහ වූ එක් තැනැත්තකුට කරන ලද අපරාධයක් සම්බන්ධයෙන් අනෙකාට විරුද්ධ ව නඩු පවරනු ලබන නීති කෘත්‍යවල දී සහ අංක 120 (2) දරන වගන්තියේ සඳහන් නඩුවලදීත් ය.

රාජ්‍යයේ කටයුතු පිළිබඳ සාක්ෂි.

123. ඇමතිවරයාගේ පාලනයට යටත්ව, සුදුසු යයි අවසරය දෙන හෝ නො දෙන කාරණයට සම්බන්ධ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තන්ත්වයෙහි සිටින්නා වූ නිලධාරි තැනගේ අවසරය ඇතිව මිස එ සේ නොමැති ව, රාජ්‍යයේ කටයුත්තකට සම්බන්ධ කිසි ප්‍රසිද්ධ නො කරන ලද යම් නිල ලේඛන ඉදිරිපත් කිරීමට හෝ එයින් ලබා ගන්නා ලද යම් සාක්ෂියක් දීමට කිසිවකුට අවසර නො දිය යුතු ය.

රාජකාරී පිළිබඳ ලියුම් කියුම්.

124. නිල කටයුතු පිළිබඳ විශ්වාසයකින් යුක්තව තමා වෙත දන්වන ලද ලියුම් කියුම් අනාවරණය කිරීමෙන් මහජන යහපතට හානියක් පැමිණිය හැකි ය යි තමා, කල්පනා කරන විට, ඒවා අනාවරණය කිරීමට කිසි ම රජයේ නිලධාරියකුට බල නො කළ යුතු ය.

Scanned with CamScanner

**125.** යම් අපරාධයක් කිරීම පිළිබඳ තොරතුරු තමා දැන ගන්නා ලද්දේ කොතැනකින් ද යනු පවසන ලෙස කිසි සුලු අපරාධ විනිශ්චයකරුවකුට හෝ පොලිස් නිලධාරියකුට බල නො කළ යුතු ය. එ මෙන් ම රාජ්‍ය ආදායම් මාර්ගවලට හෝ සුරාබදු නීති වලට විරුද්ධ ව කරන ලද යම්කිසි අපරාධයක් පිළිබඳ ව යම් තොරතුරක් තමා දැන ගන්නා ලද්දේ කොතැනකින් ද යනු පවසන ලෙස කිසි ආදායම් නිලධාරියකුට බල නො කළ යුතුය. අපරාධ කිරීම පිළිබඳ තොරතුරු.

පැහැදිලි කිරීම.—මේ වගන්තියෙහි "ආදායම් නිලධාරි" යන්නෙන් අදහස් වන්නේ රාජ්‍ය ආදායමේ යම් අංශයක හෝ එකී අංශයේ කටයුතුවල නැතහොත් රජයේ යම් ගොවිපළක හෝ එහි කටයුතුවල නියුක්තව සිටින්නා වූ යම් නිලධාරියෙකි.

**126.** (1) අධිනීතිඥයකු, නීතිඥයකු හෝ නොතාරිස් කෙනෙකු, වශයෙන් තම සේවය කර ගෙන යද්දී හෝ එම සේවයේ කාර්යය සඳහා ස්වකීය සේවාදායකයා විසින් හෝ ඔහු වෙනුවෙන් තමා වෙත දන්වන ලද යම් ලියුම් කියුම් සේවාදායකයාගේ ප්‍රකාශිත කැමැත්ත ඇති ව මිස නො එසේ ව, අනාවරණය කිරීමට හෝ ස්වකීය වෘත්තීය සේවය කර ගෙන යද්දී හෝ එම සේවයේ කාර්යය සඳහා තමා දැන ගත් යම් ලේඛනයක අන්තර්ගත කරුණු හෝ කොන්දේසි සඳහන් කිරීමට හෝ, එම සේවය කර ගෙන යද්දී හෝ එම සේවයේ කාර්යය සඳහා තමා විසින් තම සේවාදායකයාට දෙන ලද යම් අවවාදයක් අනාවරණය කිරීමට කිසි ම නීතිඥයකුට, අධිනීතිඥයකුට හෝ නොතාරිස් කෙනකුට කිසි විටෙක අවසර නොදිය යුතු ය. වෘත්තීය නිවේදනය

එසේ වුව ද, මේ වගන්තියෙහි සඳහන් කිසිවක් නිසා පහත දැක්වෙන දේ අනාවරණය වීම වළක්වා, ලිය යුතු නො වේ:—

(අ) යම් නීති විරෝධී කාර්යයක් සාර්ථක කර ගැනීම සඳහා කරනු ලබන එ බඳු යම් ලියුම් කියුම්;

(ආ) යම් අධිනීතිඥයකු, නීතිඥයකු හෝ නොතාරිස් කෙනෙකු විසින් එ බඳු සේවයක නියුක්ත ව සිටිද්දී නිරීක්ෂණය කරන ලද, එසේ සේවය ආරම්භ වීමෙන් පසු යම් අපරාධ යක් හෝ වංචාවක් සිදු කර ඇතැයි දක්වන්නා වූ කරුණක්,

(2) එ බඳු අධිනීතිඥයකුගේ, නීතිඥයකුගේ හෝ නොතාරිස් කෙනෙකුගේ සැලකිල්ල ස්වකීය සේවාදායක විසින් හෝ ඔහු වෙනුවෙන් එ බඳු කරුණක් කෙරෙහි යොමු කරන ලද්දේ ද නැද්ද යන වග නොවැදගත් ය.

පැහැදිලි කිරීම—මේ වගන්තියෙහි සඳහන් බැඳී සිටීම සේවය කෙළවර වීමෙන් පසු ද පවතී.

නිදර්ශන

(අ) සේවාදායකයකු "ඒ" නීතිඥයකු වූ "බී" ට මෙසේ කියයි: "මා විසින් කූට ලේඛන තනා තිබේ. මාගේ නිදහස දක්වීමට ඔබ පෙනී සිටිතියි කැමැත්තෙන් සිටිමි."



Scanned with CamScanner

වරදකරුවෙක් යයි දැන ගනු ලබන මිනියකුගේ නිදහස දක්වීමට පෙනී සිටීම සාපරාධී කාර්යයන් නොවන හෙයින්, මේ දන්වා සිටීම එළිදරව් කිරීමෙන් ආරක්ෂා වේ.

(ආ) සේවාදායකයකුවූ "ඒ", නීතිඥයකු වූ "බී" ට මෙසේ කියයි: "කූට ලෙස තනා ඇති ඔප්පුවක ආධාරයෙන් දේපළක ස්වාමිත්වය ලබා ගැනීමට මම කැමති වෙමි. මේ ඔප්පුව පිට නඩු පවරන ලෙස ඔබගෙන් ඉල්ලා සිටිමි."

සාපරාධී කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා කරනු ලබන හෙයින්, මේ දන්වා සිටීම එළිදරව් කිරීමෙන් ආරක්ෂා නොවේ.

(ඇ) වංචනික ප්‍රයෝජන ගැනීම ගැන චෝදනා ලැබ සිටින "ඒ" තම නිදහස දක්වීමට පෙනී සිටින ලෙස නීතිඥයකුවූ "බී" පත් කරයි. වංචනික ව ප්‍රයෝජන ගත්තා ලදැයි කියනු ලබන මුදල් ප්‍රමාණය ගැන "ඒ" ට චෝදනා පමුණුවමින් "ඒ" ගේ ගණන් පොතේ "බී" ගේ සේවය ආරම්භ වූ විට නො තිබුණු සටහනක් කර ඇති බව නඩු විභාගයේ දී "බී" ට පෙනී යයි.

ස්වකීය සේවය කර ගෙන යද්දී "බී" ගේ දර්ශනයට ලක් වූ මේ කරුණ, නඩු විභාගය ආරම්භ වීමෙන් පසු වංචාවක් කර ඇති බව පෙන්වන්නක් හෙයින්, එය එළිදරව් කිරීමෙන් ආරක්ෂා නොවේ.

126 වෙනි වගන්තිය, අධිනීතිඥයින්ගේ, නීතිඥයින්ගේ හා නොතාරිස් වරුන්ගේ ලිපි කරුවනට හා මෙහෙකරුවනට අදාළ වීම.

**127.** 126 වෙනි වගන්තියේ විධිවිධාන තෝල්කවරුන්ට ද, අධිනීතිඥයින්ගේ, නීතිඥයින්ගේ හා නොතාරිස්වරුන්ගේ ලිපිකරුවනට හෝ මෙහෙකරුවනට ද අදාළ විය යුතු ය.

සිය කැමැත්තෙන්ම සාක්ෂි දීමෙන් වරප්‍රසාදය අත් නොහරිනු ලැබීම.

**128.** නඩුවක යම් පාර්ශ්වකරුවකු සිය කැමැත්තෙන් ම හෝ අන් අයුරෙකින් එහි සාක්ෂි දෙතොත්, 126 වෙනි වගන්තියෙහි සඳහන් අන්දමේ එළිදරව් කිරීමකට ඔහු සිය කැමැත්ත ප්‍රකාශ කළේ යැයි සලකනු නො ලැබිය යුතු ය. නඩුවක හෝ නීති කෘත්‍යයක යම් පාර්ශ්වකරුවකු එ බඳු යම් අධිනීතිඥයකු, නීතිඥයකු හෝ නොතාරිස් කෙනකු සාක්ෂිකරුවකු ලෙස නම් කළ හොත්, එ බඳු එළිදරව් කිරීමකට ඔහු තම කැමැත්ත ප්‍රකාශ කෙළේ ය යි සලකනු ලැබිය යුත්තේ, එ බඳු ප්‍රශ්න නිසා නො වේ නම්, එළිදරව් කිරීමට ඔහුට නිදහස නැති විය හැකි කරුණු සම්බන්ධයෙන් එ බඳු අධිනීතිඥයකුගෙන්, නීතිඥයකුගෙන් හෝ නොතාරිස් කෙනකුගෙන් ඔහු ප්‍රශ්න කළ හොත් පමණකි.

නීති උපදේශක යන් හා කරන රහසිගත ලියුම් කියුම්.

**129.** තමා සහ තම නීති උපදේශකයන් ද අතර ගනුදෙනු වූ රහසිගත ලියුම් කියුම් අධිකරණයට එළිදරව් කරන ලෙස සාක්ෂිකරුවකු ලෙස ඉදිරිපත් නොවුවහොත්, කිසිවකුට බල නො කළ යුතු ය. ඔහු එසේ ඉදිරිපත් වුවහොත් ඔහු විසින් දෙන ලද යම් සාක්ෂියක් විස්තර කිරීම සඳහා දැන ගත යුතු යයි අධිකරණයට එළිදරව් කිරීම අවශ්‍ය ලෙස පෙනෙන යම් ලියුම් කියුම් පමණක් එළිදරව් කරන ලෙස, ඔහුට බල කළ හැකි ය. අන් කිසිවක් එළිදරව් නො කළ යුතු ය.

Scanned with CamScanner

*සාක්ෂිකරුගේ අයිතිය දක්වන ඔප්පු ඉදිරිපත් කිරීම*

**130.** (1) යම් දේපළකට තම අයිතිය දක්වන ඔප්පු, හෝ යම් ලේඛනයක බලය පිට යම් දේපළක් ඔඩපණ හිමියා හෝ උකස්හිමියා වශයෙන් අයිති කර ගෙන සිටියදී, එම ලේඛනය හෝ, ඉදිරිපත් කරනු ලැබීමෙන් තමා පිට වරද පැමිණ විය හැකි යම් ලේඛනයක්, එ බඳු ඔප්පු ඉදිරිපත් කරවීමට නැත් කරන තැනැත්තා සමග හෝ, යම් තැනැත්තකුගේ මාර්ගයෙන් අයිතිවාසිකම් කියා සිටී ද ඒ තැනැත්තා සමග ලිපිගත ගිවිසුමකට බැඳී ඇති නම් මිස, නො එසේ නම් ඉදිරිපත් කරන ලෙස නඩුවක පාර්ශ්වකරුවකු නො වූ කිසි සාක්ෂි කරුවකුට බල නො කළ යුතු ය.

*නඩුවේ පාර්ශව කරුවකු විසින් ඉදිරිපත් කරනු ලැබීම.*

(2) තම ස්වාමිත්වයේ තිබෙන හෝ තමාගේ බලය පිට පවතින යම් ලේඛනයක්, එය ඉදිරිපත් කරවීමට වුවමනා පාර්ශ්වයේ නඩුවට අනුකූල නො වන කල, හෝ අවශ්‍ය නො වන කල, එය ඉදිරිපත් කරන ලෙස නඩුවේ පාර්ශ්වකරුවකු වන කිසි සාක්ෂිකරුවකු නො බැඳිය යුතු ය.

*බැංකුකරුවකුගේ පොත්.*

(3) යම් බැංකුවක් යම් අධිකරණ කෘත්‍යයක පාර්ශ්වකරුවකු නො වන කල, ඒ බැංකුවේ ගණන් පොත් ඉදිරිපත් කරන ලෙස 90 "ඇ" වෙනි වගන්තියේ විධිවිධාන අනු ව මිස කිසි බැංකුවකට බල නො කළ යුතු ය.

*ස්වාමිත්වය ඇති තවත් තැනැත්තකු විසින් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ලේඛන ඉදිරිපත් කිරීම.*

**131.** අඳුනා ගැනීමේ කාර්‍යය සඳහා හැර තමාගේ ස්වාමිත්වයෙහි තිබුණේ නම්, ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට අන් කිසි තැනැත්තකු හිමිකම් ලැබිය හැකි වූ ද, තමාගේ ස්වාමිත්වයෙහි පවත්නා වූ ද, ලේඛන ඉදිරිපත් කිරීමට තමා එකඟ නම් මිස ඉදිරිපත් කරන ලෙස කිසිවකුට බල නො කළ යුතු ය. එ මෙන් ම ලේඛනයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හිමිකම් ලබා සිටින කිසිවකුට එහි අන්තර්ගත කරුණු පිළිබඳ කථිත සාක්ෂි දෙන ලෙස බල නො කළ යුතු ය.

*පිළිතුරෙන් තමා පිට චෝදනා පැවරිය හැකිය යන්න හේතු කොට ගෙන පිළිතුරු නොදීම සාක්ෂිකරුගේ සමාවට හේතු නොවේ.*

**132.** (1) යම් නඩුවකදී හෝ සිවිල් හෝ අපරාධ නඩු විභාගයකදී ඉදිරිපත් කරුණට අනුකූල යම් කරුණක් සම්බන්ධයෙන්, යම් ප්‍රශ්නයකට ලැබෙන පිළිතුරෙන් සාක්ෂිකරු පිට චෝදනා පැවරේ ය යි හෝ, නියම් ලෙසින් හෝ අනියම් ලෙසින් එසේ වීමට ඉඩ සැලසේ ය යි හෝ, යම්කිසි ආකාරයක දණ්ඩනයකට හෝ අහිමි වීමකට සාක්ෂිකරු යටත් වේ ය යි හෝ නියම ලෙසින් හෝ අනියම් ලෙසින් එසේ වීමට ඉඩ සැලසේ ය යි හෝ ඔහු විසින් ණයක් ගෙවිය යුතු ය යනු ඔප්පු වේ ය යි හෝ ඔප්පු කිරීමට ඉඩ සැලසේ ය යි හෝ මහ රැජිනගේ හෝ අන් කිසි තැනැත්තකුගේ මෙහෙයීමෙන් ඇති වන සිවිල් නඩුවකට වෙන අන්දමකින් යටත් වේ ය යි හේතු කොට ගෙන එම ප්‍රශ්නයට පිළිතුරු නො දීම සාක්ෂිකරුවකුගේ සමාවට හේතු නො වේ.

*එබඳු පිළිතුරු සැපයීම ගැන නඩු පවරනු ලැබීමට යටත් නොවීම.*

(2) අධිකරණය විසින් දෙන ලෙස සාක්ෂිකරුවකු වෙත බල කරනු ලබන කිසි පිළිතුරක් නිසා යම් අන්දමේ සිරභාරයකට ගැනීමකට හෝ නඩු පවරනු ලැබීමකට ඔහු යටත් නො විය යුතුය. එ බඳු පිළිතුරකින් බොරු සාක්ෂි දීම ගැන නඩු පවරනු ලැබීමක් හැරුණු විට, කිසි අපරාධ නඩු විභාගයක දී එවැන්නක් ඔහුට විරුද්ධව ඔප්පු නො කළ යුතු ය.

(3) වෙනි උප වගන්තිය අධිකරණය විසින් පැහැදිලි කරදිය යුතුය.

(3) යම් ප්‍රශ්නයකට ලැබෙන පිළිතුරකින් යම් සාක්ෂිකරුවකු පිට චෝදනා පැවරෙන්නේ නම් හෝ නියම ලෙසින් හෝ අනියම් ලෙසින් එ සේ වීමට ඉඩ සැලසෙන්නේ නම්, එ බඳු ප්‍රශ්නයකට පිළිතුරු සපයන ලෙස සාක්ෂිකරුවකුට බල කිරීමට ප්‍රථමයෙන්, මෙහි ඉහතින් සඳහන් උප වගන්තියේ අදහස අධිකරණය විසින් සාක්ෂිකරුට පැහැදිලි කර දිය යුතු ය.

අපරාධ සහායක.

133. අපරාධ සහායකයකු චෝදනා ලැබ සිටින තැනැත්තාට විරුද්ධව සාක්ෂි දීමට සුදුසු සාක්ෂිකරුවකු විය යුතු අතර, යමකු වරදකරු බැව් ඔප්පු වීම, අපරාධ සහායකයකුගේ තහවුරු නො කළ සාක්ෂියෙන් පැන නැගී ඇති පමණින් නීති විරෝධි නො වේ.

සාක්ෂිකරුවන්ගේ ගණන.

134. කවර නඩුවකදී වුවද යම් කරුණක් සත්‍ය බැව් ඔප්පු කිරීම සඳහා සාක්ෂිකරුවන් එක්තරා ගණනක් වුවමනා නො විය යුතු ය.

## XII වැනි පරිච්ඡේදය

### සාක්ෂිකරුවන් විමසීම

සාක්ෂිකරුවන් ඉදිරිපත් කරවීමේ හා විමසීමේ පිළිවෙල.

135. සාක්ෂිකරුවන් ඉදිරිපත් කරවනු ලබන හා විමසනු ලබන පිළිවෙළ, පිළිවෙළින් සිවිල් සහ අපරාධ නඩු පිළිබඳ කාර්‍ය්‍ය පරිපාටියට අදාළ ව තත් කාලයෙහි වලංගුව පවත්නා නීතිය සහ ක්‍රියා පිළිවෙළ මගින් ක්‍රමවත් විය යුතුය. එබඳු නීතියක් නොමැති කල අධිකරණයේ අභිමතය අනු ව මෙය ක්‍රමවත් විය යුතු ය.

සාක්ෂි බාරගත හැකි ද විනිශ්චයකරු තීරණය කළ බව

136. (1) යම් කරුණක් ගැන සාක්ෂි දීමට දෙ පක්ෂයෙන් එක් පක්ෂයක් යෝජනා කරන විට, ගෙන පාන කාරණය, සත්‍ය බැව් ඔප්පු වුවහොත් අනුකූලව විය හැක්කේ කවර ආකාරයකින් ද යනු සාක්ෂි දීමට ඉදිරිපත් වන පක්ෂයෙන් විනිශ්චයකරු විසින් විමසිය හැකි ය. කාරණය සත්‍ය බැව් ඔප්පු වුවහොත්, එය අනුකූල වනු ඇතැ යි තමාට හැඟී යන්නේ නම් විනිශ්චයකරු විසින් සාක්ෂිය බාරගත යුතු ය. නො එ සේ නම් බාර නො ගත යුතු ය.

(2) සත්‍ය බැව් ඔප්පු කිරීමට යෝජනා කර තිබෙන කරුණ පිළිබඳ සාක්ෂි බාරගත හැකි වන්නේ අන් කිසි කරුණක් සත්‍ය බැව් ඔප්පු වීමෙන් පසු ව පමණක් නම්, පළමුකොට සඳහන් කරුණ සම්බන්ධයෙන් සාක්ෂි දීමට පෙර, පසුව සඳහන් කරුණ සත්‍ය බැව් ඔප්පු කළ යුතු ය. මෙ සේ නො වන්නේ සාක්ෂිය දීමට ඉදිරිපත් වන පක්ෂය එ බඳු කරුණක් ගැන සාක්ෂි දීමට පොරොන්දු වෙතොත් හා එ බඳු පොරොන්දුවක් ගැන අධිකරණය තෘප්තියට පත් වුවහොත් ය.

(3) ගෙන පාන එක් කරුණක අනුකූලතාව ගෙන් පාන තවත් කරුණක් පළමුකොට සත්‍ය බැව් ඔප්පු කිරීම මත රඳා පවත්නේ නම්, දෙවෙනි කරුණ සත්‍ය බැව් ඔප්පු කිරීමට පෙර, පළමු කරුණ ගැන සාක්ෂි දීමට අවසර දෙන්නට හෝ, පළමු කරුණ ගැන සාක්ෂි දීමට පෙර දෙ වෙනි කරුණ ගැන සාක්ෂි දීම අවශ්‍ය ය යි කියා සිටීමට තම අභිමතය පරිදි විනිශ්චයකරුට හැකි ය

**නිදර්ශන**

(අ) මියගිය කෙනෙකු යි කියනු ලබන තැනැත්තකු විසින් අනුකූල කරුණක් සම්බන්ධයෙන් කර ඇති ප්‍රකාශයක් සත්‍ය බැව් ඔප්පු කිරීමට යෝජනා කෙරේ. මේ ප්‍රකාශය 32 වෙනි වගන්තිය යටතේ අනුකූල වේ.

ප්‍රකාශය සත්‍ය බැව් ඔප්පු කිරීමට අදහස් කරන තැනැත්තා විසින් ප්‍රකාශය ගැන සාක්ෂි දීමට පෙර, යථෝක්ත තැනැත්තා නැසී ගිය කෙනෙකු බව සත්‍ය බැව් ඔප්පු කළ යුතු ය.

(ආ) නැති වී ය යි කියනු ලබන ලේඛනයක අන්තර්ගත කරුණු එහි පිටපතක ආධාරයෙන් සත්‍ය බැව් ඔප්පු කිරීමට යෝජනා කෙරේ.

පිටපත ඉදිරිපත් කිරීමට අදහස් කරන තැනැත්තා විසින්, පිටපත ඉදිරිපත් කිරීමට පෙර, මුල් පිටපත නැතිවූ බව සත්‍ය බැව් ඔප්පු කළ යුතු ය.

(ඇ) හොර බඩු බව දැන දැන ම, සොරකම් කරන ලද දේපළ භාර ගත්තා ලදැ යි "ඒ" චෝදනා ලැබ සිටී.

මේ දේපළ තම ස්වාමිත්වයේ නැතැයි ඔහු පැවසූ බව සත්‍ය බැව් ඔප්පු කිරීමට යෝජනා කෙරේ.

නැතැයි කීමේ අනුකූලත්වය දේපලේ අනන්‍යතාව මත රඳා පවතී. දේපළ එකී ස්වාමිත්වයේ නැතැ යි කීම සත්‍ය බැව් ඔප්පු කරනු ලැබීමට පෙර එය හඳුනා ගනු ලැබීම අවශ්‍ය ය යි ඉල්ලා සිටින්නට හෝ, දේපළ හඳුනාගනු ලැබීමට පෙර එය එකී ස්වාමිත්වයේ නැතැ යි කීමට අවසර දෙන්නට තම අභිමතය පරිදි අධිකරණයට හැකි ය.

(ඈ) ඉදිරිපත් කරුණක හේතුව හෝ ප්‍රතිඵලය වූයේ යයි කියනු ලබන "ඒ" නමැති කරුණක් සත්‍ය බැව් ඔප්පු කිරීමට යෝජනා කෙරේ. ඉදිරිපත් කරුණේ හේතුව හෝ ප්‍රතිඵලය වශයෙන් "ඒ" නමැති කරුණ සැලකිය හැකි වීමට පෙර "බී", "සී" හා "ඩී" යන අන්තර් කරුණු කීපය පවතින බව දැක්විය යුතු ය. "බී", "සී" හා "ඩී" යන කරුණු සත්‍ය බැව් ඔප්පු කිරීමට පෙර "ඒ" සත්‍ය බැව් ඔප්පු කිරීමට අවසර දෙන්නට හෝ, "ඒ" සත්‍ය බැව් ඔප්පු කිරීමට අවසර දෙන්නට පෙර "බී" "සී" හා "ඩී" යන කරුණු සත්‍ය බැව් ඔප්පු කළ යුතු යයි කියා සිටින්නට අධිකරණයට හැකි ය.

**137.** (1) තමා කැඳවන පක්ෂය විසින් සාක්ෂිකරුවකුගෙන් ප්‍රශ්න විමසීම ඔහුගෙන් ප්‍රධාන සාක්ෂි විමසීම යනුවෙන් හැඳින්විය යුතු ය. ප්‍රධාන සාක්ෂි විමසීම.

(2) විරුද්ධ පක්ෂය විසින් සාක්ෂිකරුවකුගෙන් ප්‍රශ්න ඇසීම ඔහුගෙන් හරස් ප්‍රශ්න ඇසීම යනුවෙන් හැඳින්විය යුතු ය. හරස් ප්‍රශ්න ඇසීම.

(3) හරස් ප්‍රශ්න ඇසීමෙන් පසුව තමා කැඳවන පක්ෂය විසින් සාක්ෂිකරුවකුගෙන් ප්‍රශ්න ඇසීම ඔහුගෙන් නැවත සාක්ෂි විමසීම යනුවෙන් හැඳින්විය යුතු ය. නැවත සාක්ෂි විමසීම.

**138.** (1) සාක්ෂිකරුවන්ගෙන් පළමුකොට ප්‍රධාන සාක්ෂි විමසීම කළ යුතු ය. ඉක්බිති (විරුද්ධ පක්ෂය කැමති නම්) ඔවුන්ගෙන් හරස් ප්‍රශ්න ඇසිය යුතු ය. ඉනික්බිති ව (සාක්ෂිකරුවන් කැඳවන පක්ෂය කැමති නම්) ඔවුන්ගෙන් නැවත සාක්ෂි විමසීම කළ යුතු ය. සාක්ෂි විමසීම්වල පිළිවෙළ.

Scanned with CamScanner

සාක්ෂි විමසීම හා හරස් ප්‍රශ්න ඇසීම.

(2) සාක්ෂි විමසීම සහ හරස් ප්‍රශ්න ඇසීම අනුකූල කරුණුවලට සම්බන්ධ විය යුතු ය. එහෙත් හරස් ප්‍රශ්න ඇසීම ප්‍රධාන සාක්ෂි විමසීමේ දී සාක්ෂිකරු සහතික කොට පැවසූ කරුණුවලට සීමා වීම අවශ්‍ය නො වේ.

නැවත සාක්ෂි විමසීම.

(3) හරස් ප්‍රශ්න ඇසීමේ දී සඳහන් වූ කරුණු පැහැදිලි කර දීම සඳහා නැවත සාක්ෂි විමසීම යොමු විය යුතු ය. තවද, අධිකරණයේ අවසර ඇති ව අලුත් කරුණු නැවත සාක්ෂි විමසීමේදී ඇතුළත් කරණු ලැබුවහොත්, එකී කරුණු සම්බන්ධයෙන් වැඩිදුරටත් හරස් ප්‍රශ්න ඇසීමට විරුද්ධ පක්ෂයට හැකි ය.

වැඩිදුර නැවත සාක්ෂි විමසීම හා හරස් ප්‍රශ්න ඇසීම.

(4) වැඩිදුරටත් ප්‍රධාන සාක්ෂි විමසීම සඳහා හෝ වැඩිදුරටත් හරස් ප්‍රශ්න ඇසීම සඳහා සාක්ෂිකරුවකු නැවත කැඳවනු ලැබීමට සියලු අවස්ථාවන් හි දී අධිකරණය විසින් අවසර දිය හැකිය. තවද, එසේ වුවහොත් පිළිවෙළින් වැඩිදුර හරස් ප්‍රශ්න ඇසීමට ද නැවත සාක්ෂි විමසීමට ද පාර්ශ්වකරුවනට අයිතිවාසිකම් තිබේ.

ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස කැඳවනු ලැබූ තැනැත්තකු ගෙන් හරස් ප්‍රශ්න ඇසීම.

139. ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස කැඳවනු ලැබූ තැනැත්තෙක් එය ඉදිරිපත් කිරීමෙන් පමණක් සාක්ෂිකරුවෙක් නොවන්නේ ය. සාක්ෂිකරුවකු වශයෙන් ඔහු කැඳවන තෙක් හා කැඳවතොත් මිස ඔහුගෙන් හරස් ප්‍රශ්න ඇසිය නොහැකිය.

චරිතය පිළිබඳ සාක්ෂිකරුවෝ.

140. චරිතය පිළිබඳ සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීම හා ඔවුන්ගෙන් නැවත සාක්ෂි විමසීම කළ හැකි ය.

උත්තරය අඟවන ප්‍රශ්න.

141. ප්‍රශ්නය ඉදිරිපත් කරන තැනැත්තා ලබන්නට කැමති වන හෝ බලාපොරොත්තු වන පිළිතුර යෝජනා කෙරෙන යම් ප්‍රශ්න යක් උත්තරය අඟවන ප්‍රශ්නයක් යනුවෙන් හඳුන්වනු ලැබේ.

උත්තරය අඟවන ප්‍රශ්න නොඇසිය යුතු අවස්ථා.

142. ප්‍රධාන සාක්ෂි විමසීමක දී හෝ නැවත සාක්ෂි විමසීමක දී විරුද්ධ පක්ෂයේ විරුද්ධතාව ප්‍රකාශ වුවහොත්, උත්තරය අඟවන ප්‍රශ්න අධිකරණයේ අවසරය ඇති ව මිස නො ඇසිය යුතු ය.

හරස් ප්‍රශ්න ඇසීමේදි උත්තරය අඟවන ප්‍රශ්න ඇසිය හැකි අවස්ථා.

143. (1) හරස් ප්‍රශ්න ඇසීමේ දී පහත සඳහන් සුදුසුකම්වලට යටත් ව, උත්තරය අඟවන ප්‍රශ්න ඇසිය හැකිය :—

(අ) තමා විසින් යළිත් වරක් ආපසු ශබ්ද කළ යුතු වචන ම සාක්ෂිකරුගේ මුවින් පිට වන ලෙස ප්‍රශ්න නොඇසිය යුතු ය. තව ද,

(ආ) සත්‍ය බැව් ඔප්පු නොකරන ලද කරුණු සත්‍ය බැව් ඔප්පු කරනු ලැබී ඇතැ යි හෝ කාරණයට විරුද්ධ වන සේ විශේෂ පිළිතුරු සපයනු ලැබී ඇතැ යි යන්න ප්‍රශ්නය මගින් නිගමනය කරගෙන නොතිබිය යුතු ය.

අධිකරණය විසින් උත්තරය අඟවන ප්‍රශ්න නැවැත්විය හැකිය.

(2) හරස් ප්‍රශ්න අසන පක්ෂය කෙරෙහි දැඩි සැලකිල්ලක් හෝ පක්ෂපාත බවක් දක්වන සාක්ෂිකරුවකුගෙන් උත්තරය අඟවන ප්‍රශ්න ඇසීම අධිකරණය විසින් තම අභිමතය පරිදි නැවැත්විය හැකි ය.

ලිඛිත කරුණු පිළිබඳ සාක්ෂි

**144.** තම සාක්ෂියට සම්බන්ධ වූ යම්කිසි ගිවිසුමක්, ප්‍රදානයක් හෝ අන් අයුරින් දේපළ හිමි කිරීමක් ලේඛනයක ඇතුළත් නො වූයේ දැ යි සාක්ෂි විමසීමට භාජන ව සිටිද්දී යම් සාක්ෂිකරුවකු ගෙන් විමසිය හැකි ය. එසේ වී යයි ඔහු කියතහොත්, හෝ අධිකරණයේ මතය අනු ව ඉදිරිපත් කළ යුතු යම් ලේඛනයක අන්තර්ගත කරුණු පිළිබඳ යම් ප්‍රකාශයක් කිරීමට ඔහු සැලසුණ හොත්, එ බඳු ලේඛනයක් ඉදිරිපත් කරනු ලබන තෙක් හෝ ඒ පිළිබඳ ද්විතීයික සාක්ෂි දීමට සාක්ෂිකරු කැඳවූ පක්ෂයක හිමිකම් ලබා දෙන කරුණු සත්‍ය බැව් ඔප්පු කරනු ලබන තෙක්, එබඳු සාක්ෂි දීම ගැන විරුද්ධ පක්ෂය විසින් විරෝධය පළ කළ හැකි ය.

පැහැදිලිකිරීම.—ලේඛනවල ඇතුළත් කරුණු සම්බන්ධයෙන් අන්‍ය තැනැත්තන් විසින් කරන ලද ප්‍රකාශ එපමණින් ම අනුකූල කරුණු වුවහොත් ඒ ගැන සාක්ෂිකරුවකු විසින් කථිත සාක්ෂි දිය හැකි ය.

නිදර්ශනය

ප්‍රශ්නය නම්, "ඒ" විසින් "බී" ට පහර දෙන ලද්දේ ද යනු යි. සොරකම් කිරීම ගැන මට චෝදනා පමුණුවමින් "බී" ලියුමක් ලිව්වේ ය. මම ඔහුගෙන් පළි ගනිමි යි "බී" ට "ඒ" පවසනු තමාට ඇසුණු බව "සී" දිවුරුම පිට කියා සිටී. පහරදීම සම්බන්ධයෙන් "ඒ" ගේ චේතනාව දක්වන හෙයින් මේ ප්‍රකාශය අනුකූල වේ. ලියුම ගැන අන් කිසි සාක්ෂියක් දී නැති වුව ද, ප්‍රකාශය පිළිබඳ සාක්ෂි දිය හැකි ය.

කලින් කරන ලද ලිඛිත ප්‍රකාශ ගැන හරස් ප්‍රශ්න ඇසීම

**145.** (1) සාක්ෂිකරුවකු විසින් ඉහත දී ලියවිලිවලින් කරන ලද හෝ ලියවිලි තත්ත්වයට පමුණුවන ලද විවාදිත කරුණුලට අදාළ වන්නා වූ ප්‍රකාශයක් සම්බන්ධයෙන් එවැනි ලියවිලි ඔහුට නොපෙන්වා හෝ ඒවා සත්‍ය බැව් ඔප්පු නොකොට ඔහුගෙන් හරස් ප්‍රශ්න ඇසිය හැකි ය. එසේ වුව ද, ලියවිල්ලෙන් ඔහු කර තිබෙන ප්‍රකාශවලට පරස්පර විරෝධි යමක් ප්‍රකාශ කිරීමට අදහසක් තිබේ නම්, ලියවිල්ල සත්‍ය බැව් ඔප්පු කරනු ලැබිය හැකි වීමට පෙර පරස්පර විරෝධි වන අදහසින් ඉදිරිපත් කිරීමට තිබෙන ලිය විල්ලේ කොටස් කෙරෙහි ඔහුගේ සැලකිල්ල යොමු කරවිය යුතු ය.

කලින් කරන ලද ප්‍රකාශයක් සත්‍ය බැව් ඔප්පු කිරීම සම්බන්ධයෙන්.

(2) තමාගෙන් හරස් ප්‍රශ්න අසනු ලබන නඩුවේ හෝ අධිකරණ කෘත්‍යයේ විවාදිත කරුණුවලට අදාල වූ ද, තමා පවසන සාක්ෂියට නො ගැලපෙන්නා වූ ද, තමා විසින් කලින් කරන ලද්දා වූ ද කථිත ප්‍රකාශයක් සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න අසනු ලබන යම් සාක්ෂි කරුවෙක් එබඳු ප්‍රකාශයක තමා කළේ යයි පැහැදිලිව නො පිළිගනී නම්, ඔහු එය ඇත්ත වශයෙන් ම කළ බව සත්‍ය බැව් ඔප්පු කළ හැකිය. එහෙත් එ ලෙස සත්‍ය බැව් ඔප්පු කිරීමට පෙර, කළේ යයි කියනු ලබන ප්‍රකාශයේ විශේෂ අවස්ථාව සඳහන් කිරීමට සෑහෙන තත්ත්වය සාක්ෂිකරුට මතක් කර දී, එබඳු ප්‍රකාශයක් ඔහු කළේ ද නැද්ද යන වග ඔහුගෙන් විමසිය යුතු ය.

හරස් ප්‍රශ්න ඇසීමේ දී න්‍යායානුකූල වන ප්‍රශ්න

**146.** සාක්ෂිකරුවකුගෙන් හරස් ප්‍රශ්න අසනු ලබන විට, මෙහි ලා මීට කලින් සඳහන් කරන ලද ප්‍රශ්නවලට අතිරේක වශයෙන්—

(අ) ඔහුගේ නිවැරදි බව, සත්‍යවාදි බව හෝ විශ්වාස කළ හැකි බව පරීක්ෂා කිරීමට;

(ආ) ඔහු කවරෙක් ද සහ ඔහු ජීවිතයේ දරණ තත්ත්වය කුමක් ද යනු සොයා ගැනීමට; හෝ

Scanned with CamScanner

(ඈ) ඔහුගේ චරිතයට හානි පමුණුවා කීර්තිය අඩු කිරීමට; තුඩු දෙන යම් ප්‍රශ්න—

එබඳු ප්‍රශ්නවලට ලැබෙන පිළිතුරෙන් නියම හෝ අනියම් ලෙසින් ඔහු පිට චෝදනා පැවරීමට තුඩු දිය හැකි වුව ද, නැතහොත් දණ්ඩනයට හෝ අහිමිවීමකට ඔහු යටත් කරවිය හැකි වුව ද, නැතහොත් නියම හෝ අනියම් ලෙසින් එසේ වීමට තුඩු දිය හැකි වුව ද ඔහුගෙන් ඇසිය හැකි ය.

පිළිතුරු සපයන ලෙස සාක්ෂිකරුවකුට බලකළ යුතු අවස්ථාව.

147. එබඳු යම් ප්‍රශ්නයක් නඩුවට හෝ නීති කෘත්‍යයට අනුකූල වන කරුණකට සම්බන්ධ වේ නම්, 132 වෙනි වගන්තියේ විධි විධාන ඊට අදාළ විය යුතු ය.

ප්‍රශ්නය ඇසිය යුතු වූ අවස්ථාව හා පිළිතුරු සපයන ලෙස සාක්ෂිකරුට බලකළ යුතු වූ අවස්ථාව අධිකරණය විසින් තීරණය කිරීම.

148. (1) සාක්ෂිකරුගේ චරිතයට හානි පමුණුවා ඔහුගේ කීර්තිය අඩු කිරීම හැරුණු විට, එ බඳු යම් ප්‍රශ්නයක් නඩුවට හෝ නීති කෘත්‍යයට අදාළ නො වන කරුණකට සම්බන්ධ වේ නම්, ඊට පිළිතුරු සපයන ලෙස සාක්ෂිකරුට බල කළ යුතුද නැද්ද යනු අධිකරණය විසින් තීරණය කළ යුතු ය. තවද, සුදුසු යයි සිතතොත් ඊට පිළිතුරු සැපයීමට ඔහු බැඳී නැතැ යි අධිකරණය විසින් සාක්ෂිකරුට දන්වා සිටිය හැකිය.

(2) තම අභිමතය යෙදීමේදී පහත සඳහන් කරුණු ගැන අධිකරණය සැලකිලිමත් විය යුතු ය:—

(අ) එබඳු ප්‍රශ්නවලින් ප්‍රකාශ කරනු ලබන ආරෝපණයේ සත්‍යතාව හේතු කොට ගෙන, සාක්ෂිකරු සාක්ෂි දෙන කාරණයෙහි ලා ඔහු පවසන දේ විශ්වාස කළ හැකි ප්‍රමාණය පිළිබඳව අධිකරණයේ මතය කෙරෙහි බර පතල ලෙස බල පැවැත්විය හැකි නම්, එ බඳු ප්‍රශ්න සුදුසු වේ:

(ආ) එ බඳු ප්‍රශ්නවලින් ප්‍රකාශ කරනු ලබන ආරෝපණය කොපමණ කල් පසුගිය කරුණුවලට හෝ, කවර ස්වභාවයකින් යුක්ත වූ කරුණුවලට අදාළ වේ දැයි කියතොත් එකී ආරෝපණයේ සත්‍යතාව හේතු කොට ගෙන සාක්ෂිකරු සාක්ෂි දෙන කාරණයෙහි ලා ඔහු පවසන දේ විශ්වාස කළ හැකි ප්‍රමාණය පිළිබඳව අධිකරණයේ මතය කෙරෙහි බල පැවැත්වීමක් නැති වෙතොත් හෝ සුළු වශයෙන් බල පවත්වතොත් එබඳු ප්‍රශ්න නුසුදුසු වේ;

(ඇ) සාක්ෂිකරුගේ චරිතයට විරුද්ධ ව කරනු ලබන ආරෝපණයේ වැදගත්කම සහ ඔහුගේ සාක්ෂියේ වැදගත්කමත් අතර සැලකිය යුතු අසමතාවක් තිබේ නම්, එබඳු ප්‍රශ්න නුසුදුසු වේ:

(ඈ) පිළිතුරු සැපයීම සාක්ෂිකරු ප්‍රතික්ෂේප කිරීමෙන් පිළිතුරු ලැබෙතොත් එය අහිතකර වනු ඇත යන නිගමනය අධිකරණය විසින් සුදුසු ය යි පෙනේ නම් ඇති කර ගත හැකි ය.

Scanned with CamScanner

149. ප්‍රශ්නයෙන් ප්‍රකාශ කරනු ලබන ආරෝපණය කිසි පදනමක් සහිත ය යි කල්පනා කිරීමට යුක්ති සහගත හේතු, ප්‍රශ්නය අසන තැනැත්තාට ඇති නම් මිස එ සේ නොවන කල, 148 වෙනි වගන්තියේ සඳහන් අන්දමේ කිසිම ප්‍රශ්නයක් නො ඇසිය යුතුය.

යුක්ති සහගත හේතු නොමැතිව ප්‍රශ්නය නොඇසිය යුතු බව.

**නිදර්ශන**

(අ) වැදගත් සාක්ෂිකරුවෙක් හොරෙක් ය යනුවෙන් නීතිඥයකු විසින් අධිනීතිඥයකුට උපදෙස් දෙනු ලැබේ. තමා හොරෙක් ද යි සාක්ෂිකරුගෙන් ඇසීමට මෙය යුක්ති සහගත හේතුවකි.

(ආ) වැදගත් සාක්ෂිකරුවෙක් සූදුවෙන් ජීවිකාව කරන්නෙක් ය යනු අධිකරණයට පැමිණ සිටිනන්නකු විසින් නීතිඥයකුට දන්වනු ලැබේ. දැනුම් දුන් තැනැත්තා, නීතිඥයා විසින් ප්‍රශ්න කරන ලදුව, ස්වකීය ප්‍රකාශයට හැහෙන කරුණු ඉදිරිපත් කරයි. තමා සූදුවෙන් ජීවිකාව කරන්නේ ද යි සාක්ෂිකරුගෙන් ඇසීමට මෙය යුක්ති සහගත හේතුවකි.

(ඇ) කිසිම තොරතුරක් දන ගන්නට නැති සාක්ෂිකරුවෙකුගෙන් ඔහු හොරෙක් දැ යි නිකරුණේ ප්‍රශ්න කරනු ලැබේ. මේ ප්‍රශ්නය ඇසීමට මෙහි ලා කිසිම යුක්ති සහගත හේතුවක් නැත.

(ඇ) කිසිම තොරතුරක් දැන ගැන්මට නැති සාක්ෂිකරුවකු ඔහුගේ ජීවන ක්‍රමය සහ ජීවනෝපාය ගැන ප්‍රශ්න කරනු ලැබ සෑහීම පත් විය නො හැකි පිළිතුරු දෙයි. ඔහු සූදුවෙන් ජීවිකාව කරන්නෙක් ද යි ප්‍රශ්න කිරීමට මෙය යුක්ති සහගත හේතුවක් විය හැකි ය.

150. එ බඳු යම්කිසි ප්‍රශ්නයක් යුක්ති සහගත හේතු නොමැති ව අසනු ලැබී යයි අධිකරණයේ මතය වුවහොත්, ප්‍රශ්නය යම් අධිනීතිඥයකු හෝ නීතිඥයකු විසින් අසන ලද්දක් වූයේ නම් ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ ස්වකීය වෘත්තීය කටයුතුවල යෙදෙන විට, එබඳු අධිනීතිඥයා හෝ නීතිඥයා යටත් වන වෙනත් බල මණ්ඩලයකට අවස්ථාවේ තත්ත්වය අධිකරණය විසින් සැළ කළ හැකි ය.

යුක්ති සහගත හේතු නොමැතිව ප්‍රශ්නය අසනු ලැබූ විට, අධිකරණය අනුගමනය කළ යුතු කාර්‍ය පරිපාටිය.

151. අධිකරණයේ මතය අනුව අසභ්‍ය ය යි ද, නැතහොත් නින්ද සහගත ය යි ද, සලකනු ලබන ප්‍රශ්න හෝ විමසීම්, අධිකරණයේ විනිශ්චය සඳහා ඇති ප්‍රශ්න සහ ඒ ප්‍රශ්න විමසීම් අතර යම් සම්බන්ධයක් ඇති වුව ද, ඉදිරිපත් ප්‍රශ්නවලට හෝ ඉදිරිපත් ප්‍රශ්න පැවැතියේ ද නැද්ද යන වග නිශ්චය කිරීම සඳහා දැන ගත යුතු කරුණුවලට අදාළ වෙතොත් මිස, එ සේ නොමැති නම්, අධිකරණය විසින් තහනම් කළ හැකි ය.

අසභ්‍ය වූ ද, නින්ද සහගත වූ ද ප්‍රශ්න.

152. අපහාස කිරීම සඳහා හෝ අප්‍රසන්න භාවය ඇතිකිරීම සඳහා අදහස් කරන ලද්දක් යයි අධිකරණයට පෙනී යන්නා වූද ප්‍රශ්නයක් වශයෙන් සුදුසු වුවත්, වුවමනා නැති පීඩාකාර විලාසයකින් යුක්ත ය යි අධිකරණයට පෙනී යන්නා වූ ද යම් ප්‍රශ්නයක් අධිකරණය විසින් තහනම් කළ යුතු ය.

අපහාස කිරීමේ හෝ අප්‍රසන්න භාවය ඇති කිරීමේ අදහසින් අසනු ලබන ප්‍රශ්න.

153. ස්වකීය චරිතයට හානි පමුණුවා තම කීර්තිය අඩු කිරීමට ඉඩ සලස්වන අන්දමින් පමණක් පරීක්ෂණයට අදාළ වන්නා වූ යම් ප්‍රශ්නයක් සාක්ෂිකරුවකුගෙන් අසනු ලැබ, ඊට පිළිතුරු සපයනු ලැබූවිට, ඔහු පවසන කරුණු වැරදි බව දක්වීමට කිසි ම සාක්ෂියක් නො දිය යුතුය. එහෙත්, ඔහු අසත්‍ය ලෙස පිළිතුරු දෙයි නම්, බොරු සාක්ෂි දීම ගැන ඔහුට විරුද්ධව අනතුරු ව නඩු පැවරිය හැකි ය.

සත්‍යවාදීභාවය පරීක්ෂාකරන ප්‍රශ්නවලට ලැබෙන පිළිතුරු වලට පරස්පර විරෝධීවන සාක්ෂි බැහැර කිරීම.

Scanned with CamScanner

ව්‍යතිරේකය අංක 1.—තමා කලින් යම් අපරාධයක් කිරීම ගැන වරදකරු වූයේ දැ යි සාක්ෂිකරුවකුගෙන් ප්‍රශ්න කරනු ලැබ, ඔහු එසේ නො වී ය යි පවසතොත්, කලින් ඔහු වරදකරුවකු වූ බව ඔප්පු කිරීමට සාක්ෂි දිය හැකි ය.

ව්‍යතිරේකය අංක 2.—ස්වකීය අපක්ෂපාත භාවය හෙළා දැකීමට ඉඩ සලස්වන යම් ප්‍රශ්නයක් සාක්ෂිකරුවකුගෙන් අසනු ලැබ, යෝජිත කරුණු අසත්‍ය බැව් පවසමින් ඔහු පිළිතුරු සපයතොත්, ඔහු පවසන කරුණුවලට පරස්පර විරෝධී සාක්ෂි දිය හැකි ය.

### නිදර්ශන

(අ) උපදෙවාරක්ෂකයකුට විරුද්ධ ව ඉදිරිපත් කරනු ලබන අයිතිවාසිකමක් වංචාව හේතුවෙන් කෙරෙන්නකැ යි ඊට විරෝධය පළ කරනු ලැබේ. කලින් ගනු දෙනුවක දී තමා වංචනික අයිතිවාසි කමක් ඉදිරිපත් නො කළේ දැ යි අයිතිවාසිකම ඉදිරිපත් කරන්නාගෙන් අසනු ලැබේ. එසේ නො කළ බව ඔහු පවසයි. එ බඳු අයිතිවාසි කමක් ඔහු ඉදිරිපත් කළ බැව් පෙන්වීමට සාක්ෂි දෙනු ලැබේ. මේ සාක්ෂිය භාර ගත නො හැකිය.

(ආ) වංකකම හේතුකොට ගෙන තමා සිටි පදවියකින් අස් නො කරන ලද්දේ ද යනු සාක්ෂිකරුවකුගෙන් විමසනු ලැබේ. එසේ නො වී ය යි ඔහු පවසයි. ඔහු වංකකම හේතුකොට ගෙන අස් කරන ලද බව පෙන්වීමට සාක්ෂි දෙනු ලැබේ. මේ සාක්ෂිය බාර ගත නො හැකි ය.

(ඇ) එක්තරා දිනයෙක තමා යාපනයෙහි දී "බී" දුටු බව "ඒ" සහතික වශයෙන් කියා සිටී.

එ දින තමා ම කොළඹ නො සිටියේ දැ යි "ඒ" ගෙන් විමසනු ලැබේ. එය අසත්‍ය බව ඔහු පවසයි. එ දින "ඒ" කොළඹ සිටි බව දැක්වීමට සාක්ෂි ඉදිරිපත් කරනු ලැබේ.

මේ සාක්ෂිය බාර ගත හැක්කේ ස්වකීය කීර්තිය අඩු කරන කරුණක් ගැන "ඒ" දරන මතයට පරස්පර විරෝධී වන්නක් නිසා නො ව, කරුණ වැරදි බව දක්වන හෙයිනි.

මේ එක් එක් අවස්ථාවේ දී සාක්ෂිකරුගේ නිෂේධය අසත්‍ය වූයේ නම් බොරු සාක්ෂිදීම ගැන ඔහුට විරුද්ධව චෝදනා ඉදිරිපත් කළ හැකි ය.

(ඇ) "බී" දූෂණය කිරීමේ වරදට "ඒ" ට විරුද්ධව නඩු විභාග කරනු ලැබේ. "සී" හා "ඩී" සමග තමා නීති විරෝධී සංසර්ගයෙහි යෙදී නැතැ දැ යි හරස් ප්‍රශ්න ඇසීමේ දී "බී" ගෙන් අසනු ලැබේ. එ බඳු සංසර්ගයෙහි "සී" හා "ඩී" සමග ඈ යෙදී ඇති බව දැක්වීමට සාක්ෂි ඉදිරිපත් කරනු ලැබේ. මේ සාක්ෂි බාර ගත නො හැකි ය.

(ඉ) තමා විරුද්ධ ව සාක්ෂි ඉදිරිපත් කරන "බී" ගෙන් පළි ගන්නා බව් තමා නො කීවේ දැයි "ඒ" ගෙන් විමසනු ලැබේ. එ වැන්නක් තමා නොකීවේ ය යි ඔහු පවසයි. මේ ප්‍රශ්නයෙන් ඔහුගේ අපක්ෂපාත භාවය හෙළා දැකීමට ඉඩ සැලසෙන හෙයින් ඔහු කරන ප්‍රකාශය වැරදි බව දැක්වීමට සාක්ෂි දිය හැකි ය.

Scanned with CamScanner

**154.** හරස් ප්‍රශ්න ඇසීමේ දී විරුද්ධ පාර්ශ්වය විසින් අසනු ලැබිය හැකි යම් ප්‍රශ්න සාක්ෂිකරුවකු කැඳවන තැනැත්තා විසින් සාක්ෂිකරුගෙන් ඇසීමට ස්වකීය අභිමතය පරිදි, අධිකරණය විසින් අවසර දිය හැකි ය. පාර්ශවකරු විසින් තමන්ගේම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීම.

**155.** විරුද්ධ පාර්ශ්වය විසින් හෝ අධිකරණයේ කැමැත්ත ඇතිව, සාක්ෂිකරු කැඳවන පාර්ශ්වය විසින් සාක්ෂිකරුවකුගේ විශ්වාසදායකත්වයට පහත සඳහන් මාර්ගවලින් දොස් තැබිය හැකි ය :— සාක්ෂිකරුගේ විශ්වාසදායකත්වයට දොස් තැබීම.

(අ) සාක්ෂිකරු ගැන කරුණු දන්නා හෙයින් ඔහු කෙරෙහි විශ්වාසය තැබීමට තරම් ඔහු සුදුසු නො වන බවට සහතික කරන තැනැත්තන්ගේ සාක්ෂිවලින් ;

(ආ) සාක්ෂිකරුට අල්ලසක් දී ඇතැයි හෝ, දෙන ලද අල්ලසක් ඔහු භාර ගෙන ඇතැයි හෝ තම සාක්ෂිය දීමට අන් කිසි දූෂිත පෙලඹවීමක් ලබා ඇතැයි යන්න සත්‍ය බැව් ඔප්පු කිරීමෙන් ;

(ඇ) වැරදි බව දැක්විය හැකි ඔහුගේ සාක්ෂියේ යම් කොටසක් සමග නො ගැලපෙන්නා වූ කලින් කරන ලද ප්‍රකාශ ඔප්පු කිරීමෙන් ;

(ඈ) ස්ත්‍රී දූෂණය කිරීමක් ගැන හෝ දූෂණය කිරීමට තැත් කිරීමක් ගැන මිනිසකුට විරුද්ධව නඩු පවරනු ලැබූ විට, චෝදක තැනැත්තී සාමාන්‍යයෙන් අයහපත් චරිතයකින් යුක්ත ය යි පෙන් විය හැකි ය.

පැහැදිලි කිරීම.—තවත් සාක්ෂිකරුවකු කෙරෙහි විශ්වාසය තැබීමට තරම් ඔහු සුදුසු නො වේ ය යි ප්‍රකාශ කරන යම් සාක්ෂිකරුවකු විසින් තමාගේ ප්‍රධාන සාක්ෂි විමසීමේ දී තමා දරන මතයට හේතු නො දැක්විය හැකි නමුදු, හරස් ප්‍රශ්න ඇසීමේ දී එකී හේතු ඔහුගෙන් අසනු ලැබිය හැකි ය. ඊට ඔහු දෙන පිළිතුරු අසත්‍ය වුවහොත්, බොරු සාක්ෂි දීම ගැන පසු ව චෝදනා ලැබිය හැකි වුව ද, එකී පිළිතුරු වැරදි බව දැක්වීමට ඉඩ නැත.

නිදර්ශන

(අ) "බී" ට විකුණා භාර දෙන ලද බඩුවල මිල ගැන "බී" ට විරුද්ධ ව "ඒ" නඩු පවරයි.

තමා එකී බඩු "බී" ට භාර දුන් බව "සී" පවසයි. තමා "බී" ට බඩු භාර නුදුන් බව ඉහත අවස්ථාවක දී "සී" ප්‍රකාශ කළේ ය යි දැක්වීමට සාක්ෂි ඉදිරිපත් කරනු ලැබේ.

මේ සාක්ෂිය බාර ගත හැකිය.

(ආ) "බී" ගේ මරණය සිදු කිරීම ගැන "ඒ" අධිචෝදනා ලැබ සිටී. "බී" ගේ මරණයට හේතු වූ තුවාලය "ඒ" විසින් සිදු කරන ලද යි මරණාසන්න ව සිටිද්දී "බී" පැවසූ බව "සී" කියයි. එකී තුවාලය "ඒ" විසින් හෝ ඔහු ඉදිරිපිට දී සිදු නො කරන ලදැයි ඉහත අවස්ථාවක දී "සී" ප්‍රකාශ කළේ ය යි දැක්වීමට සාක්ෂි ඉදිරිපත් කරනු ලැබේ.

මේ සාක්ෂි බාර ගත හැකි ය.

Scanned with CamScanner

අනුකූල කරුණක් ගැන සාක්ෂි තහවුරු කිරීමට තුඩුදෙන ප්‍රශ්න බාර ගත හැකි බව.

156. යම් සාක්ෂිකරුවකුගේ ප්‍රකාශයක් තහවුරු කිරීමට අදහස් කර තිබේ නම්, යම් අනුකූල කරුණක් ගැන ඔහු සාක්ෂි දෙන කල, ඔහු සහතික කරන අනුකූල කරුණ පිළිබඳ ව ඔහු ඉදිරිපත් කරන සාක්ෂිය, එබඳු කරුණු සත්‍ය බැව් ඔප්පු වූ විටෙක තහවුරු විය හැකි ය යි අධිකරණය අදහස් කළහොත් එ බඳු අනුකූල කරුණක් සිදු වූ අවස්ථාවේ හෝ ස්ථානය අසල ඔහු නිරීක්ෂණ කළ යම් කිසි වෙනත් කරුණු සම්බන්ධයෙන් ඔහුගෙන් ප්‍රශ්න කළ හැකි ය.

**නිදර්ශන**

අපරාධ සහායකයකු වන "ඒ" නමැති හවුල් කොල්ල කෑමක් ගැන විස්තරයක් කරයි. කොල්ල කෑම සිදු කරන ලද ස්ථානය කරා තමා යද්දී සහ එහි සිට ආපසු එද්දී සිදු වූ ද, කොල්ල කෑමට සම්බන්ධ නො වූ ද නොයෙක් කරුණු ඔහු විස්තර කරයි.

කොල්ල කෑම ගැන ම ඔහු දුන් සාක්ෂිය තහවුරු කිරීම පිණිස මේ කරුණු සම්බන්ධයෙන් ස්වාධීන සාක්ෂි දිය හැකි ය.

එකම කරුණු ගැන පසුව දෙන ලද සාක්ෂිය තහවුරු කිරීම පිණිස සාක්ෂිකරු කලින් කළ ප්‍රකාශය ඔප්පු කළ හැකිය.

157. සාක්ෂිකරුවකුගේ ප්‍රකාශය තහවුරු කිරීම සඳහා එම කරුණ ව ම සම්බන්ධ වූ ද, කරුණ සිදු වූ වේලාවේ දී හෝ ඊට ආසන්න ව, හෝ එම කරුණ ගැන පරීක්ෂණයක් පැවැත්වීමට නීත්‍යානුකූල ව සුදුසු බලධරයකු ඉදිරිපිට දී එම සාක්ෂිකරු විසින් ම කලින් කරන ලද යම් ලිඛිත හෝ කථිත ප්‍රකාශයක් සත්‍ය බැව් ඔප්පු කළ හැකිය.

32 වැනි හෝ 33 වෙනි වගන්තිය යටතේ අනුකූල සත්‍ය බැව් ඔප්පු කරන ලද ප්‍රකාශය හා සම්බන්ධව සත්‍ය බැව් ඔප්පු කළ හැකි කරුණු.

158. 32 වෙනි වගන්තිය යටතේ හෝ 33 වෙනි වගන්තිය යටතේ අනුකූල වන යම් ප්‍රකාශයක් සත්‍ය බැව් ඔප්පු කරනු ලැබූ යම් විටෙක, එය වැරදි බව දැක්වීම පිණිස හෝ එය තහවුරු කිරීම පිණිස, හෝ එම ප්‍රකාශය කළ තැනැත්තාගේ විශ්වාසදායකත්වයට දොස් තැබීම පිණිස හෝ එය ස්ථිර කිරීම පිණිස, සාක්ෂිකරුවකු ලෙස එකී තැනැත්තා කැඳවනු ලැබ, හරස් ප්‍රශ්න ඇසීමේ දී යෝජිත කාරණයේ සත්‍යතාව නැතැ යි ඔහු විසින් කියන ලද නම් සත්‍ය බැව් ඔප්පු කරනු ලැබිය හැකි වූ සියලු කරුණු සත්‍ය බැව් ඔප්පු කළ හැකි ය

කරුණු සිහිපත් කිරීම.

159. (1) තමාගෙන් ප්‍රශ්න අසනු ලබන ගනුදෙනුව කරන ලද අවස්ථාවේ දී හෝ ගනුදෙනුව තමාට හොඳට ම මතක තිබීමට ඉඩ ඇතැ යි අධිකරණය කල්පනා කරන තරම් අඩු කාලයක් ගතවීමෙන් පසු තමා විසින් ම සකස් කරන ලද යම් ලියවිල්ලක් බැලීමෙන් හරස් ප්‍රශ්න ඇසීමට යටත් ව සිටිය දී සාක්ෂිකරුවකු විසින් කරුණු සිහිපත් කළ හැකි ය.

අනිකකු විසින් සකස් කරන ලද ලියවිල්ලකින්.

(2) අන් කිසි තැනැත්තකු විසින් සකස් කරන ලද්දා වූ ද, ඉහත සඳහන් කාලය ඇතුළත සාක්ෂිකරු විසින් කියවන ලද්දා වූ ද, එබඳු යම් ලේඛනයක් සාක්ෂිකරු කිය වූ විට, නිවැරදි ය යි ඔහු දැන සිටියේ වී නම්, සාක්ෂිකරු විසින් එ බන්දක් කියවා බැලිය හැකිය.

Scanned with CamScanner

(3) යම් ලේඛනයක් බැලීමෙන් කරුණු සිහිපත් කිරීමට සාක්ෂිකරුවකුට හැකි කවර අවස්ථාවක දී වුව ද, අධිකරණයේ අවසරය ඇති ව, එ බඳු ලේඛනයක පිටපතක් ඔහු විසින් බැලිය හැකි ය.

එසේ විය හැක්කේ මුල් පිටපත ඉදිරිපත් නො කිරීමට සෑහෙන කරුණු ඇතැ යි අධිකරණය සෑහීමට පත් වුවහොත් ය.

සාක්ෂිකරු විසින් කරුණු සිහිපත් කිරීම පිණිස ලේඛනයේ පිටපත පාවිච්චි කළ හැකි අවස්ථාව.

(4) විශේෂඥයකු විසින්, වෘත්තීය නිබන්ධ බැලීමෙන් කරුණු සිහිපත් කළ හැකි ය.

වෘත්තීය නිබන්ධ වලින්.

160. එකී කරුණු ම යළිත් ඔහුට සිහිපත් නො වෙතත්, ලේඛනයෙහි එම කරුණු නිවැරදි ව සටහන් කරන ලදැ යි ඔහු නිසැක ව ම දන්නේ නම්, 159 වෙනි වගන්තියේ සඳහන් පරිදි එබඳු යම් ලේඛනයෙක දැක්වෙන කරුණු පිළිබඳ ව ද සාක්ෂිකරුවකු විසින් සාක්ෂි දිය හැකි ය.

159 වෙනි වගන්තියේ සඳහන් ලේඛනයෙහි දක්වෙන කරුණු පිළිබඳ සාක්ෂිය.

නිදර්ශන

ගණන් පොත් නිවැරදිව තබන ලදැයි තමා දනී නම් සටහන් කරන ලද විශේෂ ගනුදෙනු කවරේදැයි ඔහුට අමතක වී නැතත්, පොත් තබන්නකු විසින් ව්‍යාපාරය කරගෙන යද්දී නිතිපතා තබන ලද ගණන් පොත්වල තමා සටහන් කර ගන්නා ලද කරුණු පිළිබඳ ව සාක්ෂි දිය හැකි ය.

161. ඉහතින් වූ වගන්ති දෙකේ විධිවිධාන යටතේ සඳහන් කරන ලද යම් ලියවිල්ලක් විරුද්ධ පක්ෂය විසින් ඉල්ලුවහොත් එය ඉදිරිපත් කර ඔහුට පෙන්විය යුතුය. තමා කැමති නම්, සාක්ෂිකරුගෙන් ඒ අනු ව එබඳු පාර්ශ්වකරු විසින් හරස් ප්‍රශ්න ඇසිය හැකි ය.

කරුණු සිහිපත් කිරීම සඳහා යොදන ලද ලේඛනය පිළිබඳව විරුද්ධ පක්ෂය සතු අයිතිවාසිකම්

162. (1) ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස කැඳවනු ලැබූ සාක්ෂිකරුවකු විසින් එම ලේඛනය තම ස්වාමිත්වයේ හෝ තම පාලනය යටතේ තිබේ නම්, එය ඉදිරිපත් කිරීම ගැන හෝ එය බාර ගත හැකි බව ගැන යම් විරුද්ධත්වයක් ඇති විය හැකි වුව ද එය අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය. ඒ බඳු යම් විරුද්ධත්වයක් නීත්‍යානුකූල භාවය අධිකරණය විසින් නිශ්චය කළ යුතු ය.

ලේඛන ඉදිරිපත් කිරීම.

(2) රාජ්‍යය සම්බන්ධ කරුණුවලට ලේඛනය අදාළ නොවේ නම්. එය පරීක්‍ෂා කිරීම සුදුසු ය යි අධිකරණයට පෙනී ගියහොත්, අධිකරණය විසින් එය පරීක්ෂා කළ හැකි ය. නැතහොත් එය බාරගත හැකි බව නිශ්චය කිරීමට පහසුවන පරිදි වෙනත් සාක්ෂි ලබා ගත හැකි ය.

ලේඛනය බාරගත හැකි බව නිශ්චය කිරීමට පහසුවන පරිදි අධිකරණය විසින් සාක්ෂි ලබාගත හැකිය.

(3) එ බඳු කාර්යයක් සඳහා යම් ලේඛනයක් පරිවර්තනය කරවා ගැනීම අවශ්‍ය වුවහොත්, සාක්ෂි වශයෙන් ලේඛනය ඉදිරිපත් නො කළ යුතු නම්, අධිකරණය විසින් සුදුසු ය යි සිතතොත් එහි අන්තර්ගත කරුණු රහසිගත ව තබා ගන්නා ලෙස පරිවර්තකයාට නියම කළ හැකි ය. පරිවර්තකයා එම නියමය කඩ කළ හොත්, දණ්ඩ නීති සංග්‍රහයේ 162 වෙනි වගන්තිය යටතේ ඔහු වරදක් කර ඇතැයි සැලකිය යුතු ය.

ලේඛන පරිවර්තනය.

Scanned with CamScanner

දන්වීමකින් ඉල්ලා යවනු ලැබ ඉදිරිපත් කොට ඇති ලේඛනය සාක්ෂි වශයෙන් ලබාදීම.

163. යම් පාර්ශ්වකරුවකු විසින් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස වෙනත් පාර්ශ්වකරුවකු වෙත දැන්වීමක් යවා, එය ඉල්ලා සිටින විට, එය ඉදිරිපත් කරනු ලැබ, එ සේ කරන ලෙස ඉල්ලා සිටින පාර්ශ්වය විසින් එය පරීක්ෂා කොට තිබේ නම්, එය ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් එය සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලෙස කරන පාර්ශ්වය විසින් එය සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලෙස තමාට නියම කළහොත් සහ එය අනුකූල වුවහොත්, එය සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට ඔහු බැඳී සිටී.

ලේඛනය ඉදිරිපත් කිරීමට දන්වීමක් ලැබ, එය ප්‍රතික්ෂේප කළ විට, එය සාක්ෂි වශයෙන් යොද ගැනීම.

164. ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස තමා වෙත දැන්වීමක් ලැබ එය ඉදිරිපත් කිරීම පාර්ශ්වකරුවකු ප්‍රතික්ෂේප කළ විට, අනෙක් පාර්ශ්වකරුගේ කැමැත්ත නැති ව හෝ අධිකරණයේ ආඥාවක් නැති ව පසු ව එම ලේඛනය සාක්ෂි වශයෙන් පාවිච්චි කළ නො හැකි ය.

නිදර්ශන

එකඟවීම් පත්‍රයක් පිළිබඳ ව "බී" ට විරුද්ධව නඩු පවරන "ඒ" එය ඉදිරිපත් කරන ලෙස "බී" වෙත දැනුම් දෙයි. නඩු විසඳීමේ දී "ඒ" ලේඛනය ඉල්ලා සිටී. "බී" එය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරයි. "ඒ" ලේඛනයෙහි අන්තර්ගත කරුණු ගැන ද්විතීයික සාක්ෂි දෙයි. "ඒ" විසින් දෙන ලද ද්විතියික සාක්ෂි වැරදි බව දැක්වීම පිණිස හෝ එකඟවීම් පත්‍රයෙහි මුද්දර අලවා නැතැයි පෙන්වීම පිණිස ලේඛනය ම ඉදිරිපත් කිරීමට "බී" වෙහෙස දරයි. ඔහුට එසේ කළ නො හැකි ය.

ප්‍රශ්න ඇසීමට හෝ (යමක්) ඉදිරිපත් කරන ලෙස ආඥාවක් කිරීමට විනිශ්චය කරුවකු සතු බලය.

165. අනුකූල කරුණු පිළිබඳ නිසි සාධක සොයා ගැනීම සඳහා හෝ ලබා ගැනීම සඳහා, කවර ආකාරයකින් හෝ කවර වේලාවක දී හෝ, යම් සාක්ෂිකරුවකුගෙන් හෝ, පාර්ශ්වකාරයින්ගෙන්, අනුකූල වන්නා වූ හෝ නො වන්නා වූ යම් කරුණක් සම්බන්ධයෙන් තමා කැමැති ඕනෑ ම ප්‍රශ්නයක් විනිශ්චයකරු විසින් ඇසිය හැකි ය.

එ මෙන් ම යම් ලේඛනයක් හෝ යම් දෙයක් ඉදිරිපත් කරන ලෙස ආඥාවක් කළ හැකි ය. එ බඳු කිසි ප්‍රශ්නයකට හෝ ආඥාවකට කිසි විරුද්ධතාවයක් දැක්වීමට හෝ අධිකරණයේ අවසරය නැති ව එ බඳු කිසි ප්‍රශ්නයකට දෙන ලද පිළිතුරක් ගැන යම් සාක්ෂිකරුවකුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට පාර්ශ්වකරුවනට හෝ ඔවුන්ගේ නියෝජිතයනට හිමිකමක් නො තිබිය යුතු ය.

එ සේ විය හැක්කේ නඩු තීන්දුව මේ ආඥාපනත මගින් අනුකූල වූ ද නිසි පරිදි සත්‍ය බැව් ඔප්පු කරන ලද්දා වූ ද කරුණු යයි ප්‍රකාශිත කරුණු මත පදනම් වී ඇති විට ය.

එ සේ ද වුවත්, විරුද්ධ පාර්ශ්වය විසින් ප්‍රශ්නය අසනු ලැබුව හොත් හෝ ලේඛනය ඉල්ලනු ලැබුවහොත්, 121 වෙනි වගන්තියේ සිට 131 වෙනි වගන්තිය දක්වා දෙක ම ඇතුළත් වූ වගන්ති යටතේ ඊට පිළිතුරු දීම හෝ එය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට එ බඳු සාක්ෂිකරුවකුට හිමිකම් ලබා දෙන යම් ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමට හෝ යම් ලේඛනයක ඉදිරිපත් කිරීමට කිසි ම සාක්ෂි කරුවකුට බල කිරීමට කිසි විනිශ්චයකරුවකුට මේ වගන්තියෙන් බලය නො ලැබිය යුතු ය. නවද 148 වෙනි වගන්තිය යටතේ හෝ 149

Scanned with CamScanner

වෙනි වගන්තිය යටතේ අත්කිසි තැනැත්තකු විසින් ඇසීම නුසුදුසු විය හැකි යම් ප්‍රශ්නයක් විනිශ්චයකරු විසින් නො ඇසිය යුතු ය. එ මෙන් ම මෙහි මීට පෙර බැහැර කරන ලද අවස්ථා හැරුණු විට, යම් ලේඛනයක පිළිබඳ මූලික සාක්ෂි ද ඔහු විසින් නො ගෙන අත් හැරීම නො කළ යුතු ය.

166. ජූරි සභාව විසින් හෝ විනිශ්චය සහායකයන් සහිත ව විසඳනු ලබන නඩුවලදී, විනිශ්චයකරු විසින් ම ඇසිය හැකි වූ ද සුදුසු යයි ඔහු සලකන්නාවූද යම් ප්‍රශ්න විනිශ්චයකරු මඟින් හෝ ඔහුගේ අවසරය ඇති ව ජූරි සභාව හෝ විනිශ්චය සහායකයන් විසින් සාක්ෂිකරුවන්ගෙන් ඇසිය හැකි ය.

ප්‍රශ්න ඇසීමට ජූරි සභාව හෝ විනිශ්චය සහායකයන් සතු බලය.

## XIII වැනි පරිච්ඡේදය

### අනිසි ලෙස සාක්ෂි බාර ගැනීම හා ප්‍රතික්ෂේප කිරීම

167. විරුද්ධත්වය දක්වන ලද නමුදු බාර ගන්නා ලද සාක්ෂිවලින් වෙන් ව තීන්දුව යුක්ති සහගත බැව් දැක්වීමට සෑහෙන සාක්ෂි තිබුණේ යයි හෝ, ප්‍රතික්ෂේප කරන ලද සාක්ෂි බාර ගන්නා ලද නම්, ඒ මඟින් තීන්දුව වෙනස් නො කළ යුතු වී ය යි විරුද්ධත්වයක් ඉදිරිපත් කෙරෙන අධිකරණයට පෙනී ගියහොත්, යම් නඩුවක අනිසි ලෙස සාක්ෂි බාර ගැනීම හෝ සාක්ෂි ප්‍රතික්ෂේප කිරීම ම එම නඩුව අළුතෙන් විසඳීමට හෝ එහි තීන්දු අවලංගු වීමට හේතුවක් නො විය යුතු ය.

සාක්ෂි ප්‍රතික්ෂේප කිරීම නිසා හෝ අනිසි අන්දමින් සාක්ෂි බාරගැනීම නිසා අලුතෙන් නඩු විභාගයක් ඇති නොවිය යුතු බව.

[1895 අංක 14, 1904 අංක 15, 1925 අංක 16, 1927 අංක 25, 1928 අංක 18 හා 1946 අංක 1. දරණ ආඥාපනතේ මේ ආඥාපනතෙහි අන්තර්ගතය.]

Scanned with CamScanner

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි

Scanned with CamScanner